# ජනතාවගේ ප්‍රතිපත්තිය

# People's Manifesto

ජන අරගල සන්ධානය

மக்கள் போராட்ட முன்னணி

People's Struggle Alliance

# ජනතාවගේ ප්‍රතිපත්තිය

## ජන අරගල සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශය

ජන අරගල සන්ධානය

**'ජනතාවගේ ප්‍රතිපත්තිය'**
**ජන අරගල සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශය**

**© ජන අරගල සන්ධානය**

ISBN 978-624-6607-00-5

**පළමු මුද්‍රණය** - 2024 ජූලි
**දෙවන මුද්‍රණය** - 2024 අගෝස්තු

**ප්‍රකාශනය:** ජන අරගල සන්ධානය,
22/1, මෙල්ඩර් පෙදෙස,
නුගේගොඩ

**මුද්‍රණය:** ස්ටාර් ඇඩ්වර්ටයිසින්
294/1, මාකුඹුර,
කොට්ටාව.

# පෙරවදන

මේ මොහොත ලංකාවේ ආර්ථික අර්බුදයේ සියලු වාසි ලාභ කඳු ගණන් ගොඩගැසෙන ලෙස ධන කුවේර සමාගම් සතු වී, අර්බුදයේ බර වැඩකරන ජනතාව මත පැටවෙන මොහොතකි. අර්බුදයට විසඳුම් යැයි කියමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතන ඉදිරිපත් කළ වට්ටෝරුව විසින් ජනතාව තවදුරටත් විනාශය කරා ඇදගෙන යමින් තිබේ.

බදු බර වැඩි කිරීම, සමාජ සුබසාධන කප්පාදු කිරීම සහ ආර්ථිකය හැකිලවීමේ සාපරාධී ක්‍රියාමාර්ගය විසින් දෛනික ආදායම් අහිමි වීම යන හේතු මත ජනතාව නරකාදිය වෙතට තල්ලු කරමින් තිබේ. නිදසුනක් ලෙස ලංකාවේ පවුල්වලින් 60%ක්ම ආර්ථික ප්‍රශ්න නිසා සිය ආහාර රටා වෙනස් කරගෙන ඇති බව, ආහාර වේල් සංඛ්‍යාව අඩු කිරීම හෝ ආහාරවල ගුණාත්මක මට්ටම පහත

දැමීම සිදුකර ඇති බව ලෝක ආහාර සංවිධානය පවසයි. එක්සත් ජාතීන්ගේ සංවිධාන වාර්තාවලට අනුව ලංකාවේ සෑම පවුල් 10කින් 6ක් ආර්ථික වශයෙන් ආගාධයට ඇද වැටීමේ අවදානමට හසුව තිබේ. දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින ජනගහනය 26.1% දක්වා ඉහළ යද්දී ළමා මන්දපෝෂණය දෙගුණ වී ඇත. ලංකාවේ පවුල් ඒකක ලක්ෂ 57කින් පවුල් ඒකක ලක්ෂ 37ක්ම සහනාධාර ඉල්ලන මට්ටමට ඇද වැටී තිබේ. 2019 වසරේ දී උකස් අත්තිකාරම් ලබා ගැනීම සඳහා උකස් කරන ලද රන් භාණ්ඩ වල වටිනාකම වන රුපියල් කෝටි 21,000 ක ප්‍රමාණය 2023 වසර වනවිට රුපියල් කෝටි 57,100 දක්වා වැඩි වී ඇතැයි ද එය ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක් බව ද 2024 ජුලි අවසන් සතියේ කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡා විය. නිර්මාණය වෙමින් පවතින නරකාදියේ බියකරු බව පිළිබඳ මෙම සීමිත සංඛ්‍යාලේඛන පවා ප්‍රමාණවත් සාක්ෂි සපයයි.

නමුත් එක කොණක සමාජයේ අති බහුතරය ලෝදිය හැළියේ ගිල්වන සහ කටු ඉඹුලේ නංවන නරකාදිය නිර්මාණය වෙද්දී අනෙක් කොණේ සුළුතරයක් සඳහා පාරාදීසයක් නිර්මාණය වී තිබේ. ඒකාධිකාර සමාගම් වල ලාභය විශ්මයජනක ලෙස ඉහළ යමින් තිබේ. 2019/2020 මූල්‍ය වර්ෂයේ

කොටස් වෙළඳපොළ ලියාපදිංචි සමාගම්වලින් ඉහළම සමාගම් 100හි ලාභය රුපියල් බිලියන 222කි. 2021/2022 ආර්ථික අර්බුද සහ කොවිඩ් වසංගතය මැද එම ලාභය රුපියල් බිලියන 712කි. 2022/2023 මූල්‍ය වර්ෂය තුළ, එනම් ආර්ථික අර්බුදය මධ්‍යයේ ලැබූ ලාභය රුපියල් බිලියන 544කි. එනම් ඉහළම ධනපති සමාගම් වසංගතය වසන්තයක් කරගෙන, ආර්ථික අර්බුදය ආශීර්වාදයක් කරගෙන ඇත. එම සමාගම් සියයේ වත්කම් වැඩිවී ඇත්තේ ද එලෙසමය. ගෙවුණු වසර 4 තුළ මෙම සමාගම්වල වත්කම් 33%කින් ඉහළ ගොස් ඇත්තේ ඉතිහාසයේ වැඩිම අගය වාර්තා කරමිනි.

සාම්ප්‍රදායිකව විශ්වාස කෙරෙන්නේ සමාග ම්වල ලාභය ඉහළ යනවිට බදු හරහා රාජ්‍ය ආදායමද ඉහළ යන බවයි. නමුත් මෙම ධනපති කල්ලිය බදු ගෙවා නැත. පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි කාරක සභාවේ වාර්තාවට අනුව 2023 වසර අවසන් වනවිට නොගෙවා පැහැර හැර ඇති බදු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 1,026කි. එනම් රුපියල් කෝටි ලක්ෂයකි. ඊට අමතරව රජය විසින් බහුජාතික සමාගම්ද ඇතුළු දේශීය සමාගම්වලට විශාල බදු සහන දෙනු ලබයි. 2023 වසරේ එලෙස ලබාදුන් බදු සහනවල වටිනාකම රුපියල් බිලියන 948කි. මෙලෙස අධික ලෙස ලාභ

ලැබීම සඳහා මෙම සමාගම් රාජ්‍ය බැංකුවලින් ණය ලබාගෙන එම ණය නොගෙවා වංචා කර තිබේ. නමුත් ණය ගෙවීමට අපහසුවනසුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහ දේශපාලන අනුග්‍රහය ලත් ජාවාරම්කාර වළල්ලට නීතිය බෙදන හැන්දේ විශාල වෙනසක් ඇත. නිදසුනක් ලෙස ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වලට ගෙවීමට අපහසුව ඇති ණය ප්‍රමාණය බිලියන 150ක් බවත් මහා පරිමාණ සමාගම්වල නොගෙවා පැහැර හැර ඇති ණය ප්‍රමාණය රුපියල් බිලියන 1850ක් බවත් මුදල් අමාත්‍යංශ වාර්තා පවසයි. 'පරාටේ' නීතිය යටතේ දේපළ වෙන්දේසි කර, සිය ව්‍යාපාර විනාශ වී යාමේ අවදානමට මුහුණ දෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මිස ලංකාවේ ලොකුම ධනපතියන් නොවේ. ඔවුන්ගේ ණය බොල් ණය ගිණුමට ඇතුළු කර ඇත. සමාගම්වල ලාභය වැඩි වී, බදු පවා නොගෙවන විට එම මුදල් ආයෝජනය කර ආර්ථිකය පුළුල් වන බව තවත් අදහසකි. නමුත් ලංකාවේ එය ද සිදු නොවේ.

2023 ඔක්තෝබරයේ දී පාර්ලිමේන්තුවේ හෙළිදරව් වූ ආකාරය මහා ධනකුවේරයන් විසින් නීති විරෝධී ලෙස රටෙන් පිට කර ඇති මුදල් ප්‍රමාණය ලංකාවේ සමස්ත විදේශ ණය ප්‍රමාණය සමග සැසඳෙන ඩොලර් බිලියන 56ක පමණ මුදලකි.

මෙම සංඛ්‍යාලේඛන විසින් පෙන්වනු ලබන සත්‍යය කුමක්ද? ආර්ථිකයේ අර්බුදයට වැඩකරන ජනතාව වගකිවයුතු නැති බවයි. එමෙන්ම අර්බුදයේ සමස්ත පීඩාව පැටවී ඇත්තේ ජනතාවගේ උරමත බවයි. ධනපති පන්තියට අර්බුදය විශාල ලාභ උල්පතක් බවට පත්ව තිබේ. ලංකාවේ තත්වය සමස්ත ලෝක තත්වයේම පරාවර්තනයකි. Bloomberg ආයතනයේ ගණන් බැලීම් අනුව, 2020 වසරේ දී Tesla සමාග මේ 'එලන් මස්ක්' ඩොලර් බිලියන 140ක ධනයක් උපයා තිබේ. Amazon සමාගමේ 'ජෙෆ් බෙසොස්' ඩොලර් බිලියන 72ක් උපයා තිබේ. Nonfu Spring සමාගමේ 'ෂොන් ෂන්ශාන්' බිලියන 62ක් උපයා තිබේ.

පසුගිය වසර තුළ දී ලොව ඉහළම බිලියනපතියන් දස දෙනාගේ ආදායම සමස්තයක් ලෙස ඩොලර් බිලියන 319කින් වර්ධනය වී තිබේ. ඒ මුදල ලෝකයේ ජනගහණයෙන් අති බහුතරයකට එන්නත් ලබා දීම සඳහා ප්‍රමාණවත් වේ. වසංගතය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ 2020 වර්ෂය තුළ බිලියනපති ධනපතියන්ගේ ඩොලර් ට්‍රිලියන 8ක් වූ ධනයට අලුතින් ඩොලර් ට්‍රිලියන 5.1ක් එකතු විය. වසංගතයේ බරපතළම බලපෑමට හසුව දිනපතා දහස් ගණනින් ජනතාව රෝගී වන හා මියයන අසල්වැසි ඉන්දියාවේ ඉහළම ධනපතියන් තිදෙනාගේ ධනය

එම වසර තුළ ඩොලර් බිලියන 100කින් ඉහළ ගියේය. ලෝකය පුරා සෑම රටකම පාහේ ආදායම් බෙදී යාමේ විෂමතාව වැඩි වෙමින් තිබේ. නිදසුනක් ලෙස අමෙරිකා එක්සත් ජනපදයේ ජනගහණයෙන් පොහොසත්ම 1% සමස්ත වත්කම්වලින් අත්පත් කරගන්නා කොටස 1990 දී 43% සිට 2020 දී 53% දක්වා ඉහළ යද්දී දිළිඳුම 50% අත්පත් කරගන්නා කොටස 1990 දී 19% සිට 2020 දී 13% දක්වා අඩු විය. 2023 වසර මුල නිකුත් වූ 'ඔක්ස්ෆෑම්' වාර්තාව අනුව 2020 හා 2021 අතර කාලය තුළ නිර්මාණ කෙරුණු ධනයෙන් 63%ක්ම, එනම් ඩොලර් ට්‍රිලියන 26කට වැඩි ප්‍රමාණ ක් උරාබොන ලද්දේ ධනවත්ම 1% විසිනි. ඊට පහළින් සිටින තවත් 9%ක් ධනයෙන් 27%ක් අත්පත් කර ගත් අතර පහළින් සිටින 90% ටම, එනම් බිලියන 7.2ක ජනයාට ලැබුණේ එම කාලය තුළ නිර්මාණ කෙරුනු ධනයෙන් 10%ක් පමණි.

ප්‍රශ්නය වන්නේ මෙකී අර්බුදයට විසඳුම් ලෙස හුවා දක්වා ඇත්තේ ද ජනතාව මත තව තවත් බර පටවන වැඩසටහනක් වීමය. එමෙන්ම අධ්‍යාපනය, සෞඛ්‍ය සේවය ආදී සමාජ ආරක්ෂණ සේවාවන් සඳහා වන රාජ්‍ය වගකීම අඩුකර එය වෙළඳපොළකරණය කිරීම හරහා ජනතාව කබලෙන් ලිපට ඇද දමන වැඩසටහනක් වීමය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉදිරිපත් කර ඇති වැඩසටහන එබඳු ජනතා විරෝධී වැඩසටහනකි. 2023 දෙසැම්බරයේ එළිදක්වන ලද UNDP හෙවත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ වාර්තාවකට අනුව ලංකාව ආර්ථික විෂමතාව අතින් ආසියා - පැසිෆික් කලාපයේ ඉහළම රටවල් පහ අතර සිටී. තායිලන්තය, චීනය, මියන්මාරය, ඉන්දියාව යන ධනය බෙදී යාමේ අසමානතාව වැඩිම රටවල් අතර ලංකාව ද සිටී. පන්ති යුද්ධයක් ලෙස නම් කළ හැකි මහා ප්‍රහාරයක් ජනතාව වෙත එල්ල කර ඇත්තේ මෙබඳු පසුබිමක් තුළය.

රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය, ජනතාව මත බදු බර පැටවීම, පිරිවැය පරාවර්තිත මිල ක්‍රමය නම් ලේබලය යටතේ රාජ්‍ය සුබසාධන කපා හැරීම, ඉඩම් බහුජාතික සමාගම් සතුවන සේ කෙරෙන ඉඩම් නීති සංශෝධන, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයාට ලැබෙන රාජ්‍ය ආරක්ෂණය ඉවත් කෙරෙන නිදහස් වෙළඳ ගිවිසුම් සහ ද්විපාර්ශවීය ගිවිසුම් ප්‍රවර්ධනය, සමාජ ආරක්ෂණ සේවා වෙළඳපොළට විවෘත කිරීම ආදී විනාශකාරී මිසයිල ප්‍රහාර ජනතාවගේ හිස් මතට පතිත කරමින් තිබේ. දේශපාලන වශයෙන් ගත් කල ආණ්ඩුව සහ විපක්ෂය යන බෙදීමකින් තොරව අද වනවිට සියලු දෙනා මෙම යුද්ධයේ එක පසෙක අවි අමෝරා

සිටී. මූල්‍ය අරමුදල විසින් පටවන ලද වැඩපිළිවෙළ සම්බන්ධයෙන් මෙන්ම ඉන්දියානු මහා ප්‍රාග්ධනය ලංකාව යටපත් කර ගැනීම සම්බන්ධයෙන් ද ආණ්ඩුව සහ විපක්ෂය අතර බරපතළ ප්‍රතිපත්තිමය වෙනස්කම් නැත. ජනතාව අරගල බිමට පැමිණීම සහ ජනතාවගේ පොදු දේශපාලන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ද මෙකී සියලු පාර්ශ්ව බියෙන් තැතිගෙන සිටී. ආණ්ඩුව මෙන්ම විපක්ෂය ද යෝජනා කරන්නේ ජනතාවට සිය දේශපාලන ක්‍රියාකාරීත්වය අක්‍රිය කරන ලෙසය. දේශපාලනය මැතිවරණයේ දී කතිරය ගැසීමකට ලඝු කරගන්නා ලෙසය. මෙම සමස්ත ස්ථාපිතයම හැසිරෙන්නේ මීට වසර දෙකකට පෙර ලංකාවේ විශාල ජන අරගලයක් නොතිබුණු ආකාරයටය.

ඒ නිසා ආර්ථික- දේශපාලන- මතවාදී - සමාජ - සංස්කෘතික ආදී සියලු පෙරමුණු තුළ යුද්ධයක් ආරම්භ වී තිබේ. ආණ්ඩුවේ පක්ෂ, විපක්ෂයේ පක්ෂ, මූල්‍ය අරමුදල ඇතුළු අධිරාජ්‍යවාදී මූල්‍ය සංවිධාන, විදෙස් තානාපති කාර්යාල සහ ඔත්තු සේවා ඇතුළු හූ දේශපාලන බලවේග, ගෝලීය ප්‍රාග්ධන ඒකාධිකාර, ලංකාවේ ධන කුවේරයන්, දූෂිත රාජ්‍ය නිලධාරී වළල්ල ආදී සියල්ලන් මෙහිදී එක පෙරමුණක අවි අමෝරා සිටී. අනෙක් පෙරමුණේ සිටින්නේ සකලවිධ ආකාරයෙන් නිරායුධ කොට

පාවාදෙනු ලැබූ ජනතාවයි. සමාජයේ පහළ තීරුවයි. දැන් ජනතාවගේ ආරක්ෂාව සඳහා ජනතාවගේ පෙරමුණ ශක්තිමත් කළ යුතුය. ජනතාවගේ පැත්ත ගත් ආර්ථික - දේශපාලන ප්‍රතිපත්තියක් සහ ජනතාව දේශපාලන වශයෙන් සක්‍රිය කරන පුළුල් මහජන ව්‍යාපාරයක් අවශ්‍ය වේ. ජන අරගල සන්ධානය ගොඩ නැගෙන්නේ එම කර්තව්‍යයන් දෙක වෙනුවෙනි. ජන අරගල සන්ධානය ජනතාව වෙනුවෙන් ජනතාව තුළින් බිහි වී ජනතාව සමග වැඩකරන ව්‍යාපාරයකි. එහි මූලික පදනම වන්නේ ප්‍රතිපත්තිමය පදනමකි. එම ප්‍රතිපත්තිමය පදනම ජනතාවගේ දේශපාලන අභිලාෂයන් නියෝජනය කරයි. ජනතාවගේ ප්‍රතිපත්තිය නමින් අද ඔබ අතට පත්වන්නේ එම ප්‍රතිපත්තිමය පදනමයි.

මෙම ප්‍රතිපත්ති ලේඛනයේ කොටස් දෙකකි. එකක් අපගේ මූලික ප්‍රතිපත්තිමය පදනම වන සමාජවාදී මූලධාර්මික පදනමයි. දෙවැන්න හදිසි කර්තව්‍යයන් සහ කෙටිකාලීන වැඩපිළිවෙළක් ලෙස සංයුක්ත කරනු ලැබූ මේ මොහොතේ අභියෝගයට මුහුණ දීමේ වැඩපිළිවෙළයි. එය කිසිසේත් වියුක්ත ලේඛන දෙකක් නොවේ. අපගේ කෙටිකාලීන ඉලක්ක දිගුකාලීන ඉලක්ක වෙත යාමේ සංක්‍රමණීය පියවර නියෝජනය කරයි.

කෙසේවෙතත්, එහි ආරම්භය කවුරුන් විසින් ගත්තත් දැන් එය ජනතාව සතුය. ජනතාවගේ ප්‍රතිපත්තිය ලෙස මෙය එවැන්නක් නිර්මාණය කිරීම සඳහා ගනු ලබන ආරම්භයක් පමණි. සියලු දිශාවලින් එය වර්ධනය කිරීමේ සහ පුළුල් කිරීමේ වගකීම සමාජය මතම තබා අපි ආරම්භක පියවර පමණක් ගත්තෙමු. මෙම වැඩපිළිවෙළ යථාර්ථයක් කිරීම සඳහා එක්වන ලෙස අපි ඔබට ආරාධනා කරමු.

**ප්‍රතිපත්ති සම්පාදන කමිටුව**
**ජන අරගල සන්ධානය**
**2024 ජූලි 31**

# පෙළගැස්ම


පෙරවදන **v**

'ජනතා බලයක් - ජනතා පාලනයක්'
දිගුකාලීන වැඩපිළිවෙළ පිටුව **17**

සංක්‍රමණීය වැඩපිළිවෙළ පිටුව **75**

විශේෂ ඇමිණුම (Exit IMF) පිටුව **159**

# 'ජනතා බලයක් - ජනතා පාලනයක්'

# දිගුකාලීන වැඩපිළිවෙළ

# 'ජනතා බලයක් - ජනතා පාලනයක්'
# දිගුකාලීන වැඩපිළිවෙළ

## ප්‍රවේශය

ලාංකේය දේශපාලනය ආසන්න වකවානුවේ අතිශය ගැඹුරු ආර්ථික හා දේශපාලන අර්බුදයක කරවටක් ගිලී පවතියි. නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියත් එහිම අතුරුඵලයක් වන ණය උගුලත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලහත්කාරය හා එහි කොන්දේසි නොසලකා හරිමින් බොහෝ දෙනා මතුපිට හේතු හා සිදුවීම් පමණක් අර්බුදයේ මූලය ලෙස හුවා දක්වමින් සිටිති. ලාංකේය පසුගාමී ධනවාදයේ ප්‍රතිඵලයක් වන දේශපාලන සංස්කෘතියේ පිරිහීම් පමණක් හුවා දක්වමින් සිටිති. අර්බුදය ගැඹුරින් වටහා ගැනීම, එයට ස්ථාවර දිගුකාලීන විසඳුම් සෙවීම වෙනුවට බල ක්‍රීඩාව සඳහා ව්‍යාජ හා ජනප්‍රිය විසඳුම් සියලු පාර්ශ්ව වෙතින් යෝජනා වෙමින් පවතියි. අර්බුදය ජනිත කළ ආර්ථික ප්‍රතිපත්තියම විසඳුම ලෙස නැවත වටයකින් කරළියට රැගෙන එමින් පවතියි.

එළඹීමට නියමිත කුමන මැතිවරණයක් අවසානයේ වුව නිර්ධන පන්තියට ජයග්‍රහණ හිමි

වන්නේ නැත. මැතිවරණ ජයග්‍රහණයක් ඊනියා ජනවරමක් ලැබීමක් ලෙස අර්ථ ගන්වමින් මේ නව ලිබරල් වැඩපිළිවෙළම ඉදිරියට රැගෙන යාමට කුමන පාර්ශ්වයක් බලයට පත් වුවත් එය අවස්ථාවක් කරගනු නියතය.

එම නිසා කෙතරම් අසීරු වුවත් නිර්ධන පන්තියට (ජනතාවට) ජයග්‍රහණ හිමි විය යුතු ධනවාදයේ අර්බුදයට විසඳුම් සෙවීමේ ප්‍රතිපත්තිමය සංවාදය සමාජවාදය සමග බැඳී පවතී. ඒ සඳහා සමාජවාදී වැඩපිළිවෙළක ප්‍රතිපත්තිමය පදනම් තහවුරු කිරීම අත්‍යාවශයෙන් මගහැරයා නොහැකි වගකීමකි. සමාජවාදී වැඩපිළිවෙළක ප්‍රතිපත්තිමය පදනම මත නොපිහිටුවා හදිසි කර්තව්‍යයන් පිළිබඳ ඉල්ලීම් හා සටන් පාඨ ගොනු කිරීම පවා දේශපාලනිකව නිවැරැදි නොවේ.

2022 ජනතා අරගලය විසින් තහවුරු කරන ලද අවම මූලික ප්‍රතිසංස්කරණ ඉල්ලීම් (ගෝල්ෆේස් අරගලකරුවන් වශයෙන් ඉදිරිපත් කළ *'අරගලයේ හෙට දවස - ක්‍රියාකාරී සැලැස්ම'* ද ඇතුළත්ව) සඳහා ද වන පදනම පවා ලාංකේය සමාජ ආර්ථික දේශපාලන අර්බුදයට තිබෙන එකම විසඳුම වන සමාජවාදී වැඩපිළිවෙළ පමණක් බව අප ප්‍රකාශ කරන්නේ එම නිසාය.

ජන සහභාගී ගැඹුරු සංවාදයක ප්‍රතිඵලයක්

ලෙස මෙම සංක්ෂිප්ත ප්‍රතිපත්තිමය පදනම් සංවර්ධනය වියයුතු බවට හා සවිස්තර වියයුතු බවට කිසිදු විවාදයක් නොමැත.

## රාජ්‍ය ව්‍යුහය

ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිළිබඳ ප්‍රශ්නයේ දී අපගේ වැඩපිළිවෙළ වනුයේ ලිබරල් සීමාවේ අයිතීන් ආරක්ෂා කරන අතරම එය එතැනින් ඔබ්බට ගෙන ගොස් ජනතාවගේ සැබෑ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් දිනා ගැනීමයි. ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස වර්ධනය කළ යුතු අතර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපගේ අදහස පදනම් දෙකකින් යුක්තය.

1. දේශපාලන ප්‍රජාතාන්ත්‍රිකකරණයක් අනිවාර්ය ලෙස ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකරණයක් සමඟ බැඳී පවතින අතර ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකෙන රාජ්‍ය ව්‍යුහයන් නිර්මාණය කිරීම සමාජ-ආර්ථික-දේශපාලන-සංස්කෘතික ක්ෂේත්‍රයන්හි සිදු කෙරෙන විප්ලවීය පරිවර්තනයක් සමග බැඳී පවතී. එබැවින් රාජ්‍ය ව්‍යුහය සම්බන්ධ සාකච්ඡාව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සමඟ සංයුක්තව සම්බන්ධ කළ යුතුය.
2. සැබෑ ප්‍රජාතන්තවාදය දිනා ගැනීම සඳහා

විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය සංවරණයට හා තුලනයට ලක් කිරීම පිළිබඳ සාම්ප්‍රදායික ලිබරල් චින්තන සීමාවෙන් ඔබ්බට ගොස් ජනතාවගේ දේශපාලන දායකත්වය ශක්තිමත් කිරීම හා ජනතා බලය තහවුරු කෙරෙන නව ආකෘතියක් අවශ්‍ය වේ.

ජෝන් ලොක්, තෝමස් හොබ්ස් වැනි ලිබරල් දෘෂ්ටිවාදීන් විසින් ඉදිරිපත් කරන ලද මූලධර්මය වූයේ 'බලය බෙදීම' (seperation of power) මූලධර්මයයි. එයට අනුව විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය යන අංශ සඳහා වන බලය එකිනෙකින් තියුණු ලෙස වෙන් වන අතර ඒවා ක්‍රියාවේ යෙදවීම සඳහා වෙනම ආයතනික ව්‍යුහයන් සකස් කෙරේ. නමුත් මීට ප්‍රතිපක්ෂව සමාජවාදීන් අතර භාවිත වූයේ ප්‍රංශ දාර්ශනික රූසෝ විසින් ඉදිරිපත් කරන ලදුව පැරිස් කොමියුනය හරහා වර්ධනය කර ක්‍රියාවට නැංවනු ලැබූ 'බලය විමධ්‍යගතකරණය' (devolution of power) මූලධර්මයයි. පළමුවැන්න තුළ ජනතා නියෝජිතයන් තෝරා පත්කරන අතර එම නියෝජිතයන් අතර ඉහළින් තිරස් ලෙස බලය බෙදාගනු ලැබේ. දෙවැන්න තුළ පොදු 'ජනතා අපේක්ෂාව' (popular will) ඒකාබද්ධ සමස්තයක් ලෙස සලකනු ලබන අතර විධායක-ව්‍යවස්ථාදායක-

අධිකරණ බලතල අතර ඒකාබද්ධතාව පළමුවැන්නට වඩා වැඩිය. එම සංයුක්ත බලය සිරස් අතට ඉහළ සිට පහළටත් පහළ සිට ඉහළටත් රාජ්‍ය ව්‍යුහයන්ගේ සිට ජනතා ඒකක දක්වාත් ඒවායේ සිට නැවත විවිධ රාජ්‍ය ව්‍යුහයන් දක්වාත් විමධ්‍යගත කරමින් නැවත ඒකාබද්ධ කරමින් ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රමයක් ලෙස යොදා ගනු ලැබේ. ලිබරල් සංකල්පය තුළ ජනතා පරමාධිපත්‍යයේ බලය නියෝජිත ආයතනවලට නිශ්චිත කාලයකට වරක් පැවරෙන අතර සමාජවාදී සංකල්පය වන්නේ ජනතාව සිය පරමාධිපත්‍ය බලය අඛණ්ඩව හා දෛනිකව අභ්‍යාස කිරීමයි.

'නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය' පිළිබඳ සාම්ප්‍රදායික ලිබරල් මතවාදයට අනුව ජනතාව සතු පරමාධිපත්‍යයේ බලය යම් නිශ්චිත කාලයකට මැතිවරණවලින් තෝරා පත් කර ගනු ලබන නියෝජිත ආයතනවලට හා නියෝජිතයන්ට පැවරේ. එම ක්‍රියාවලිය තුළ සිදුව ඇති විකෘතිතා මෙන්ම ඊනියා නියෝජිත ආයතනවලින් හා නියෝජිතයන් අතින් බලය අයුතු ලෙස භාවිත කිරීමට අදාළව ඇති අත්දැකීම් බහුල නිසා නව යෝජනාවක් සකස් කළ යුත්තේ එම රාමුව අභියෝගයට ලක් කරමිනි. එහිදී ජනතාවට නිරන්තරව සිය පරමාධිපත්‍යයේ බලය අභ්‍යාස කිරීමට අවස්ථාව සැලසිය යුතු අතර

විධායකය - ව්‍යවස්ථාදායකය - අධිකරණ බලතල වෙන් වෙන් ව්‍යුහයන්ට පවරා ඒවා අතර සංවරණය හා තුලනය නිර්මාණය කරන ක්‍රමය වෙනුවට ජනතා පරමාධිපත්‍යයේ බලය ඒකාබද්ධ සමස්තයක් ලෙස ක්‍රියාකාරී වන ක්‍රමයක් පිළිබඳව අප අවධානයට ගත යුතුය. මෙවැනි ක්‍රමයක් මගින් පොදු ජනතාව විශාල වශයෙන් දේශපාලන සක්‍රීයතාවට ඇද ගැනීම මෙන්ම දේශපාලනයේ දී ප්‍රජා සහභාගීත්වය වැඩි කිරීමට ද අපේක්ෂා කරනු ඇත. වැඩබිම්, ගොවිබිම්, ධීවර තොටුපොළ, අධ්‍යාපන ආයතන, ගම් හෝ නගර මට්ටමින් ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන මහජන සභා මෙවැනි ව්‍යුහයක පරිධියේම පවතිනු ඇති අතර ජාතික වශයෙන් නීති සකස් කිරීමේ බලය ක්‍රියාත්මක වන ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකයක් කේන්ද්‍රයේ පවතිනු ඇත.

විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ බලය පරිධිය ඒකකය දක්වා යම් නිශ්චිත අනුපාතවලින් විමධ්‍යගත කෙරෙනු ඇත්තේ රටේ මූලික නීතියට පටහැනි නොවන ලෙස ප්‍රඥප්ති සම්මත කිරීමේ බලය, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ බලය හා ජනතා අධිකරණ ඇතුළු ක්‍රම හරහා පරිධියේ ඒකක දක්වාම බලය අභ්‍යාස කිරීමට පෙලඹවීම මඟිනි. ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකයේ බලය ද යළි ජනතා පරමාධිපත්‍යයේ බලයට යටත් කෙරෙනු

ඇත්තේ නියෝජිතයන් කැඳවීමේ අයිතිය (right to recall), සම්මත කළ නීතිවලට පවා අභියෝග කිරීමේ බලය (judiciary review), නිශ්චිත අත්සන් සංඛ්‍යාවක් සහිත පෙත්සම් හරහා ජනමත විචාරණ සහ මැතිවරණ කැඳවීමේ බලය ආදී බලතල ව්‍යවස්ථානුකූලවම මහජන සභාවලට ලබා දීම මගිනි. විවිධ නියෝජිත ආයතනවල නියෝජිතයන් මහජනතාවගෙන් ඉහළට එසවුණු වෙනම ප්‍රභූ බලයක් වීම වැළැක්වීම සඳහා ඔවුන් ජනතාවට වඩා වෙනස් වරප්‍රසාද විඳීම අහෝසි කිරීම, ඔවුන්ගේ වැටුප් පුහුණු කම්කරුවන්ගේ වැටුප් නොඉක්මවීම, ඔවුන්ගේ වත්කම්-බැරකම් දැන ගැනීමට ජනතාවට ඇති අයිතිය සුරැකීම, ඕනෑම ජනතා නියෝජිතයෙකු අධිකරණ ක්‍රියාවලියේ දී සාමාන්‍ය ජනතාවගේ මට්ටමේලා සැලකීම, ඕනෑම ජනතා නියෝජිතයෙකු අධිකරණය හමුවට ගෙන යාම හෝ නැවත කැඳවීම සඳහා ජනතාවට ඇති අයිතිය සුරැකීම වැනි ක්‍රමවේද භාවිත කෙරෙනු ඇත. මෙවැනි ක්‍රමයක් තුළ මහජන සභා හුදු කතා සාප්පු බවට පත්වීමෙන් මුදාගෙන ජනතා නියෝජිතයන් රාජ්‍ය පාලනයේ හා පරිපාලනයේ සක්‍රීය කොටස්කරුවන් බවට පත් කිරීමට පියවර ගැනෙනු ඇත.

අනෙක් අතට පවත්නා ධනවාදී ක්‍රමයට වඩා වෙනස්ව සමාජවාදී ආණ්ඩු ක්‍රමයක දී අප

සලකා බැලිය යුතු අතිශය ප්‍රමුඛ කාරණයක් පවතී. එනම් රාජ්‍ය පාලන ව්‍යුහය මගින් නියෝජනය කරන්නේ ලාභය හෝ සූරාකෑම මත පදනම් වූ සුළුතරයකගේ අවශ්‍යතාව නියෝජනය කරන නිෂ්පාදන හෝ බෙදාහැරීමේ හෝ ක්‍රමයක් නොවේ. එමගින් නියෝජනය කරන්නේ සාතිශය බහුතරයකගේ අවශ්‍යතා මුල් කොටගත් නිෂ්පාදනය හා බෙදාහැරීමේ ක්‍රමයකි. එය සිදු කළ හැක්කේ එම තත්වය පදනමක් වශයෙන් පිළිගන්නා රාජ්‍ය ව්‍යුහයකින් පමණි. ඒ සඳහා වත්මන් සමාජයේ සුළුතරයක් වූ පීඩකයන්ගේ පාලනයක් නොව වත්මන් සමාජයේ පීඩනයට පත් වී ඇති සාතිශය බහුතරයකගේ පාලනයක් අවශ්‍ය වේ. එම බහුතරයේ බලය නිරූපණය කරන හා සුරැකෙන ලෙස සමාජවාදී ආණ්ඩු ක්‍රමයක රාජ්‍ය ව්‍යුහය සකස් වේ.

එය ව්‍යවස්ථාවකින් පමණක් සිදු කළ හැකි කාරණයක් නොවේ. පුළුල් බහුජනතාව මෙන්ම පාලන ක්‍රියාදාමයට අඛණ්ඩව සම්බන්ධ කරගන්නා යාන්ත්‍රණයක් අවශ්‍ය වන්නේ එම නිසාය. ඉහතින් සඳහන් කළ ආකාරයේ මූලධර්ම මත පදනම්ව පමණක් එවැනි යාන්ත්‍රණයක් සකස් කර ගනු හැකි වනු ඇත. මධ්‍යගතභාවයට අනුව ආණ්ඩු ක්‍රමයක් සකස් කිරීම යනු මෙයයි. එමගින් මධ්‍යගත පාලනයක් පවත්නා අතරම එය නිරන්තරයෙන්ම

ක්‍රියාත්මක කෙරෙන්නේ පුළුල් ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම මතයි. වසර හතරකට පහකට හෝ හයකට වරක් වශයෙන් පමණක් නොව අඛණ්ඩව ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක් මාර්ගයෙන් ජනතා බලය අභ්‍යාස කිරීම මෙහි අරමුණයි. එය සිදුවන්නේ සමාජයේ සාතිශය බහුතර සමාජිකයන්ගේ අඛණ්ඩ සහභාගීත්වය මතයි. සමාජවාදී රාජ්‍යය මගින් ගන්නා සියලුම ක්‍රියාමාර්ග එකින් එක මහජන විමසීමට ලක් කිරීම වැනි අතාර්කික තත්වයක් මෙමගින් අදහස් නොකරන නමුත් එවැනි තීරණ ගැනීමට පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් මත සකස් කොට ඇති විවිධ මට්ටම්වල ව්‍යුහයන් විටින් විට තෝරා පත් කර ගැනීම, අවශ්‍ය වූ විටක නැවත කැඳවීම, සමහර වැදගත් තීන්දුවලට කෙළින්ම සහභාගී වීම මගින් මෙම ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය ප්‍රකාශයට පත් වේ.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමේ දී සමාජවාදී හා වාමාංශික සංකල්පය වනුයේ ඒ සඳහා පුළුල් මහජන සහභාගීත්වයක් ලබා ගැනීමයි. මෙතෙක් ලංකාවේ සම්මත කරන ලද සෝල්බරි, 1972, 1978 යන කිසිදු ව්‍යවස්ථා තුළින් එවැනි සහභාගීත්වයක් කෙසේ වෙතත් ඒ ව්‍යවස්ථාවන්

සඳහා මහජන අදහස් ලබා ගැනීමවත් නොකළ අතර ඒවා ජනමත විචාරණයකට බඳුන් නොකර පාර්ලිමේන්තු මගින් සම්මත කරන ලදී. ඒ පිළිබඳව අපගේ ප්‍රතිපත්ති මෙසේ සඳහන් කළ හැකිය.

1. නව ජනතාවාදී ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා ව්‍යවස්ථාදායක මණ්ඩලයක් වහා පත් කළ යුතුය.
2. එම ව්‍යවස්ථාදායක මණ්ඩලය සඳහා නියෝජිතයන් තේරීමේ දී වැඩ කරන ජනතාව ප්‍රමුඛ පීඩිත බලවේග නියෝජනය කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයක් සකස් කළ යුතුය. නිදසුනක් ලෙස වෘත්තීය සමිති භේදයකින් තොරව වැඩබිම්වල සෘජු කම්කරු ඡන්දයෙන් තෝරා පත් කරගන්නා කම්කරු නියෝජිතයන්ගෙන් හෝ ගොවිබිම්වල ගොවි ජනතාවගේ නියෝජිතයන්ගෙන් සමන්විත නියෝජිත සම්මේලන මගින් මෙම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට කම්කරු හෝ ගොවි නියෝජනය තෝරා පත් කළ හැකිය.
3. ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට මහජන අදහස් ලිඛිතව හා වාචිකව ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.
4. රාජ්‍ය ව්‍යුහයේ දී ව්‍යවස්ථාදායකය හා විධායකය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය

තීරණ හා එමගින් සම්මත කරනු ලබන පනත් මගින් සුළුතර ජාතික සංස්කෘතික ජන කොටස්වලට අසාධාරණයක් වීම වැලැක්වීම සඳහා ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකයක් යෝජනා කරනු ලබයි. ඉන් එක් මණ්ඩලයක් සියලු ජාතික ජන කොටස්වලට සමාන නියෝජනයක් ලැබෙන සේ මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගැනෙන මැතිවරණ ක්‍රමයක් සකස් කරනු ඇත. ජාතික සමගියට හා ජාතික සංස්කෘතික සමානාත්මතාවට බලපෑම්සහගත විය හැකි පනත් කෙටුම්පත් හෝ යම් නීතියක් මෙම ද්විමණ්ඩලවලම සම්මත වීම අනිවාර්ය කෙරේ.

5. අවසානයේ දී සකස් කරනු ලබන ව්‍යවස්ථාව ප්‍රමාණවත් සංවාදයකට බඳුන්කර ජනමත විචාරණයක් මගින් සම්මත කළ යුතුය.

## රාජ්‍යයේ ලෞකික ස්වරූපය (අනාගාමික භාවය)

1. රාජ්‍යයේ ලෞකික ස්වරූපය සහතික කළ යුතුය. ආගමික කටයුතු සඳහා දේශපාලන මැදිහත්වීම මෙන්ම දේශපාලන කටයුතු සඳහා ආගමික ආයතනවල මැදිහත්වීම ද අහෝසි කළ යුතුය.

2. ආගම පුරවැසියන්ගේ පෞද්ගලික කටයුත්තක් වන අතර සෑම කෙනෙකුටම තමන් කැමති ආගමක් ඇදහීමට හෝ නො ඇදහීමට ඇති අයිතිය සහතික කළ යුතුය. ආගමික හේතු මත වෙනස්කම් කිරීම තහනම් කළ යුතුය.
3. සියලුම ආගම් සම තත්වයේ ලා සැලකිය යුතු අතර කිසිදු ආගමකට විශේෂ ප්‍රමුඛතාවක් හෝ වරප්‍රසාදයක් ලබා නොදිය යුතුය.

## මූලික මිනිස් අයිතිවාසිකම්

ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද ලබ්ධියක් හෝ ආගමක් විශ්වාස කිරීමේ නිදහස, වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන්සහගත සැලකිල්ලට භාජනය නොවීමේ නිදහස, නීතියේ රැකවරණය, වර්ගය - ආගම - භාෂාව - කුලය - ලිංගිකත්වය දේශපාලන මතය හෝ උපන් ස්ථානය මත වෙනස්කමකට භාජනය නොවීමේ නිදහස ආදී අයිතිවාසිකම් 3 වන පරිච්ඡේදය තුළ තහවුරු කර ඇත. භාෂණයේ නිදහස, අදහස් ප්‍රකාශනයේ අයිතිය, රැස්වීමේ හා සමාගමයේ අයිතිය, වෘත්තීය සමිති හා සංගම් පිහිටුවීමේ අයිතිය ආදිය ද තහවුරු කර තිබේ. ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම කෙසේ වුවද ව්‍යවස්ථාව තුළ සඳහන්ව ඇති මූලික අයිතිවාසිකම් ලංකාවේ ව්‍යවස්ථාව තුළ අවම වශයෙන් එක්සත්

ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ මට්ටමට හෝ ළඟා වී නැත. නිදසුනක් ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ තුන් වැනි වගන්තියේ ඇති 'ජීවිතයට, නිදහසට හා ජීවිතාරක්ෂාවට ඇති අයිතිය' වත්මන් ව්‍යවස්ථාව තුළ සඳහන්ව නැත. අලුතෙන් නිර්මාණය වන ව්‍යවස්ථාවක අවම වශයෙන් පහත අයිතීන් ව්‍යවස්ථානුකූලව පිළිගත යුතුය.

1. සිය සම්භවය, සමාජ තත්වය, ජාතිය, ආගම, භාෂාව, අධ්‍යාපනය, ලිංගික අනන්‍යතාව, රැකියාවේ ස්වභාවය ආදී කිසිදු භේදයකින් තොරව සියලු පුරවැසියන් සමානත්වයෙහි ලා පිළිගැනීම.

1.1 ලබ්ධියක් හෝ ආගමක් විශ්වාස කිරීමේ නිදහස මෙන්ම විශ්වාස නොකිරීමේ නිදහස

1.2 වධ හිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන්සහගත සැලකිල්ලට භාජනය නොවීමේ නිදහස, නීතියේ රැකවරණය ලැබීමේ අයිතිය.

2. ස්ත්‍රී/ පුරුෂ සමානාත්මතාව පිළිගන්නා අතරම කාන්තාවන් සඳහා විශේෂ සෞඛ්‍ය හා ශ්‍රම ආරක්ෂක පියවර, ස්ත්‍රීන්ගේ ශ්‍රම කාර්යයන් ඇගේ මාතෘත්වය සමග ඒකාබද්ධ කළ හැකි කොන්දේසි සැපයීම, ගර්භණී මව්වරුන්ට හා

කුඩා දරුවන් සහිත මව්වරුන්ට වැටුප් සහිත නිවාඩු හා වැඩ කරන කාලය අඩු කිරීම ඇතුළු විශේෂ අවස්ථා ද වරප්‍රසාද ද සැපයීම අයිතියක් ලෙස පිළිගැනීම.

2. ගෘහීය කටයුතුවල යෙදෙන කාන්තාවන්ගේ ශ්‍රම කාර්යය සමාජමය කර්මාන්තයක් වශයෙන් සලකනු ඇත. එනම් විවිධ තත්වයන් යටතේ දරුවන් රැක බලා ගැනීමට යොමු වීමේ දී පවුලේ අත්‍යාවශ්‍ය කටයුතු සිදුකිරීමේ දී වැය කරන ශ්‍රමය සමාජමය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කටයුත්තක් වශයෙන් සලකා බලා කටයුතු කරනු ලැබේ. එමගින් ගෘහීය කටයුතුවල නියැළී සිටින කාන්තාව පත්ව ඇති අසමාන සැලකිල්ල වෙනුවට එම කාර්යයන්හි ඇති සමාජමය වටිනාකම නිවැරදි ලෙස අවධාරණය කෙරෙනු ඇත.

3. වැඩ කිරීමේ අයිතිය, සිය නිපුනතා හා හැකියාවත් සමාජයීය අවශ්‍යතා අනුව රැකියාවක් තෝරා ගැනීමේ අයිතිය, රැකියාව අහිමිවීමේ හා විරැකියාවේ අවදානමෙන් නිදහස් වීමේ අයිතිය.

3.1 වෘත්තීය සමිති සංගම් පිහිටුවීමේ අයිතිය, වෘත්තීය ඉල්ලීම් හා වෘත්තීය ආරක්ෂාව වෙනුවෙන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග

ගැනීමේ අයිතිය

3.2 සමාජයේ සෑම සාමාජිකයෙකුටම තෘප්තිමත්ව තම ශ්‍රම කටයුතු කිරීමේ හැකියාව සහතික කරනු ලැබේ. එනයින් විවිධ කර්මාන්ත හෝ විවිධ ශිල්පීය නිපුණතා වෙත සංක්‍රමණය වීමට ඇති අයිතිය ව්‍යවස්ථාවෙන්ම සහතික කරනු ලැබේ. මෙසේ තම රැකියාව හෝ ශ්‍රම කටයුත්ත තෘප්තිමත්ව සිදුකිරීමට අවශ්‍ය තත්වයන් නිර්මාණය කිරීම මගින් ශ්‍රම ඵලදායකත්වය වඩා ඉහළ තත්වයකට වර්ධනය කර ගත හැකි වන එමඟින් වැඩ කරන කාලය අවම කර ගැනීමටත් පවුලේ හා සමාජයීය කටයුතු සඳහා තෘප්තිමත්ව සහභාගී වීමටත් අවශ්‍ය මිනිසෙකු නිර්මාණය කෙරෙනු ඇත. මෙමගින් සමස්ත සමාජය වෙත සාමූහික හා මානුෂවාදී ගුණයෙන් අවතීර්ණ වන මිනිසෙකු නිර්මාණය කෙරෙනු ඇත.

4. කිසිදු අඩු සැලකිල්ලකට බඳුන් නොවී සමාන වැඩට සමාන වැටුප් ලැබීමට අයිතිය, සමාජ ආරක්ෂණ ප්‍රදානයන් සහිතව සාධාරණ වේතනයක් ලැබීමේ අයිතිය.

5. දෛනික වැඩ පැය ගණන සීමා කිරීම හා නිවාඩු දින සහිතව ප්‍රමාණවත් විවේකයක්

ලබා ගැනීමේ අයිතිය

6. මහලු වියට එළඹීම හෝ ආබාධිත වීම හෝ අසනීප තත්වයන් නිසා වැඩ කිරීමට නොහැකි වන සෑම දෙනාටම සමාජමය ලෙස යැපුම් මාධ්‍ය හිමි කර ගැනීමට ඇති අයිතිය.
7. රැකියාවේ යෙදෙන්නා මියගියහොත් මෙකී අයිතීන් එම පවුලට හිමිකර දීමට ඇති අයිතිය.
8. සිය වෘත්තිය තුළ වෘත්තිය ආශ්‍රිත ලෙඩ රෝග හෝ හදිසි අනතුරුවලින් ඉවත්ව ආරක්ෂිතව ශ්‍රමය වැය කිරීමට ඇති අයිතිය.
9. රෝග වැළැඳීමෙන් ආරක්ෂා වීමටත් ලෙඩරෝගවලට ප්‍රතිකාර ගැනීමටත් සියලු මිනිසුන් සතු සම අයිතිය. (නිදහස් සෞඛ්‍ය සේවයක් සඳහා වන අයිතිය)
10. අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමට සෑම මිනිසෙකුටම ඇති අයිතිය. (අධ්‍යාපනය ලැබීමේ දී විශේෂ අවශ්‍යතා හා ගැටලු ඇති අයද ඇතුළත්ව) එහි දී සියලු ක්ෂේත්‍රවල ගුණාත්මක වශයෙන් උසස් නිදහස් අධ්‍යාපනයක් ලැබීමට ඇති අයිතිය. ප්‍රථම උපාධිය දක්වා සහ නිශ්චිත වෘත්තීය මට්ටමක් දක්වා නොමිලේ අධ්‍යාපනය ලැබීමට ඇති

අයිතිය. මෙහි දී ධනේශ්වර ආර්ථිකයේ ශ්‍රමිකයෙකු වීම සඳහා පුහුණුව ලබාදෙන සීමාව ඉවත් වී එය මානව සමාජයේ දැනුම හා අත්දැකීම් අනාගත පරම්පරාවන්ට දායාද කරන ක්‍රමයක් බවට පත් කරනු ඇත.

11. ක්‍රීඩාවේ නියැළීමටත් ඒ සඳහා පුහුණුව ලැබීමටත් ක්‍රීඩා නැරඹීමටත් ඇති අයිතිය.

12. ජනතාවට අදහස් ප්‍රකාශ කිරීමට, රැස්වීමට, සමාගමෙහි යෙදීමට, තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය. රාජ්‍ය වාරණයට හෝ සීමාවන්ට යටත් නොවී මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් චුම්භක තරංග භාවිත කිරීමට ප්‍රජාවට ඇති අයිතිය.

13. සිය ලිපි, ෆැක්ස්, විද්‍යුත් තැපැල, දුරකථන ඇතුළු සන්නිවේදන මාධ්‍යයන්ට රාජ්‍ය ආයතන හෝ අන් කවරකු විසින් රහසේ ඇතුළුවීම වළක්වාලීමට ඇති අයිතිය. පෞද්ගලිකත්වයේ අයිතිය නීතියෙන් ආරක්ෂා කෙරෙනු ඇත.

14. සංස්කෘතික ජීවිතයට නිදහසේ ප්‍රවේශ වීමටත් කලාව රස විඳීමටත් විද්‍යාත්මක දියුණුවේ කොටස්කරුවන් වීමටත් ඇති සම අයිතිය. මෙහි දී විශේෂ කායික හෝ මානසික සුවිශේෂතා ඇති පුරවැසියන්ට සංස්කෘතික අයිතීන් භුක්ති විඳීමට ඇති අයිතිය තහවුරු

කිරීම සඳහා විශේෂ විධි විධාන සකස් කෙරෙනු ඇත.

15. ජනතාවගේ නිවසේ අනුල්ලංඝනීය බව සඳහා ඇති අයිතිය. නිවැසියන්ගේ කැමැත්තකින් තොරව නීත්‍යනුකූලභාවයකින් තොරව කිසිවෙකුට නිවසට ඇතුළු වීමට අයිතියක් නැත.

16. සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ලැබීමේ අයිතිය. පාරිසරික විනාශයන්ගේ ගොදුරු බවට පත් නොවීමේ අයිතිය.

සමාජවාදී සමාජ ක්‍රමයක් තුළ දී ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම්වලට අමතරව මූලික යුතුකම් පිළිබඳ පරිච්ඡේදයක් ද ඇතුළත් කෙරෙනු ඇත. ඒ අනුව වැඩ කිරීම අයිතියක් පමණක් නොව යුතුකමක් ද වේ. අධ්‍යාපනය අයිතියක් පමණක් නොව යුතුකමකි. පවුල සැලසුම් කර ගැනීම මෙන්ම වැඩිහිටි නොවූ දරුවන් ආරක්ෂා කර ගැනීම යුතුකමකි. අනෙක් පුරවැසියන්ගේ සහ තමන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීම ද, සමාජවාදය පවත්වාගෙන යාම ආදිය ද යුතුකම් වශයෙන් එහි විශේෂ පරිච්ඡේදයකට ඇතුළත් වනු ඇත.

## නියෝජිතයන් විශේෂ වරප්‍රසාද භුක්ති නොවිඳීම

1. සියලුම රාජ්‍ය බලයේ නියෝජිත ආයතන සඳහා නියෝජිතයන් පත් කරගත යුත්තේ ජනතාවගේ නිදහස් ඡන්දය තුළිනි. වයස අවු 16 ඉක්මවූ සෑම පුරවැසියෙකුටම නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට සහභාගී වීමටත් අවු 18 ඉක්මවූ සෑම පුරවැසියෙකුටම නියෝජිතයෙකු ලෙස තේරී පත්වීමටත් අයිතිය තිබේ.
2. ජනතාව සහ නියෝජිතයන් රාජ්‍ය කටයුතුවලදී සහ පරිපාලනයේ දී ක්‍රියාකාරීව සහභාගී කර ගනු ලැබේ.
3. යම් කාලයක් සඳහා තෝරා පත් කර ගනු ලබන නියෝජිතයන් ඕනෑම අවස්ථාවක දී යළි කැඳවීමේ බලය ඡන්ද දායකයන් සතු වේ.
4. නිලධාරීවාදය පෝෂණය වීම වැළැක්වීම සඳහා පහත පියවර යෝජනා කරනු ලැබේ.

1. ජනතා නියෝජිතයන් කුමන ආකාරයකින් හෝ සාමාන්‍ය ජනතාවට වඩා වෙනස් වරප්‍රසාද භුක්ති විඳීම අහෝසි කිරීම.
2. එම නියෝජිතයන්ගේ වේතන පුහුණු කම්කරුවන්ගේ වේතන නොඉක්මවීම.

3. එම නියෝජිතයන්ගේ වත්කම් බැරකම් පිළිබඳ තොරතුරු දැනගැනීමට ජනතාවට ඇති අයිතිය ආරක්ෂා කිරීම.
4. ඕනෑම ජනතා නියෝජිතයකු අධිකරණය හමුවට පැමිණවීමට ඇති අයිතිය පිළිගැනීම.

## ප්‍රජා සහභාගීත්වය මත ගොඩනැගෙන රාජ්‍ය ව්‍යුහය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව සමාජවාදී ප්‍රතිපත්තිය සකස් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතකරණයේ මූලධර්මයට අනුවය. එය බෙහෙවින් මධ්‍යගත වන නමුදු එය මධ්‍යගත කෙරෙන්නේ ඒකාධිපති රාජ්‍යවල මෙන් අත්තනෝමතිකව නොව ප්‍රජාතන්ත්‍රවාදී ලෙසය. එවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් එක්වරම ප්‍රජාතන්ත්‍රවාදී ජන සහභාගී මූලධර්මය ක්‍රියාත්මක වන අතරම ක්ෂණික මැදිහත්වීම්වලට අදාළ වන පරිදි මධ්‍යගත වේ. මධ්‍යගතභාවය යනු ප්‍රධාන රාජ්‍ය ප්‍රතිපත්ති අතින්ද පොදු මාර්ගෝපදේශන අතින් ද සමස්ත රාජ්‍යයම සඳහා සැලසුම් කරන ආර්ථිකය තුළින්ද සියලු ඒකක එක් වැඩපිළිවෙළක් තුළ ඒකාබද්ධ කිරීමයි.

ප්‍රජාතන්ත්‍රවාදය යනු සෑම ඒකකයක්ම එකිනෙකට වගකියන අතර සමස්ත ව්‍යුහයම ජනතාවට වගකීමයි. සෑම ඒකකයක්ම හා

නියෝජිතයෙකුම ජනතාවගේ පාලනයට, නැවත කැඳවීමට යටත් වීමයි. කෙටියෙන්ම කියන්නේ නම් ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය යනු නියෝජිත ආයතන ජනතාව විසින් ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් තෝරා පත්කර කර ගැනීම, සියලු නියෝජිත ආයතන ජනතාවගේ අභිලාශයන් නියෝජනය කිරීම හා ජනතාවට වගකීම, සියලු නියෝජිත ආයතන තමන්ට ඉහළ නියෝජිත ආයතනවලට වගකීම, සෑම නියෝජිත ආයතනයක්ම තමන්ගේ ස්වාධීත්වයේ වපසරිය තුළ නිදහස භුක්ති විඳීම (ඉහළ නියෝජිත ආයතනවල තීරණවලට ප්‍රතිවිරෝධී නොවන) ලෙස යන සියල්ලේ සංයුක්තකරණයකි.

## මහජන සභා

මෙම ව්‍යුහයේ මූලික ඒකකය වන්නේ වැඩබිම් මට්ටමෙන්, ගොවිබිම් මට්ටමෙන්, ධීවර තොටුපොළ මට්ටමෙන්, විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතන මට්ටමෙන්, ගම් හෝ නගර මට්ටමෙන් ඒවායේ සිටින ප්‍රජාවන් නිදහස් ඡන්දයෙන් තෝරා ගැනෙන මහජන සභාවන්ය. බොහෝ සමාජවාදී රටවල රාජ්‍ය ව්‍යුහයෙහි මූලික ඒකකය වූයේ ප්‍රදේශ මට්ටමින් තෝරා ගනු ලබන මහජන සභාවන්ය. මෙම සභාවල නියෝජිත සංඛ්‍යාව තීරණය වනුයේ භූමියේ ප්‍රමාණය, බලවේගයේ ස්වභාවය, ජන

සංඛ්‍යාව ඇතුළු භෞතික සාධක මතය. මෙම මහජන සභාවල නියෝජනයේ ප්‍රමුඛතාව ලැබෙන්නේ කම්කරු, ගොවි, ධීවර, ශිෂ්‍ය, තරුණ, කාන්තා යනාදී බලවේගවලටය. එමෙන්ම සංයුතියේ දී ජාතිකමය, ආගමිකමය, සංස්කෘතිකමය හා භාෂාමය විවිධත්වය ද සැලකේ. මෙසේ මූලික මට්ටමේ මහජන සභා විසින් තෝරා යවන නියෝජිතයන්ගෙන් කොට්ඨාස සභා, දිස්ත්‍රික් සභා යළි නිර්ණය කිරීමට සිදුවනු ඇත. ලංකාවට අදාළව ගත් විට වත්මන් දිස්ත්‍රික් මැතිවරණ කොට්ඨාස පළාත් ආදී සීමාවන් බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන්ගේ පරිපාලනමය අවශ්‍යතා අනුව අවිද්‍යාත්මකව සකස් කළ ඒවා නිසා ස්වාභාවික ජන ඒකරාශී වීමේ ස්වරූපයට ආර්ථික ජීවිතයේ සම්බන්ධයට භූගෝලීය දේශගුණික සාධකවලට හා ජනගහනයට අනුව එය යළි විද්‍යාත්මකව නිර්ණය කළ යුතුය. කෙසේ වෙතත් සමස්ත ලංකාවේම තේරී පත්වන නියෝජිතයන්ගෙන් සමන්විත වන සමස්ත මහජන සභා සම්මේලනයක් පවතිනු ඇත.

## සිවිල් පරිපාලන සේවය හමුදාව සහ පොලීසිය

පැරණි යටත් විජිත ක්‍රමයේම දිගුවක් ලෙස පවත්වාගෙන යනු ලබන සිවිල් පරිපාලන සේවය ජනතා නියෝජිත පරිපාලන ක්‍රමයක් මගින් විස්ථාපනය කළ යුතුය.

වත්මන් පරිපාලන ප්‍රදේශ වෙන් කිරීම විද්‍යාත්මක ලෙස යළි සකස් කළ යුතුය.

ජනතාව මර්දනය කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන හමුදා, පොලිසි, බුද්ධි තොරතුරු ඒකක, ස්වේච්ඡා හමුදා සහ ආයතන විසුරුවා හැර ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ජනතාවගේ සන්නද්ධ සේවා ගොඩනැගිය යුතුය. ඒවා තුළ සමානාත්මතාව හා සහෝදරත්වය තහවුරු කරන අතර එහි පරිපාලනය නිලධාරී තන්ත්‍රයක් මගින් නොව සෙබළ කමිටු මගින් සිදු කළ යුතුය.

දැනට රාජ්‍ය හමුදාවල (මර්දන ආයතනවල) සේවයේ නියුතු වූවන් ඔවුන්ගේ හැකියා හා කුසලතා අනුව ශ්‍රම බලකායේ විවිධ අංශවලට සම්බන්ධ කළ යුතුය.

ජනතාවට පීඩාකාරී ආයතනයක් ලෙස පවතින ධනේශ්වර පොලීසිය වෙනුවට ප්‍රජා සහභාගී ස්වේච්ඡා සාම සේවයක් ගොඩනැගිය යුතුය.

## අධිකරණ පද්ධතිය

දැනට පවතින අධිකරණ ක්‍රමය තුළ ආසියාතික ක්‍රමයෙන් උරුම වූ පසුගාමී ලක්ෂණ, යටත් විජිත යුගයේ නශ්ටාවශේෂයන්, රෝම ලන්දේසි ධනේශ්වර නීතිය මත පදනම් වූ අසමානතා ලක්ෂණ මෙන්ම නිලධාරිවාදී ලක්ෂණ ද මුල් බැසගෙන

ඇත. ඒ වෙනුවට යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පුරවැසියාගේ ආත්ම ගෞරවය රැකෙන පරිදි, අධික ලෙස මුදල් කොල්ල කෑමට ඉඩ නොතබන කාර්යක්ෂමව සිදු කළ හැකි ක්‍රියාවලියක් බවට පත් විය යුතුය. දණ්ඩනයේ යුක්තිගරුක පදනම නිවැරදි වීම සඳහා අවකාශ සැලසීමයි, පුනරුත්ථාපනයයි, නැවත සමාජානුයෝජනයයි. ඒ සඳහා වන නව නීති පද්ධතියත් නව අධිකරණ පද්ධතියක් පිහිටුවීම ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකිය යුතු කරුණකි. විනිශ්චයකාරවරුන් නීතියට පමණක් පක්ෂපාතී පුද්ගලයන් හා නිදහස්, ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා අධිකරණ සේවාවට එල්ල වන සකල විධ බලපෑම් ඉවත් කිරීම අවශ්‍ය වේ.

1. සියලු අසමානතාවන් හා මර්දනීය ලක්ෂණත් ඉවත් කර නව ජනතාවාදී නීති පද්ධතියක් ස්ථාපිත කරනු ලැබේ.
2. නිලධාරීවාදය ද අකාර්යක්ෂමතාව ද අවසන් කර යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ පවතින සංකීර්ණතා හා ප්‍රමාදයන් වළකන නව අධිකරණ පද්ධතියක් ස්ථාපිත කරනු ලැබේ.
3. විනිශ්චයකරුවන්ගේ හා අධිකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලු නිලධාරීන්ගේ ස්වාධීනත්වයත් අපක්ෂපාතීත්වයත් තහවුරු කරවන නව බඳවා ගැනීම් පටිපාටියක් සහිත අධිකරණ

සේවයක් ස්ථාපිත කරනු ලැබේ. විධායකය වෙනුවට විනිශ්චයකරුවන් පත් කිරීමේ බලය ව්‍යවස්ථාදායකයටත් ජන සභාවලටත් හිමිවනු ඇත.

## අධිකරණ ව්‍යුහය

අධිකරණ ව්‍යුහය පිරමීඩාකාර ස්වරූපයක් ගන්නා අතර ඉහළින් ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය ද පවතින අතර මහාධිකරණය ද පහළින් ප්‍රාදේශිය අධිකරණ හා ජනතා අධිකරණ ද සහෝදර අධිකරණ යන ආකෘති ද යොදා ගැනේ. හඳුන්වාදෙන නව අධිකරණ ආකෘති මෙසේය.

■ **ජනතා අධිකරණ**

යුක්තිය පසිඳලීම සඳහා නෛතික වෘත්තිකයන්ගෙන් යුත් අධිකරණ මෙන්ම ජනතා අධිකරණ ද පිහිටුවනු ලැබේ. ඒ සෑම අධිකරණයකම විනිශ්චයකාරවරුන් උසුලන්නේ සමාන තත්වයකි. අධිකරණ ක්‍රියාවලිය විනිවිද පෙනෙනසුළු හා ජනතාවට වග කියන ක්‍රියාවලියක් බවට පත් කෙරෙන අතර විනිශ්චයකාරවරුන් නැවත කැඳවීම සඳහා බලය ඔවුන් පත් කළ ව්‍යුහයටම හිමි වේ. පහළ උසාවි ජනතාව විසින් තෝරා ගැනීමේ පදනම හා විෂය ප්‍රවීණත්වයේ පදනම යන පදනම් දෙකෙන්ම තෝරා ගන්නා විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත

වේ. මෙය ජූරි සභාවකට සමාන නැත. ජූරි සභා ක්‍රමයේ දී විනිශ්චයකරුවා සහ ජූරි සභාව වෙනස් ක්ෂේත්‍රවලට අදාළව වෙන වෙනම තීරණ ගනී. මෙම ක්‍රමයේ දී තීරණය නැගෙනුයේ දෙපාර්ශ්වයම එක් වී සාකච්ඡා කිරීමෙනි.

■ **සහෝදර අධිකරණ**

කම්හල්, ගොවිබිම්, සිරගෙවල්, මහල් නිවාස, නාවික යාත්‍රා, විශ්වවිද්‍යාල වැනි ප්‍රජාවන් සඳහා ප්‍රජාව විසින්ම පත් කරනු ලබන සහෝදර අධිකරණ ක්‍රියාත්මක වන අතර මේවායේ බලතල වනුයේ සමථකරණය, ප්‍රසිද්ධියේ අවවාද කිරීම, දෝෂ දර්ශනයට ලක් කිරීම ආදියයි.

■ **බේරුම්කරණ අධිකරණ**

මෙහිදී දෙපාර්ශ්වයෙන්ම තම තමන්ගේ පාර්ශවයෙන් විනිශ්චයකාරවරුන් දෙදෙනෙකු පත්කළ හැකි අතර ඒ දෙදෙනා එක්ව තුන්වැන්නෙකු තෝරා පත්කර ගනී. බේරුම්කරණය සඳහා තීන්දු ලබා දෙන්නේ එම ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයේ බහුතරය විසිනි. බේරුම්කරණ තීරණය ක්‍රියාත්මක කළ හැක්කේ මහා අධිකරණය හරහාය.

■ **ප්‍රතිකාරක මණ්ඩල හා ප්‍රොකියුරේටර් කාර්යාලය**

මෙම ප්‍රතිකාරක මණ්ඩල හරහා පුරවැසියන්ට යම් මහජන නියෝජිතායතනයන්ට හා මහජන

නියෝජිතයන්ට හා රාජ්‍ය නිලධාරීන්ට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගත හැකිය. ඒවා නීතිමය කටයුතු පිළිබඳ රජයට උපදෙස් ලබා ගැනීමට ද මග පෙන්වයි. මහජන අභිචෝදකයාගේ හා රජයේ නීතිඥයාගේ කාර්යය ද ප්‍රතිකාරක මණ්ඩල ඉටු කරයි. ප්‍රොකියුරේටර් ජනරාල්වරයා හා ප්‍රොකියුරේටර් කාර්යාලය යනු නීතිය ක්‍රියාවේ යොදවන කවරම ආකාරයේ විෂමාචාරයක් සඳහා හෝ ජනතාවට විසඳුම් ලබා ගැනීමට ඇති යාන්ත්‍රණයයි.

## ආර්ථිකය, දේශපාලනය, සමාජය, සංස්කෘතිය සහ පරිසරය

ආර්ථික අර්බුදයට අපගේ විසඳුම මූලික වශයෙන් ප්‍රග්ධන සමුච්චගතකරණයේ පරිපථය බිඳ දැමීම සහ සමාජය තුළ පවතින සියලු ආකාරයේ ආර්ථික විෂමතා අහෝසි කිරීම මත පදනම් වෙයි. ඒ අනුව අපට එකී විසඳුමේ පදනම් මූලධර්ම කිහිපයක් සාකච්ඡා කළ හැකිය.

1. සාධාරණත්වය

වත්මන් ආර්ථිකයේ පවතින බරපතළම ප්‍රශ්නය වන ආර්ථික ප්‍රතිලාභ බෙදී යාමේ පවතින අසමානතාව හා අසාධාරණය ඉවත් කළ යුතුය. වත්මන් ආර්ථිකය පදනම් වී තිබෙන්නේ ආර්ථිකයේ ප්‍රතිලාභ නිෂ්පාදනයට දායක වන බහුතර වැඩකරන

ජනතාවට ලබා නොදී වරප්‍රසාද ලත් සුළුතරයක් විසින් ගසා කෑම මතය. වැඩකරන ජනතාව සූරාකෑම උග්‍ර වන අතර ජීවන තත්වය ද පහත වැටේ. ආර්ථිකය තුළ විෂමතාව පවත්වාගෙන යන අතර එම විෂමතාව විලාසිතාවක් බවට පත්කර ඇති ආකල්පය ද පවත්වාගෙන යාමට පාලක පන්තිය කටයුතු කරයි. එය ඉවත් කළ හැක්කේ ආර්ථිකයේ ප්‍රතිලාභ සමානාත්මතාවයේ හා සාධාරණත්වයේ පදනම මත බෙදා හැරීමෙනි. නිෂ්පාදනයේ ඵල නිෂ්පාදකයා සතු කිරීම අපේ ආර්ථික වැඩපිළිවෙළේ ප්‍රධාන අංගයයි. එහි පළමු පියවර වන්නේ එකම ක්ෂේත්‍රය තුළ පවා වර්තමානයේ පවතින උග්‍ර වැටුප් විෂමතාව ක්‍රමානුකූල අඩු කිරීමයි. කිසිසේත්ම පිළිගත නොහැකි මට්ටමේ පවතින අවම වැටුප් මට්ටම් කිහිප ගුණයකින් ඉහළ නැංවීම හදිසි කටයුත්තක් සේ සලකා සිදු කළ යුතුය.

මෙය ආරම්භයේදීම වැඩකරන පංතියේ පහළම කොටස්වල ජීවන තත්වය ඉහළ නැංවීමට හේතු වනු ඇත. ආරම්භක පියවරක් වශයෙන් විවිධ වෘත්තීන් අතර දැනට පවතින අසමාන වැටුප් පරතරය ක්‍රමයෙන් අඩු කරමින් ඕනෑම වැටුප් පරතරයක පදනම පුහුණු ශ්‍රමය හා නුපුහුණු ශ්‍රමය මත පමණක් නිර්ණය වීමට පසුබිම සකස් කළ යුතු අතරම දෙවන පියවරක් වශයෙන් පුහුණු හා නුපුහුණු

වැටුප් පරතරය ද ක්‍රමානුකූලව අවම කරමින් වැටුප් තීරණය කරන ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් කරා ගමන් කළ යුතුව තිබේ. සාමාන්‍ය සේවයන් සඳහා පැය 08ක වැඩ දිනය, කායික ශ්‍රමය බහුලව වැය කරන වෘත්තීන් සඳහා පැය 06ක වැඩ දිනය හා කායික හා මානසික සෞඛ්‍යයට අනතුරුදායක වෘත්තීන් සඳහා පැය 04ක වැඩ දිනය ද සහතික කළ යුතුය.

කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රවලද සුළු පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ ද නියුක්ත ශ්‍රමිකයන්ගේ ආධායම් මට්ටම ඉහළ නැංවීම සඳහා නිෂ්පාදනවලට සහතික මිලක් හදිසි ආපදා සඳහා සමාජ ආරක්ෂණ, සමාජමය සුබසාදන ව්‍යාපෘති වෘත්තීය යෙදවුම් හා උපකරණ සඳහා මිල පාලනයක් ක්‍රියාත්මක කිරීම ආදී වශයෙන් වූ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා වන බදු අහෝසි කිරීම අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය යන සේවාවන් වෙළඳ භාණ්ඩ බවට පත්කිරීම වෙනුවට ඒවා ලාභ මත නොව සමාජ අවශ්‍යතාව මත පදනම් වන සමාජ ආරක්ෂණ සේවාවන් බවට පත්කිරීම ඇතුළු ක්‍රියාමාර්ග හරහා තවදුරටත් විෂමතාව තුරන් කිරීමේ කාර්යය සාර්ථක කරගත හැක.

## 2. ජන සහභාගීත්වය

වත්මන් ආර්ථිකයේ තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් වැඩ කරන ජනතාව ඉවත් කර තිබෙන අතර නිෂ්පාදකයා නිෂ්පාදන ක්‍රියාවලියේ බල අධිකාරීත්වයෙන් ඉවත් කර ඇත. ජන සහභාගී ආර්ථිකයක් ගොඩනැගිය හැක්කේ නිෂ්පාදනයේ තීන්දු තීරණ ගැනීම හා පාලනය වැඩ කරන ජනතාව සතු කිරීමෙනි. එවිට පාරිභෝගික භාණ්ඩ පිළිබඳව පොදු මහ ජනතාව තුළ ගොඩනැගී ඇති මහා අර්චනය හෙවත් වෙළෙඳ භාණ්ඩ අධිවන්දනාව හා එතුළින් නිර්මාණය වී ඇති සිහින පසුපස හඹායාම හා සිහින නිර්මාණය කරමින් පොදු මහ ජනතාව අර්බුදයෙන් අර්බුදයට යවන දෘෂ්ටිවාදය පරාජය කළ හැකි වනු ඇත. වෙළෙඳ භාණ්ඩ තවදුරටත් මහා බලයක් සහිත, තමන්ට ළඟා කරගත නොහැකි සිහිනයක් නොව භෞතික හා ආධ්‍යාත්මික අවශ්‍යතා ඉටුකර දෙන දේවල් වශයෙන් වූ අවබෝධයකට පොදු මහ ජනතාව ගෙන ආ හැකි වන්නේ ජන සහභාගී ආර්ථිකයක් මගින් පමණි.

රට තුළ පවතින මහා පරිමාණ කර්මාන්ත, දැවැන්ත සමාගම්, මහා පරිමාණ ව්‍යවසායයන්, බැර කර්මාන්ත ආදී නිෂ්පාදන මාධ්‍යයන් සමාජ සන්තක කිරීම එවැනි ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ වෙයි. මේ වන විටත් පෞද්ගලික අයිතිය මත

පදනම්ව ධනපතියන් අතළොස්සකගේ සාක්කු පුරවන ධන උල්පත් බවට පත්ව ඇති ආර්ථිකය එහි සැබෑ හිමිකරුවන් වන වැඩ කරන ජනතාව සතු කළ යුතුය. එහි දී ක්‍රමිකව සාමූහික දේපළ ක්‍රමය ආදේශ කිරීම අවශ්‍ය වන අතර සංක්‍රමණික කාල පරිච්ඡේදයක් තුළ රාජ්‍ය දේපළ පුළුල් කිරීම හරහා රාජ්‍යයේ මැදිහත් වීම ද සිදු කරනු ඇත. මෙය දැනට සිදුවන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකකරණය කිරීමේ නව ලිබරල් ධනවාදී උපායමාර්ගයෙන් සම්පූර්ණයෙන් පරස්පර වන අතර සියලු නිෂ්පාදන මාධ්‍යයන් රජය සතු කිරීම නමින් දේශපාලන බලධාරීන් අතළොස්සක් අතට පත් කෙරෙන රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයට ද වෙනස් එකකි. නිෂ්පාදන ක්‍රියාවලිය, එහි ඉලක්ක, ගුණාත්මක භාවය ආදිය තීරණය කිරීමේ හා පාලනය කිරීමේ අයිතිය වැඩකරන ජනතාවට ලබාදීම මගින් නිෂ්පාදනය හා නිෂ්පාදකයා අතර ඓන්ද්‍රීය සම්බන්ධතාවය තහවුරු කෙරෙනු ඇත.

### 3. සැබෑ වටිනාකම් උත්පාදනය

ආර්ථික විෂමතාව සහ සූරාකෑම අහෝසි කිරීමේ අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් වන්නේ හිඟකම අහෝසි කිරීමයි. ඒ සඳහා නිෂ්පාදනයේ දැවැන්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් අවශ්‍ය වේ. ඒ සඳහා මූල්‍ය සේවාවන්ට අදාළ ක්ෂේත්‍ර

පමණක් ප්‍රසාරණය කරන එනයින් නිෂ්පාදනීය ක්ෂේත්‍ර සහ අනෙකුත් සේවාවන් අතර සමතුළනය අඛණ්ඩව බිඳ දමමින් ආර්ථිකයේ නෛසර්ගික අර්බුදයට මගපාදන, ධනේශ්වර පන්තියට පමණක් සීමා වූ බැර කර්මාන්තය නිෂ්පාදනය හා පොදු ජනතාවයේ දෛනික අවශ්‍යතාවන් උදෙසා නිෂ්පාදනය කරන පාරිභෝගික භාණ්ඩ අතර සමතුලනය නිරන්තරයෙන් බිඳ දමන වත්මන් නව ලිබරල් උපායමාර්ගයන්ගෙන් වෙනස් වූ නිෂ්පාදනය සහ නිෂ්පාදනය සමඟ සෘජුව සහ වක්‍රව සම්බන්ධ සේවා වර්ධනය මූලික කරගත් ආර්ථික වැඩපිළිවෙළක් අවශ්‍ය වේ. ධනවාදයේ නිදහස් තරගයේ අවධිය, අධිරාජ්‍යවාදය දක්වා පරිවර්තනය වීමේ දී සිදු වූ මූලික වෙනස නම් මූල්‍ය ප්‍රාග්ධනය වේගවත්ව ඉදිරියට ඒම සහ එමගින් ලෝක දේශපාලන බලාධිපත්‍යය අධිරාජ්‍යවාදීන් සතු කර ගැනීමට පසුබිම සැකසීමයි.

ප්‍රාග්ධනය සැබෑ ලෙස ප්‍රසාරණය වන්නේ මූලික වශයෙන් නිෂ්පාදන ක්ෂේත්‍ර තුළ සැරිසරමින් අතිරික්ත වටිනාකම් උකහා ගැනීම හරහාය. මෙය ප්‍රාග්ධනයේ ප්‍රධානතම ස්වරූපය වන කාර්මික හා අනෙකුත් නිෂ්පාදනීය ප්‍රාග්ධනයට සෘජු වශයෙන් ද, වාණිජ ප්‍රාග්ධනයට හා බැංකු ප්‍රාග්ධනයට වක්‍ර ලෙස ද අදාළ වේ. ඒ නිසා මූල්‍ය ප්‍රාග්ධනය පැතිරෙන්නේ

අතිරික්ත වටිනාකම් සෘජුව හා එනයින්ම නිර්මාණය නොකරන ක්ෂේත්‍රයකය. එය අතිරික්ත වටිනාකම් නිර්මාණය කිරීමේ කර්තව්‍යයට සම්බන්ධ වන්නේ වක්‍ර ලෙසය. ආර්ථිකයක නිෂ්පාදනීය ශ්‍රම ක්ෂේත්‍රය හා නිෂ්පාදනීය නොවන ශ්‍රම ක්ෂේත්‍රය අතර අනිවාර්ය සමතුළිතයක් පැවතිය යුතුය.

නව ලිබරල් ධනවාදී උපායමාර්ගය තුළ මෙම සමතුළිතය වේගයෙන් බිඳී යන අතර, මූල්‍ය ප්‍රාග්ධනයේ අතිවිශාලම කොටස යොදවන්නේ මූල්‍ය සමපේක්ෂණ ක්ෂේත්‍රවලය. එය ප්‍රධාන වශයෙන්ම යළි ප්‍රසාරණය කරන්නේ ආර්ථිකයේ නිෂ්පාදනීය නොවන ක්ෂේත්‍රයයි. එය මාක්ස් හඳුන්වන්නේ අතත්‍ය ප්‍රාග්ධනය හෙවත් නිෂ්පාදනීය වටිනාකම් එනයින් උත්පාදනය නොකරමින් මූල්‍ය ප්‍රාග්ධනයම නැවත නැවතත් වර්ධනය කරන ප්‍රාග්ධනයක් ලෙසිනි. ආරම්භක පැයේ දී මේ බුබුළු ආර්ථිකය තාවකාලික මායාකාරී වර්ධනයක් පෙන්නුම් කළ ද එය තාවකාලික හා ඉක්මනින්ම නැවතත් ආර්ථිකයේ අර්බුදයක්ම නැවත කැඳවනු ඇත. එබැවින් බුබුළු ආර්ථිකයට විකල්පය ලෙස ගොඩනැගිය යුතුව ඇත්තේ සැබෑ වටිනාකම් උත්පාදනය කෙරෙන නිෂ්පාදන හා සේවාවලට ප්‍රමුඛත්වය දෙන ආර්ථිකයකි. එය රටක් ලෙස ආහාර සුරක්ෂිතතාව ද, බලශක්ති ස්වෛරීත්වය

ආදී වශයෙන් අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් ආර්ථිකය නිදහස් කර ගැනීමට අවශ්‍ය තත්වයන් ද නිර්මාණය කරයි. ඒ අනුව අප යෝජනා කරන ආර්ථික විකල්පය අධිරාජ්‍යවාදී මූල්‍ය ප්‍රාග්ධනයට ආයාචනා කරමින් එහි ඉඳුල්වලින් සංවර්ධනයක් අත්පත් කර ගැනීමේත් අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවල ණය මත යැපීමේත් ආර්ථික උපායමාර්ගයට මුළුමනින්ම පරස්පර නිෂ්පාදන සහ සේවාවල ගුණාත්මක සහ ප්‍රමාණාත්මක වර්ධනයක් හරහා සමාජ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමුඛත්වය ලබාදෙන විකල්පයකි. එය මුළුමනින්ම ජාතික ආර්ථිකයක කොටු පවුරු තුළට පමණක් සීමා වීමක් නොවන නමුත් විදේශ වෙළෙඳාමේදී සහ ජාත්‍යන්තර ආර්ථික කටයුතුවලදී මූල්‍ය සමපේක්ෂණය, අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවල ආර්ථික හා දේශපාලන ඒකාධිකාරයෙන් මිදීම, දේශීය ආර්ථිකයේ ආරක්ෂාව පදනම් කර ගනිමින් ජාත්‍යන්තර ආර්ථිකයන් හා සමාන ලෙසත් සාධාරණ ලෙසත් කටයුතු කිරීම අරමුණු කරගත්තකි.

## 4. සැලසුම්සහගතභාවය

ධනවාදී නිෂ්පාදනයේ මෙහෙයුම් යාන්ත්‍රණය වන්නේ ප්‍රාග්ධනය ගොඩගැසීම සඳහා වන තරගයයි. නිෂ්පාදනයේ අරමුණ ධනපතියාට ලාභ ගොඩගැසීම මිස සමාජමය අවශ්‍යතා තෘප්ත කිරීම නොවේ. සෑම ධනපතියෙකුම ලාභ වැඩිකර ගැනීමට

උත්සාහ කරන අතර, සටන් පාඨය වන්නේ 'වැඩි ලාභ' 'ඉක්මන් ලාභ' 'පහසුවෙන් ලාභ' ඉපයීමය. ධනවාදයේ ප්‍රධාන තර්කණය වන්නේ ප්‍රාග්ධනය නිරන්තර ප්‍රති නිෂ්පාදන ක්‍රියාවලියක පැවතීමයි. ඒ සඳහා එක් එක් ධනපතියා වෙළඳපොළෙන් විශාල කොටසක් තමා සතු කරගත යුතු අතර, වැඩියෙන් නිෂ්පාදනය කරමින් වැඩියෙන් විකිණිය යුතුය. ක්‍රියාවලිය බාධාවකින් තොරව ඉදිරියට ගෙන යාමට නම් වැඩකරන ජනතාවගෙන් වැඩි වැඩියෙන් උදුරාගත යුතුව තිබෙනවා මෙන්ම වැඩකරන ජනතාව තුළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා වන ක්‍රය ශක්තිය ද පවත්වා ගත යුතුය. මෙය පරස්පර විරෝධීය.

එමෙන්ම ධනේශ්වර නිෂ්පාදනයේ දී නිරන්තරව ලාභ සහතික කර ගැනීමට නම් නිෂ්පාදන මාධ්‍යයත් නිශ්පාදයත්, පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයත් අතර නිශ්චිත සමානුපාතයක් පවත්වාගත යුතුය. ඒ සමඟම පොදුවේ ධනේශ්වර නිෂ්පාදනයේදී අඛණ්ඩව වර්ධනය වන ලාභ රේට්ටු සකසා ගැනීමට නම් ස්ථාවර සහ විචල්‍ය ප්‍රාග්ධනය අතර නිශ්චිත සමානුපාතයක් පවත්වා ගත යුතුය. එහෙත් ධනවාදී නිෂ්පාදනයේ ඓතිහාසික අර්බුද වකවානු සියල්ල විසින් ඉදිරිපත් කර ඇති යථාර්ථය වන්නේ ධනපති පන්තිය සිය ලාභ රේට්ටු වැඩි

කර ගැනීමට දරන උත්සාහය විසින් එනයින්ම ලාභ රේට්ටු බිඳ වැටීමට පදනම සකස් කර ඇති බවයි. මේ ලාභ රේට්ටු වර්ධනය කිරීමට දරන වියරු උත්සාහය විසින් ධනේශ්වර නිෂ්පාදනයේ නිෂ්පාදනීය හා නිෂ්පාදනීය නොවන අංශ අතර පවත්වාගත යුතු සමතුලිතය අඛණ්ඩව බිඳ වැටෙන අතර එකම කර්මාන්තය තුළත් විවිධ කර්මාන්ත අතරත් මේ වියරු තරගය විසින් නැවත නැවතත් සමස්ත ආර්ථිකයම අර්බුදයෙන් අර්බුදයට යාම ධනේශ්වර ආර්ථිකයේ ස්වභාව නිරූපී ලක්ෂණයක් බවට පත් වී ඇත.

තනි තනි ධනපතියන් ක්‍රියාත්මක වන්නේ පෞද්ගලිකව තමන්ට වැඩි වැඩියෙන් ලාභ හිමිකර ගැනීමේ අරමුණෙනි. ඒ වෙනුවෙන් ඔවුන් එකිනෙකා අතර මාරාන්තික තරගයක් ද ඇත. මෙම තරගය විසින් අරාජිකත්වයක් නිර්මාණය කරයි. පෞද්ගලික ලාභ ඉපයීම සඳහා වන ධනවාදී තරගය මත පදනම් වූ නිෂ්පාදනය අවිධිමත්ය. ව්‍යාකූලය. එය වර්ධනය වන්නේ නිෂ්පාදනයේ විවිධ අංශ අතර තිබිය යුතු සමානුපාතයන් කඩා බිඳ දමමිනි. මෙය නිෂ්පාදන අරාජිකත්වයක් බිහි කරයි. වරින් වර ලෝක ආර්ථික අවපාත පැනනැගීමේත් ඒ හැම අවපාතයක්ම කලින් අවපාතයට වඩා ගැඹුරු හා කල් පවතින බවට පත්වීමේ මූල හේතුව

ධනවාදයේම ජාති ලක්ෂණය වන තරඟය හා අරාජිකත්වයයි. අර්බුදයට පිළිතුරු සෙවීම සඳහා සැලසුම්සහගත ආර්ථිකයක් ගොඩනගා ආර්ථිකය පාලනය කළ යුතුය. මෙසේ සැලසුම් කිරීම යනු යම් සර්ව බලධාරී ආයතනයක් විසින් සියල්ල පාලනය කිරීම නොව අර්බුද මඟහැරෙන ආකාරයෙන් සිදු කෙරෙන සැලසුම්කරණයකි. එම සැලැස්ම නිර්මාණය කෙරෙන්නේ වැඩකරන ජනතාවගේ සහභාගී ක්‍රියාවලියක් හරහා වන අතර ක්‍රියාත්මක කෙරෙන්නේ මධ්‍යගත සැලසුමක ස්වරූපයෙනි. එනම් නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මධ්‍යගත කිරීමකි. එවිට තරගය ඇත්තේ අනෙකා පරයා වැඩි ලාභ ඉපයීම සඳහා නොව නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම සඳහාය. සමාජයේ සෑම අයෙකුටම එම නිශ්පාදිතයන් වෙත වන ප්‍රවේශය පහසු කරලීම සඳහාය. එය ධනවාදී තරගය මෙන් අරාජිකත්වයක් ජනිත නොකරනවා පමණක් නොව එහි ප්‍රතිපත්තියක් ලෙස අරාජිකත්වයක් ඇතිවීම වළක්වාලයි.

**05. සමාජ අවශ්‍යතා සම්පූර්ණ කිරීම**

වර්තමානයේ පවතින ලාභ පාදක ආර්ථිකය වෙනුවට සමාජ පාදක ආර්ථිකයක් ගොඩනැගීම අර්බුදයට විසඳුම් දීමේ දී අත්‍යවශ්‍ය සාධකයකි. ධනේශ්වර ක්‍රමයේ දී නිෂ්පාදනය සඳහා ජවය

හා ඉලක්කය සපයන්නේ සමාජමය අවශ්‍යතාව නොව ලාභයයි. භාණ්ඩ නිෂ්පාදනයේ දී ඉලක්ක කර ගන්නේ සමාජය නොව වෙළෙඳපොලයි. ධනේශ්වර නිෂ්පාදනය හා බෙදාහැරීම පරිභෝජන ක්‍රියාවලිය තුළ මිනිසුන් අතුරුදන් වී යන අතර දෘශ්‍යමාන වන්නේ වෙළෙඳපොළක් පමණි. මිනිසා වෙළෙඳපොළ තුළ ආධිපත්‍ය දරමින් එය තමන්ට අවශ්‍ය ලෙස හසුරුවනවා වෙනුවට වෙළඳපොළ තුළ සංසරණය වන විවිධාකාර වෙළෙඳභාණ්ඩ මිනිසා මත අධිපත්‍යය පතුරවමින් මහා බලයක් බවට පත්ව ඇත. ඒ නිසාම පොදු ජන සමාජය සියලුම වෙළෙඳ භාණ්ඩවලට වන්දනාමාන කරන තත්වයක් නිර්මාණය වී වෙළෙඳභාණ්ඩ අධිවන්දනාවක් නිර්මාණය වී ඇත. අනෙක් අතට මිනිස් අවශ්‍යතාව ඉක්මවා ලාභය අරමුණු කරගනිමින් පමණක් සිදුකරන මේ ධනේශ්වර නිෂ්පාදනය හේතුවෙන් ඒවා පරිභෝජනය කරන්නන්ගේ ශරීර සෞඛ්‍යයට, මානසිකත්වයට, සමාජීය සංස්කෘතියට හෝ පරිසරයට සිදුවන හානිය අදාළ නොවන දෙයක් බවට පත්ව යයි.

මීට අමතරව බොහෝ දේ නිපදවන්නේ අවශ්‍යතා තෘප්ත කිරීමට නොව ලාභය වෙනුවෙන් නිෂ්පාදනය කරන අතර ඒවා විකුණා ගැනීම වෙනුවෙන් කෘත්‍රිමව අවශ්‍යතා නිර්මාණය කර ගැනේ.

ආර්ථිකයේ මෙම තත්වයන් වෙනස්කර ආර්ථිකය සමාජමය යහපැවැත්ම ඉලක්ක කරගත් එකක් බවට පත්කළ යුතුය. එවැනි ආර්ථිකයට ඉලක්කය ලාභය නොව සමාජමය අවශ්‍යතා සම්පූර්ණ කිරීමයි. ඒ තුළ නිෂ්පාදනය කෙරෙන්නේ සමාජීය අවශ්‍යතා මුල් කරගෙනය. ලාභය වෙනුවෙන් කෘත්‍රිමව අවශ්‍යතා නිර්මාණය කිරීම අත්හිටවනු ඇති අතර සමාජීය සංවර්ධනය අරමුණු කර ගනිමින් නිර්මාණය වන විවිධාකාර වූ නව අවශ්‍යතාව නිෂ්පාදනයේ පදනම බවට පත්වනු ඇත. අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි සමාජමය සේවාවන්ගේ ලාභ වෙනුවෙන් වෙළෙඳපොළකරණය කිරීම නතර කර ඒවා නිදහස් සමාජ ආරක්ෂණ සේවාවන් බවට පත් කෙරෙනු ඇත.

ධනේශ්වර ආර්ථික න්‍යායන්ට අනුව හා වර්තමානයේ ජනප්‍රිය ආර්ථික චින්තනයන්ට අනුව ධනවාදය තුළ හුවමාරු භාණ්ඩවල ගුණාත්මක භාවය 'තරගය' හේතුවෙන් නිර්මාණය වන බවත් සැලසුම්සහගත ආර්ථිකයක් තුළදී මෙම තරඟය අහෝසි වී භාණ්ඩවල ගුණාත්මකභාවය බිඳවැටී එකතැන පල් වීමේ තත්වයක් පෙන්නුම් කරන බවත් අවධාරණය කරයි. මෙයට උදාහරණ පැරණි සෝවියට් දේශය ප්‍රමුඛ පැවති සමාජවාදී රාජ්‍ය පද්ධතියෙන් නිරන්තරයෙන්ම ගෙනහැර දක්වයි.

නමුත් සැලසුම්සහගත ආර්ථිකය තුළ අඛණ්ඩව සාමූහිකවාදී නිෂ්පාදනය තුළ පවත්වාගත යුතු, භාණ්ඩවලට වැඩි මූල්‍ය වටිනාකමක් ලබා ගැනීම සඳහා නොවන එහෙත් එහි ගුණාත්මකභාවය ඉහළ දැමීම පමණක් අරමුණු කරගන්නා ජනනාත්මක තරඟය, රාජ්‍යයේ මැදිහත්වීමෙන් හා අනෙකුත් කළමනාකරණ ව්‍යුහයන් විසින් අඛණ්ඩව සංවිධානය කොට පවත්වා ගත යුතුය. නිෂ්පාදනයේ ජාතික මට්ටමේ දී පමණක් නොව ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ද මෙම පදනම් ආරක්ෂා වන අයුරින් කටයුතු කළ යුතුය.

## 06. පරිසරය කෙරෙහි වගවීම

නිෂ්පාදන ක්‍රියාවලියේ දී මිනිසා පරිසරය වෙනස් කරන නමුදු මිනිස් සමාජය සහ පරිසරය අතර සතුරු ප්‍රතිවිරෝධයක් නොවේ. ධනවාදය තුළ ලාභ පමණක් ඉලක්ක කරගත් ආර්ථික ක්‍රියාවලිය විසින් පරිසරයට දැවැන්ත විනාශයක් සිදුකර ඇත. අඛණ්ඩව විනාශයක් සිදු කරමින් සිටී. ධනේශ්වර සංවර්ධනය මහා ජයග්‍රහණයක් ලෙස හුවා දැක්වූවද ඉක්මනින් හෝ කල්ගත වී එම ජයග්‍රහණ ව්‍යාජ ඒවා බවත්, ඒවා වෙනුවෙන් පරිසරයට කළ හානියට ස්වභාවධර්මය විසින් කිහිප ගුණයක වන්දියක් අය කරගෙන ඇති බවත් නිතරම දැක ගන්නට ලැබේ.

මේ වන විට පාරිසරික සංහාරය මිනිස් ජීවිත

බිලිගන්නා හා සමාජමය බේදවාචක නිර්මාණය කරන ව්‍යසනයක් බවට පත් වී ඇත. ඊට එරෙහිව ආර්ථික විකල්පය නිශ්චිතවම පදනම් විය යුත්තේ පරිසර හිතකාමී ප්‍රතිපත්තියක් මතය. පරිභෝජනවාදී උන්මාදයක් උත්කර්ෂයට නංවන සංස්කෘතිය වෙනුවට ස්වාභාවික පරිසරයේ දිගුකාලීන පැවැත්ම සහ අනාගත පරම්පරාවන්ට ස්වාභාවික දායාදයන් උරුමකර දීම පිළිබඳ වගකීම් සහගතභාවය සහිත ආර්ථික වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම තුළින් ඊට විසඳුම් සෙවිය හැකි වනු ඇත.

## 07. අධිරාජ්‍යවාදී වියගසෙන් මිදුනු ආර්ථිකයක්

මේ වන විට ලංකාව ඇතුළු පරිවාරයේ රටවල ආර්ථිකය අධිරාජ්‍යවාදී මූල්‍ය සංවිධානවල ණය උගුලට හසුව තිබෙන අතර එම ණය සමග කොන්දේසිවලින් ආර්ථිකය තවදුරටත් අධිරාජ්‍යවාදී නව ලිබරල් උගුලේ සිර කරනු ලබයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව විසින් පනවන ණය කොන්දේසි පිළිබඳ අත්දැකීම් ලංකාවට දුලබ නැත. වත්මන් පාලකයන් මූල්‍ය අරමුදලේ කොන්දේසි රටේ පොදු නීතිය බවට පත් කිරීමට ද අණ පනත් රැගෙන විත් ඇත.

එමෙන්ම ලෝක වෙළෙඳ සංවිධානය වැනි අධිරාජ්‍යවාදී සංවිධාන ජාත්‍යන්තර වෙළඳාම ගෝලීය ප්‍රාග්ධන උවමනාවන්ට සහ ඒකාධිකාරවල

ලාභ අරමුණුවලට අනුව මෙහෙයවයි. සමාජවාදයේ ප්‍රධාන කර්තව්‍යයක් වන්නේ මේ විය ගසෙන් ආර්ථිකය මුදා ගැනීමයි. මේ අයුක්තිසහගත ලෝක ක්‍රමය සාධාරණීකකරණය කරනු ලබන්නේ ගෝලීයකරණයේ නාමයෙනි.

ආර්ථිකය පිළිබඳ ක්ෂේත්‍රයේ දී ද අප ජාතිකවාදී පටු සීමා තුළ සිරවී සිටින්නේ නැති නමුදු සමාජවාදී ආර්ථිකයක් ලෝකය සමග සම්බන්ධ වන්නේ ප්‍රාග්ධනය ගෝලීයකරණයේ දෘෂ්ටිකෝණයෙන් නොව නිර්ධන පන්ති ජාත්‍යන්තරවාදයේ පදනමිනි. ණය උගුලෙන් ගැලවීම සඳහා තව දුරටත් ණය ගැනීම මතම විසඳුම් සෙවීම වෙනුවට අසාධාරණ හා අයුක්ති සහගත කොන්දේසි මත රැගෙන ඇති ණය හා පාලකයන්ගේ අදූරදර්ශි ප්‍රථඵල විරහිත ව්‍යාපෘති සඳහා ගත් ණය ද පාලකයන් විසින් කොල්ලකෑම හා ගසාකෑම සඳහා යොදාගත් ණයද නොගෙවා සිටීම සඳහා වන තෙරපුමට ජාත්‍යන්තරව සහය දිනා ගැනීමට කටයුතු කරනු ඇත.

ඒ අනුව අධිරාජ්‍යවාදී ලෝක පද්ධතිය මගින් අසාධාරණ කොන්දේසි මත පදනම් කර ඇති ජාත්‍යන්තර වෙළඳාම සාධාරණ සහ සමානාත්මතා පදනමට ගෙන ඒම සඳහා ලෝක පරිමාණයෙන් ප්‍රගතිශීලි රාජ්‍යයන් සහ ලොව පුරා සුළු නිෂ්පාදකයන්ගේ සාමූහිකයන් එක්කර

ගත් නව ආර්ථික සහයෝගීතාවක් ක්‍රියාත්මක කරනු ඇත. ආර්ථිකය ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි අධිරාජ්‍යවාදී මූල්‍යායතනවල ග්‍රහණයෙන් මුදා ගැනීමටත්, වඩා සාධාරණ පදනමක් යටතේ ලෝකය සමග ගනුදෙනු කිරීමටත් අවස්ථාව විවර කරගනු ඇත. බහුජාතික සමාගම් ඇතුළු ඒකාධිකාරවල ග්‍රහණයෙන් මුදා ගැනීම සඳහා විකල්ප සකස් කෙරෙනු ඇත. අධිරාජ්‍යවාදී බලවතුන්ගේ සහ ගෝලීය ප්‍රාග්ධනයේ බලපෑම්වලට ආවරණයක් ලෙස ආහාර සුරක්ෂිතතාව, බලශක්ති ස්වෛරීත්වය ආදියට සමාජවාදී ආර්ථිකයක් තුළ ප්‍රමුඛතාව දෙනු ඇත.

වත්මන් ධනේශ්වර ආර්ථික උපාය මාර්ගය එලෙසම පවතින අතරම වංචා දූෂණ නැති කිරීම, ධනපතියන් සූරාකෑමේ අවස්ථා සහතික කිරීම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, නාස්තිය අවම කිරීම වැනි පැලැස්තර යෝජනා කිරීම් වෙනුවට වත්මන් ආර්ථිකයේ පදනම්වලට සහමුලින්ම ප්‍රතිපක්ෂ ප්‍රතිපත්ති මත පදනම් වූ ආර්ථිකයක් නිර්මාණය කළ යුතුය. ඒ නිසා අප පෙනී සිටින්නේ වත්මන් කොල්ලකාරී ආර්ථිකයට ආදේශයක් නිර්මාණය කිරීම වෙනුවෙන් නොව එයට විකල්පයක් නිර්මාණය කිරීම වෙනුවෙනි.

එය නිෂ්පාදනයේ ඵල සාධාරණ ලෙස

බෙදා හැරීම, වැඩ කරන ජනතාව තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී කර ගැනීම, මූල්‍ය සේවාවන් වෙනුවට සැබෑ වටිනාකම් උත්පාදන ක්ෂේත්‍රයේ වර්ධනය ඉලක්ක කර ගැනීම, අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් ආර්ථිකය නිදහස් කර ගැනීම, සැලසුම්සහගතබව, ලාභය වෙනුවට සමාජමය අවශ්‍යතාවලට ප්‍රමුඛතාව ලබා දීම, පරිසරය පිළිබඳ වගකීම්සහගත බව යන ලක්ෂණවලින් සමන්විත ආර්ථික විකල්පයකි.

එම මූලධර්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේදී මහා පරිමාණ නිෂ්පාදනයන්ගේ අයිතිය සමාජය සතු කිරීම, සමාජයීය අවශ්‍යතාවන්ට අනුව මහා පරිමාණ නිෂ්පාදනයන්ගේ නව ක්ෂේත්‍ර ආරම්භ කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ දේපළවල අයිතිය ක්‍රමිකව පොදු හා සාධාරණ දේපළ ක්‍රමයකට අවශෝෂණය කර ගැනීම, අධිරාජ්‍යවාදී බහුජාතික සමාගම්වලට අනුව හැසිරෙන ආර්ථිකයක් වෙනුවට පොදු මහජනතාවගේ අවශ්‍යතාවන් මූලික කරගත් ආර්ථිකයක් නිර්මාණය කර ගැනීම, ජාත්‍යන්තර කටයුතුවල දී ඒකාධිකාරයන්ට පොදු මහජනතාව ගොදුරු නොවන ආකාරයෙන් ආර්ථික ප්‍රතිපත්ති නිර්මාණය කිරීම, ජාත්‍යන්තර ආර්ථික හා මූල්‍ය සංවිධාන සමග ද ඉහත ප්‍රතිපත්තීන් මත පදනම් වූ එකඟතාවයන්ට අනුව කටයුතු

කිරීම, වැටුප් විෂමතා අවම මට්ටමකට ගෙන ඒම, සැලසුම්සහගත ආර්ථික ක්‍රමයක් ඇති කිරීම, පොදු ජන වුවමනාවන් වර්ධනය කරමින් ලාභය වෙනුවට පොදුජන අවශ්‍යතාව පෙරට ගැනීම, ඒ සඳහා නිෂ්පාදකයන් අතර දැන් පවතින මාරාන්තික තරගය වෙනුවට පොදු ජන උවමනාවන් හැකි උපරිම වශයෙන් සපුරාලීමේ තෘප්තිමත් කිරීමේ තරඟ සංවිධානය කිරීම, එමගින් පරිභෝජනය කරන භාණ්ඩවල හා සේවාවල ප්‍රයෝජනවත් භාවය හා ගුණාත්මක භාවය ඉහළ දැමීම, සමහර භාණ්ඩ හා සේවා කෙරෙහි වත්මන් සමාජය තුළ ආරෝපණය කොට ඇති අසීමිත බලය අහෝසි කරමින් ඒවා ඉදිරියේ වැඳ වැටෙන ස්වභාවය ඉවත් කිරීමට කටයුතු කිරීම, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් පහළට ගෙන ඒම මගින් සමාජයේ සෑම සාමාජිකයෙකුටම ඒවා ලබා ගැනීම පහසු කරලීම, පීඩාකාරී ශ්‍රම විභජනය තුරන් කිරීම, තමන් කැමති ආර්ථික ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍රයන්හි නියැළීම සඳහා අවශ්‍ය නිදහස හා පුහුණුව තහවුරු කිරීම, නිෂ්පාදනයේ තීන්දු තීරණ වැඩ කරන ජනතාව සෘජුවම සම්බන්ධ කරගැනීම මගින් නිෂ්පාදනය ප්‍රතිසංවිධානය කිරීම, ශ්‍රම දිනයේ කාලය හැකිතාක් අවම මට්ටමකට ගෙන ඒම මගින් පවුල් කටයුතු හා සමාජයීය කටයුතු සඳහා යෙදීමට ඇති කාලය

ඉහළ දමා ගැනීම හා එමගින් තෘප්තිමත් මිනිසෙක් හා සමාජයක් නිර්මාණය කිරීම, ඇතුළු බොහෝ පියවර සංයුක්ත කරගනු ඇත.

මෙවැනි ලක්ෂණ සහිත ආර්ථිකයක් අප 'සමාජවාදය' ලෙස හඳුන්වන අතර වත්මන් අර්බුදයට අපගේ වැඩපිළිවෙළ වන්නේ ධනේශ්වර ආර්ථිකය සමාජවාදී ආර්ථිකයක් හරහා ප්‍රතිස්ථාපනය කොට ප්‍රාග්ධනයේ පරිපථය ක්‍රමානුකූලව බිඳ දැමීම හා ප්‍රාග්ධනයේ ආක්‍රමණය පරාජය කිරීමයි.

ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව, පිරිසිදු පානීය ජලය, නිවාස, සනීපාරක්ෂක පහසුකම්, ඇඳුම්, සෞඛ්‍ය පහසුකම් ආදී මූලික භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිළිබඳ වගකීම රජය විසින් භාර ගන්නා, ඒ සඳහා වන සමාජ ආරක්ෂණ සේවාවන් තහවුරු කෙරෙන ප්‍රතිපත්තියක් මගින් වැඩකරන ජනතාව ජීවිතයේ භෞතික අවශ්‍යතාවලට මෙන්ම අධ්‍යාපනය, කලාව, ක්‍රීඩාව, දාර්ශනික සංවාද දේශපාලන ආදී මානව සංස්කෘතියේ උරුමයන්ට ද අස්වාමික වීම වළක්වාගත හැක. වර්තමානයේ සමාජය මුහුණ දී තිබෙන ආතතිය, අතෘප්තිය, අසහනකාරීත්වය, පරාරෝපණය සඳහා විසඳුම් සෙවීමේ පදනම එයයි.

වත්මන් සමාජයේ විනාශකාරී අත්දැකීම් ලෙස පවතින අපරාධ, මත්ද්‍රව්‍ය උවදුර, සිය දිවි

නසාගැනීම් මානසික අවපීඩනය, ප්‍රචණ්ඩත්වය ආදී බොහෝ ගැටළු මේ ආතතිය සමඟ බැඳී තිබෙන අතර එම සමාජීය-ආර්ථික තත්වයන් සමඟ බැඳී තිබේ. මෙම මිනිස් විෂයේ සමකාලීන අර්බුදය එයට හේතු වී තිබෙන සමාජ ආර්ථික කොන්දේසි අහෝසි කිරීමෙන් පමණක් ස්වයංව අහෝසි නොවන අතර ඒ සඳහා සමාජ විඥානය වෙනස් කිරීමේ දැවැන්ත මෙහෙයුමක් ද අවශ්‍ය වේ.

මෙම අර්බුදයට විසඳුම වන්නේ සමාජ ආර්ථික කොන්දේසි පමණක් නොව සමාජයේ ආකල්ප, ආචාර ධර්ම, සෞන්දර්ය චින්තනය, දැනුම් සංස්කෘතිය ජීවන දර්ශනය සහ ජීවන පැවැත්මේ බහුතර අංග විප්ලවීය ලෙස පරිවර්තනයකට භාජනය කිරීමයි.

එබැවින් වත්මන් සමාජ අර්බුදය විසඳීමට අපට ඇති වැඩපිළිවෙළ සමස්ත සමාජයටම සුසමාදර්ශී වෙනසකට භාජනය කරන සමාජවාදී සමාජ පරිවර්තනයකි. එනම් සමාජ සමානාත්මතාව-සහෝදරත්වය-සමාජ සාධාරණත්වය-යුක්තිය සහ සාමූහිකත්වය මත පදනම්ව සමාජය සංවිධානය කිරීමයි. මිනිස් සම්බන්ධතාවල සමාජමය ආකල්පවල, ජීවන දර්ශනය මත ආචාරධාර්මික ඇගයුම් පද්ධතිවල දැවැන්ත පරිවර්තනයක් සනිටුහන් කරවන නව ආකාරයේ සමාජ ජීවිතයකි.

## කෘෂිකර්මාන්තය

කෘෂිකර්මාන්තයේත් සත්ව පාලනයේත් ධිවර කර්මාන්තයේත් මූලික ප්‍රමුඛතාවය ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට කටයුතු කිරීමය.

- ඉඩම්, ජලය, බීජ, පොහොර හා කෘෂි රසායන යන මූලික කෘෂි යෙදවුම් මෙන්ම කෘෂි උපකරණ හා පසු අස්වනු ක්‍රියාවලිය මත බලපවත්වනා ඒකාධිකාරයන් ගොඩනගාගෙන ඇති දේශීය හා බහුජාතික සමාගම් පලවා හැර තම ශ්‍රමයේ නිසි ඵල ලබන්නට හැකි වන ලෙස ගොවි ජනතාවගේ අයිතිය තහවුරු කරනු ලැබේ.
- ගොවි ජනතාවගේ ආදායම් සුරක්ෂිත කිරීමට සහතික මිල ක්‍රමයක් හා අස්වනු මත දිරි දීමනා ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කරනු ඇත. කුමන ආකාරයෙන් හෝ සිදුවන වගා හානි අවම කිරීමට විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන අතර හානිපූර්ණය සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීමටත් කටයුතු කරනු ලැබේ.
- සාධාරණ හා සමානාත්මතා පදනමින් ගොවි

ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කරනු ලැබේ.

- ආහාර සුරක්ෂිතතාව තහවුරු කර ගනිමින් පරිසර හිතකාමී කෘෂි ප්‍රතිපත්තියක් තහවුරු කිරීම සඳහා ද ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා ද ගොවි ජනතාව සමග පුළුල් ප්‍රජා අධ්‍යාපන ක්‍රමවේදයකට ප්‍රවේශ වෙනු ඇත.

## විදෙස් ප්‍රතිපත්තිය

වර්තමානය වනවිට ලෝකයේ විවිධ අධිරාජ්‍යවාදී බල කේන්ද්‍රයන් අතර ඉතිහාසයේ කවරදාටත් වඩා වර්ධනය වී ඇති අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධයන්ගේ ගොදුරු බවට දුබල සහ පරිධියේ පසුගාමී රටවල් පත්ව ඇත. විශාල ප්‍රතිවිරෝධතාවකින් ද විශේෂ සමීප බවකින් ද තොරව විටෙක ඉන්දියාවත් විටෙක චීනයත් විටෙක ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ යුරෝපා රාජ්‍යයන්ට අනුවත් නැටවෙන රූකඩයක් ලෙස නව ලිබරල් උපායමාර්ග කරපින්නා ගත් පසුගිය පාලකයන් හඳුනාගත හැක. පෙර කිසි කලෙකත් නොවූ විරූ ආකාරයෙන් ඉන්දියන් ආර්ථික හා දේශපාලන බලහත්කාරය ලාංකේය භූමිය මත කඩා වැදෙමින් තිබේ. මෝඩිගේ පසුබැස්ම විසින් හින්දුත්ව රාජ්‍ය සංකල්පය දුර්වල වෙතැයි අනුමාන කළ නොහැකි

අතර කලාපීය බල ගැටුම්වල ගොදුරක් නොවී නොබැඳි පිළිවෙතක කටයුතු කරන්නට ලාංකේය පාලකයන් අසමත් වීම මෙම අර්බුදය තීව්‍ර කරන්නට හේතු වී තිබේ.

ඉන්දියානු විජිතකරණයට එරෙහි අරගලය අත්‍යවශ්‍ය ලෙසම ඉන්දියන් කම්කරු ගොවි පීඩිත ජනතාවගේ සහාය මත පදනම් විය යුතු අරගලයක් බව අවිවාදිතය.

මෙවැනි තත්වයක් තුළ නිර්ධන පංති පොදු ජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කරන විප්ලවීය දේශපාලන ව්‍යාපාරයක් තම විදෙස් ප්‍රතිපත්තිය සකස්කොට ගන්නේ කෙසේද එහි ප්‍රධාන අරමුණු හා ඉලක්ක මොනවාද ගෝලීය ධනවාදය පරාජය කිරීමෙන් තොරව නිර්ධන පංතියට සිය ජයග්‍රහණය ලබාගත නොහැකිය. එබැවින් ගෝලීය ධනවාදය පරාජය කිරීම අරමුණු කරගනිමින් නිර්ධන පංති ජාත්‍යන්තරවාදය මත පදනම් වූ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය.

ගෝලිය ප්‍රාග්ධන ආධිපත්‍යයට එරෙහිව අරගල කරන ලොව පුරා පීඩිත ජනතාවගේත් ඔවුන් නියෝජනය කරන ප්‍රගතිශීලි සංවිධාන, දේශපාලන ව්‍යාපාර ආදිය සමග අත්වැල් බැඳගත් ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. අධිරාජ්‍යවාදය සිය න්‍යාය පත්‍රය අනුව මෙහෙයවන

තම යුද, ආර්ථික හා දේශපාලන අරමුණු වෙනුවෙන් ලොව පුරා ජනතාවගේ මානව හිමිකම් අමු අමුවේ උල්ලංඝණය කරන එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ආයතනවලින් මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට එරෙහිව යුක්තිය අපේක්ෂා කරමින් ඒවා පසුපස බඩගෑම වෙනුවට ලොවපුරා මානව හිමිකම් අභිමිව තම අයිතීන් ඉල්ලා අරගල කරන ප්‍රගතිශීලී සංවිධාන, වමේ ව්‍යාපාර පීඩිත ජනතාව කෙරෙහි විශ්වාසය තබා ජාත්‍යන්තර පරිමාණයෙන් ඔවුන්ගේ ඒකාබද්ධතාව වෙනුවෙන් කටයුතු කළ යුතුය. එමෙන්ම ගොඩනගන සමාජවාදී රාජ්‍යයේ ආරක්ෂාව පිළිබඳ ප්‍රමුඛ අවධානය යොමු කරමින් ලෝකයේ රාජ්‍යයන් සමග වඩා මිත්‍රශීලී හා මානවවාදී සබඳතා ජාලයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. ඉහතින් සකස් කරනු ලැබූ ප්‍රතිපත්තිමය රාමුවට යටත්ව ක්‍රියාකාරී තලයේ දී පහත සඳහන් පියවර අනුගමනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

1. ගෝලීය ප්‍රාග්ධනයේ නග්න සූරා කෑමට එරෙහිව ලොව ඕනෑම තැනක පීඩිත පන්තියේ ජනතාවගේ අරගලවලට සහයෝගීතාවත් පක්ෂපාතීත්වයත් ආධාර හා අනුබලය ලබාදෙන අතර ලෝකයේ පීඩිත ජනතාව සමග එක්ව අධිරාජ්‍යවාදයට එරෙහි මානව

ප්‍රගතිය උදෙසා ලෝක සමාජවාදී විප්ලවයේ උවමනාවන් වෙනුවෙන් අරගල කරනු ලැබේ.

2. අධිරාජ්‍යවාදයේ ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ මිලිටරි මැදිහත්වීම්වලට එරෙහිව ලොව පුරා පීඩිත ජනතාව විසින් ගෙන යන අරගලවලට පක්ෂපාතීත්වයත් සහයෝගයත් පළ කරනු ලැබේ.

3. ලෝකයේ රටවල පවතින විවිධ ප්‍රශ්න පදනම් කර ගනිමින් තම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අධිරාජ්‍යවාදය විසින් ඇති කරන ආර්ථික, දේශපාලන හා යුදමය මැදිහත්වීම්වලට එරෙහි වන අතර ඒ අරමුණින් ගිවිසුම්වලට එළඹීම, රටවල් තුළ යුද කඳවුරු පිහිටුවීම, යුද කටයුතු සඳහා භූමිය, මුහුද හා ගුවන් සීමා ආදිය යොදා ගැනීමට එරෙහිව කටයුතු කරනු ලැබේ.

4. ලොව ඕනෑම තැනක සිදුවන නිර්ධන පන්තියේ සටන් සහ විමුක්ති අරගලයන්ට සහභාගී වීම සඳහා යාමට කැමැත්ත පළ කරන ඕනෑම ස්වේච්ඡා ක්‍රියාධරයෙකුටම ඒ සඳහා අවස්ථාව ලබාදෙන අතර එම අරගල සඳහා ද්‍රව්‍යමය වශයෙන් අවශ්‍ය සහයෝගය ලබාදෙනු ඇත.

5. සමාජවාදී රාජ්‍යයේ ආරක්ෂාවත් පෞරුෂයත්

රැක ගනිමින් ජනතා අභිලාශයන් ඉටු කිරීම සඳහා ලොකයේ රටවල් සමග මිත්‍රශීලී හා මානවවාදී විදේශ සබඳතා ජාලයක් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. තවද ජනතාවට වඩා මානුෂවාදී ජීවිතයක් අත්කර දීම සඳහා ජාත්‍යන්තර වෙළෙඳාමේ දී සාපේක්ෂ වාසි න්‍යාය තුළ කටයුතු කිරීමට අවශ්‍ය වන අවස්ථාවල ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනු ඇත. සමාජවාදී ආර්ථිකය ගොඩනැගීම සඳහා අවශ්‍ය ශිල්පීය ඥානය හා නවීන තාක්ෂණික ජයග්‍රහණ නිදහසේ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

6. අධිරාජ්‍යවාදී සහ අධිරාජ්‍ය ගැති රාජ්‍යයන් සහ සංවිධාන සමග ඉතිහාසය පුරා ධනේශ්වර රාජ්‍යය විසින් ඇති කරගෙන තිබෙන සියලු ගිවිසුම් සහ සම්මුතීන් පිළිබඳ රටේ ජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් සිදු කරනු ලබන විධිමත් සමාලෝචනයකින් අනතුරුව ජනතාවට අහිතකර එවැනි ගිවිසුම් සහ සම්මුතීන් අහෝසි කිරීමට පියවර ගනු ඇත.

7. ලොව තුළ ඇති අධිරාජ්‍ය ගැති රූකඩ හා අනුග්‍රාහක ආණ්ඩු මෙන්ම ජනතා විරෝධී ඒකාධිපති ආණ්ඩු විසින් ජනතාව කෲර ලෙස

මර්දනය කිරීම හෙළා දකින අතර එයට රෙහිව පැන නගින ජනතා අරගලවලට සහයෝගීතාවය පළ කරනු ඇත.

8. ලෝක බැංකුව, ලෝක වෙළෙඳ සංවිධානය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි අධිරාජ්‍යවාදයේ ආර්ථික දේශපාලන අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වන ආයතන වලින් තීරණාත්මක ලෙස ඉවත්වන අතර එම අරමුණුවලට ප්‍රතිපක්ෂව ගොඩනගන හා ක්‍රියාත්මක වන සංවිධාන සමග සහයෝග යෙන් කටයුතු කරනු ලැබේ.

9. අධිරාජ්‍යවාදයේ ආර්ථික, දේශපාලනික හා යුද අරමුණු වෙනුවෙන් ලොව පුරා සිදු කෙරෙමින් තිබෙන මානව හිමිකම් උල්ලංඝනය කිරීම හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවලට එරෙහිව එම ජනතාව සමග ඒකාබද්ධ අරගලයක් උදෙසා සක්‍රියව මැදිහත්වනු ලැබේ.

10. යුක්‍රේනයේත් ගාසා තීරයේත් නිර්මාණය වී ඇති යුද උණුසුම අධිරාජ්‍යවාදී බලවතුන්ගේ ලෝකය නැවත තමන් අතර බෙදා ගැනීමේ උවමනාවන්ගෙන් හා ආර්ථික බල අරගලයේ උවමනාවන්ගෙන් ජනිත වූ ඒවාය. දකුණු චීන මුහුදේ ආතතික ස්වභාවය ද දිනෙන් දින ඉහළ

යමින් පවතින අතර දරුවන් ද කාන්තාවන් ද ඇතුළුව අධිරාජ්‍යවාදී යුද ගැටුම්වල පහසු ගොදුරු වන්නේ පොදු ජනතාවය. ජනතාව ලෙයින් සහ ජීවිතවලින් ඒ සඳහා වන්දි ගෙවමින් සිටී. අධිරාජ්‍යවාදී යුද ගැටුම් වහා නවතා දමන ලෙසත් සිවිල් ජනතාවට එරෙහි යුද ප්‍රහාර නවතා දමන ලෙසත් නැගී එන ජාත්‍යන්තර විරෝධතාවන්හි හා අරගලවල අප ද නිරන්තරයෙන්ම කොටස්කරුවන් විය යුතුය.

# සංක්‍රමණීය වැඩපිළිවෙළ

# සංක්‍රමණීය වැඩපිළිවෙළ

## (අ) රාජ්‍ය ව්‍යුහය

සමාජවාදය තුළ රාජ්‍ය ව්‍යුහය සකස් වන ආකාරය මූලධාර්මිකව මෙන්ම ව්‍යුහාත්මකව ද වත්මන් රාජ්‍ය ව්‍යුහයට වඩා වෙනස් වේ. වත්මන් රාජ්‍ය ව්‍යුහය සකස් වීමට අදාළ මූලධර්මය වන්නේ ජනතා පරමාධිපත්‍ය බලය ජනතාව විසින් තෝරා පත් කරනු ලබන නියෝජිතයන් විසින් භාවිත කිරීමයි. ඒ අනුව තනි සමස්තයක් ලෙස සැලකෙන ජනතාවගේ පරමාධිපත්‍ය බලය ඉහළට ගෙන, ඉහළ තලයේ දී විධායක - ව්‍යවස්ථාදායක - අධිකරණ ලෙස ආයතන තුනකට බෙදනු ලබයි. මැතිවරණ සහ නීති පද්ධති ඇතුළු ඉතිරි උපාංග සකස් වන්නේ නියෝජිතයන් තෝරා පත් කර ගන්නා ආකාරය, විධායක - ව්‍යවස්ථාදායක - අධිකරණ ආයතන තුන අතර සංවරණය සහ තුලනය පවත්වාගෙන යාම ආදිය සඳහා පමණි. එහි දී නියෝජිත ආයතන තුළින් ජනතා මතය නියෝජනය වන බවට පූර්ව උපකල්පනයක් කළ ද ප්‍රායෝගිකව එම ආයතන සහ පොදුවේ රාජ්‍ය ව්‍යුහය නියෝජනය කරනුයේ දේපළ හිමි පන්තියේ අභිලාෂයන් පමණි.

**ජනතාවගේ ප්‍රතිපත්තිය**

ජනතාවගෙන් බහුතරය වන වැඩකරන පන්තියේ අභිලාෂයන් නියෝජනය කරනුයේ පවතින රාජ්‍යයට සමාජ සහනුමැතියක් ලබා ගැනීමේ සීමාවට පමණි.

නමුත් සමාජවාදය තුළ රාජ්‍ය බලය හසුරුවනු ලබන්නේ වැඩකරන පන්තිය විසිනි. එනිසා හැකි සෑම අවස්ථාවකදීම රාජ්‍ය තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ජනතාවගේ සෘජු සහභාගීත්වයක් ලබා ගැනීම, ජනතාව වැඩි අවස්ථා ගණනක දී රාජ්‍ය බලය අභ්‍යාස කිරීම, නියෝජිතයන් පොදු ජනයාගෙන් ඉහළ එසවුණු ප්‍රභූ තන්ත්‍රයක් වීම වැළැක්වීම සඳහා පියවර ගැනීම, නියෝජිතයන්ගේ කටයුතු ජනතා අධීක්ෂණයට සහ නියාමනයට යටත් කිරීම යනාදී ලක්ෂණ රාජ්‍ය ව්‍යුහයේ මූලික පදනම බවට පත්වේ. එනිසා ජනතා පරමාධිපත්‍ය බලය ඉහළට ගෙන එය ආයතන තුනකට බෙදා හරින ක්‍රමය වෙනුවට සමාජවාදී රාජ්‍ය ව්‍යුහය මගින් විධායක - ව්‍යවස්ථාදායක - අධිකරණ බලය ජනතාවගේ ස්වේච්ඡා ප්‍රජාතන්ත්‍රවාදී සභාවල ඉහළ සිට පහළට විවිධ අනුපාතවලින් අභ්‍යාස කරන ආකෘතියක් සකස් කෙරේ.

2022 ජන අරගලය මගින් සමාජවාදී රාජ්‍ය ව්‍යුහයක ඉල්ලීමක් ඉදිරිපත් නොකළ ද එම ඉල්ලීම් තුළ ප්‍රජාතන්ත්‍රවාදී සන්ධාරයක් තිබේ. අරගලයේ දී

ජනතාව ඉල්ලා සිටියේ තීන්දු ගැනීමේ බලය තනි පුද්ගලයෙකු අත කේන්ද්‍ර කිරීම වෙනුවට සාමූහික මණ්ඩලවලට පැවරීම, නියෝජිත මණ්ඩලවලට ජනතාවගේ ජීවිතවල ඉරණම පවරාදීම වෙනුවට ජනතාවගේ දේශපාලන සහභාගීත්වයක් සහතික කිරීම, රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම - නීති සම්පාදනය - රාජ්‍ය පරිපාලනය ආදී කටයුතුවලදී ජනතාවට සහභාගී වීමේ අයිතිය තහවුරු කිරීම ආදියයි. එය එක්තරා ආකාරයකට අපගේ දිගු කාලීන වැඩපිළිවෙළ වන වැඩකරන ජනතාවගේ රාජ්‍ය බලය පිළිබඳ ඉලක්කය සමග ද සම්බන්ධ වේ. අපගේ කෙටිකාලීන වැඩපිළිවෙළ තුළ රාජ්‍ය ව්‍යුහයට ප්‍රජාතාන්ත්‍රිකකරණයක් යෝජනා කරන අතර එය සමාජවාදී රාජ්‍ය ව්‍යුහයම නොවුවත්, ඊට ප්‍රතිවිරෝධී එකක් නොව එම දිශාවට වන වර්ධනයකි. එනයින් එය රාජ්‍ය ව්‍යුහයට අදාළ සංක්‍රමණික මාවතක් යෝජනා කර සිටී.

01. අත්‍යවශ්‍ය මූලික පියවරක් ලෙස 'නව ජනතාවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්' සකස් කරනු ලැබේ. නව ජනතාවාදී ව්‍යවස්ථාවක් සකස් කිරීම ජනසහභාගී ව්‍යවස්ථා සම්පාදක ව්‍යුහයක් හරහා සිදුකරන අතර, එමගින් සකස් කරන කෙටුම්පත ප්‍රමාණවත් කාලයක් සමාජ සංවාදයට බඳුන් කර ජනතා අදහස් මත

සංශෝධනය කිරීමට කටයුතු කරනු ඇත. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර ගැනීම ජනමත විචාරණයක් මගින් ජනතාවගේ පූර්ණ අනුමැතියක් ලබා ගැනීමෙන් පමණක් සිදු කරනු ඇත.

02. නව ජනතාවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පහත මූලික ලක්ෂණවලින් සමන්විත වනු ඇත.

(i) නව ජනතාවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කෙරෙන අතර පවතින ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වය අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) 'නියෝජිතයන් යළි කැඳවීමේ බලය' එම නව ව්‍යවස්ථාවට ඇතුළු කිරීම හරහා ජනතාවගේ බලය තහවුරු කිරීමට පියවර ගනු ලැබේ.

(iii) නියෝජිතයන් විසින් සම්මත කරනු ලැබූ 'නීති අධිකරණ සමාලෝචනයකට ලක් කිරීමේ හැකියාව' ව්‍යවස්ථාවට ඇතුළු කිරීම හරහා රාජ්‍ය තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියේ ජනතාව සතු බලය තහවුරු කිරීමට පියවර ගනු ඇත.

(iv) ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ශක්තිමත් කිරීම සඳහා නිශ්චිත අත්සන් ප්‍රමාණයක් සහිත පෙත්සම් හරහා 'ජනමත විචාරණ

කැඳවීමේ බලය' ජනතාවට ලබාදීමට කටයුතු කරනු ලැබේ.

(v) වර්තමානයේ පවතින තත්වයට පටහැනිව මහජන නියෝජිතයන් ජනතාවගෙන් ඉහළට එසවුණු වෙනම ප්‍රභූ තන්ත්‍රයක් වීම වැළැක්වීම අරමුණු කරගෙන ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇතුළත් කරනු ඇත.

(vi) නව ජනතාවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පවතින මැතිවරණ නීතිය වෙනස් කරන අතර එහිදී මූල්‍ය බලය - මාධ්‍ය බලය - රාජ්‍ය බලය හරහා අපේක්ෂකයන් අතර ඇතිවන අසමානතාව තුරන් කිරීම අරමුණු කරනු ඇත.

(vii) ජාතික ප්‍රශ්නය විසඳීම අරමුණු කරගත් ප්‍රවේශයක් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කරනු ලැබේ.

03. පවතින නියෝජිත ව්‍යුහයන්ට පිටතින් ගොඩනැගෙන ජනතාවගේ සභාවලට නියෝජිත ව්‍යුහයන්වලට මැදිහත්වීමේ සහ නියාමනය කිරීමේ බලය තහවුරු කර, ජන සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයේ දිශානතියට ප්‍රවේශයක් ගනු ලැබේ.

## (ආ) ප්‍රජාතන්ත්‍රවාදය

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වත්මන් මූලධාර්මික පදනම ගොඩනැගෙන්නේ දෙආකාරයකිනි. ඉන් පළමුවැන්න වන්නේ මෙම ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතිය 'නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය'යි. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය වනාහී වැඩවසම් රාජාණ්ඩුවල අත්තනෝමතිකත්වයට එරෙහි දැවැන්ත ඉදිරි පියවරකි. එහෙත් එය තවදුරටත් වැඩෙන සමාජ අවශ්‍යතාවලට ප්‍රමාණවත් වන්නේ නැත. එමෙන්ම ධනවාදයේ අවසන් කාර්තුව තුළ පාලක පන්තියට ධනවාදයේ උත්පාත අවධියේ ඔවුන් විසින්ම පිළිගත් ප්‍රජාතාන්ත්‍රික ඇගයුම් පද්ධති තවදුරටත් පවත්වාගෙන යාම ද අපහසුය. සමාජවාදය තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වනුයේ සැබෑ ලෙසම බහුතරයේ අයිතීන් නියෝජනය කරන නිර්ධන පන්ති ප්‍රජාතන්ත්‍රවාදයයි. වත්මන් ප්‍රජාතන්ත්‍රවාදය බහුතරය ගැන කිව්ව ද එය නියෝජනය කරන්නේ ජනගහනයෙන් අතිශය සුළුතරය වූ දේපළ හිමි පන්තියේ අභිලාශයන්ය. සමාජවාදයේ මූලධර්මය වනුයේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ පූර්ණ වර්ධනයක් වන සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයයි.

මීට පෙර රාජ්‍ය ව්‍යුහය කොටසේ පැහැදිලි

කළ ආකාරයෙන්ම 2022 අරගලයේ දී ජනතාව ඉල්ලා සිටියේ ජන සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියක් නොව පවතින නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියේම දිගුදුර වර්ධනයකි. එහෙත් ඇතැම් සංයුක්ත ඉල්ලීම් සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී සීමාව දක්වා ගමන් කරමින් තිබිණි. අපගේ කෙටිකාලීන වැඩපිළිවෙළ අරගලයේ ජනතා ඉල්ලීම්වලම ඉදිරි පියවරක් වන අතර එය තුන් ආකාර මාවත් අන්තර්ගත කරගෙන සිටී. එනම්

- **පවතින නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් සහ ගැඹුරින් ක්‍රියාත්මක කිරීම,**
- **පවතින නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී සීමාවන් තවදුරටත් පුළුල් කිරීම සහ**
- **එකී වර්ධනයන් සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය දෙසට දිශානතිගත කිරීමයි.**

එනම් අප ඉදිරිපත් කරන්නේ අපගේ 'දිගුකාලීන වැඩපිළිවෙළ' සමග අන්තර් සම්බන්ධිත 'සංක්‍රමණීය කෙටිකාලීන' වැඩපිළිවෙළකි.

දෙවන පදනම වනුයේ 'ප්‍රජාතන්ත්‍රවාදය සංයුක්ත වන්නේ කුමන අයිතීන්ගෙන්ද?' යන්නය. වත්මන් නීති පද්ධතිය සකස් කර ඇත්තේ 'ප්‍රජාතන්ත්‍රවාදය යනු නෛතික සහ දේශපාලන සමානාත්මතාවය ය' යන පදනමෙනි. එනම් නීතිය හමුවේ සියල්ලන් සමාන වන අතර සියලු

දෙනා සමාන දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳිති. නමුත් සමාජවාදය තුළ ප්‍රජාතන්ත්‍රවාදය අර්ථකථනය කෙරෙන්නේ ආර්ථිකය සමග අන්තර් සම්බන්ධිතවය. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය නොමැති තැන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වාග් පාඨ හුදු මුළාවක් පමණි. එනිසා සමාජවාදී මූලධර්මයට අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු හුදෙක් නෛතික සහ දේශපාලන සමානාත්මතාවය පමණක් නොවන අතර එය ආර්ථික සහ සමාජමය සමානාත්මතාව සමග ද බැඳී තිබේ. පසුකාලීනව වර්ධනය වූ සංකල්පවලට අනුව පාරිසරික සහ සංවර්ධන ක්ෂේත්‍රවල සමානාත්මතාව තහවුරු කිරීම ද ඉතාම වැදගත් වේ. අපගේ කෙටිකාලීන වැඩපිළිවෙළ මෙනයින් අපගේ දිගුකාලීන වැඩපිළිවෙළෙහි සංයුක්ත කොටසක් වන අතර එය සංක්‍රමණික වැඩපිළිවෙළක ස්වභාවය ගනී.

04. ව්‍යවස්ථාවෙන් සහතික කරනු ලබන මූලික අයිතිවාසිකම් දැනට පවතින දේශපාලන හා නෛතික සමානාත්මතාවයෙන් ඔබ්බට ගොස් සමාජමය සහ ආර්ථික සමානාත්මතාව දක්වා ද, (නිදසුනක් ලෙස රැකියාවක් කිරීමේ අයිතිය, ජීවිතය සඳහා අයිතිය වැනි) පාරිසරික සහ සංවර්ධන අයිතීන් දක්වාද (නිදසුනක් ලෙස ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමේ

අයිතිය, ආර්ථික සංවර්ධනයේ ඵල අත්පත් කර ගැනීමේ අයිතිය වැනි) පුළුල් කිරීම. දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර තිබෙන අයිතිවාසිකම්වලට අමතරව ජීවිතය සඳහා අයිතිය, සිය නිපුණතාවලට සම්බන්ධ රැකියාවක් සඳහා අයිතිය, සියලු රැකියා සඳහා වන සමාජමය ගෞරවය සහතික කිරීම, වෘත්තීය සමිති පිහිටුවීමේ සහ සාමූහිකව කේවල් කිරීමේ අයිතිය, සමාන වැඩට සමාන වැටුප් ලැබීමට අයිතිය, සමාජ ආරක්ෂණ ප්‍රදානයන් සහිතව සාධාරණ වේතනයක් ලැබීමේ අයිතිය, දෛනික වැඩ පැය ගණන සීමා කිරීම හා නිවාඩු දින සහිතව ප්‍රමාණවත් විවේකයක් ලබා ගැනීමේ අයිතිය, මහලු වියට එළඹීම හෝ ආබාධිත වීම හෝ අසනීප තත්වයන් නිසා වැඩ කිරීමට නොහැකි වන සෑම දෙනාටම සමාජමය ලෙස යැපුම් මාධ්‍ය හිමි කර ගැනීමට ඇති අයිතිය, රැකියාවේ යෙදෙන්නා මියගියහොත් මෙකී අයිතීන් එම පවුලට හිමිකර දීමට ඇති අයිතිය, සිය වෘත්තිය තුළ ලෙඩ රෝග හෝ හදිසි අනතුරුවලින් ඉවත්ව ආරක්ෂිතව ශ්‍රමය වැය කිරීමට ඇති අයිතිය, රෝග වැළඳීමෙන් ආරක්ෂා වීමටත් ලෙඩරෝගවලට ප්‍රතිකාර

ගැනීමටත් සියලු මිනිසුන් සතු සම අයිතිය. (නිදහස් සෞඛ්‍ය සේවයක් සඳහා වන අයිතිය), අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමට සෑම මිනිසෙකුටම ඇති අයිතිය. (අධ්‍යාපනය ලැබීමේ දී විශේෂ අවශ්‍යතා හා ගැටලු ඇති අය ද ඇතුළත්ව), ගුණාත්මක වශයෙන් උසස් නිදහස් අධ්‍යාපනයක් ලැබීමට ඇති අයිතිය, ප්‍රථම උපාධිය දක්වා සහ නිශ්චිත වෘත්තීය මට්ටමක් දක්වා නොමිලේ අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය, ක්‍රීඩාවේ නියැළීමටත් ඒ සඳහා පුහුණුව ලැබීමටත් ක්‍රීඩා නැරඹීමටත් ඇති අයිතිය, ජනතාවට අදහස් ප්‍රකාශ කිරීමට - රැස්වීමට - සමාගමෙහි යෙදීමට - තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය, රාජ්‍ය වාරණවලට හෝ සීමාවන්ට යටත් නොවී මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් චුම්භක තරංග භාවිත කිරීමට ප්‍රජාවට ඇති අයිතිය, සිය ලිපි, ෆැක්ස්, විද්‍යුත් තැපෑල, දුරකථන ඇතුළු සන්නිවේදන මාධ්‍යයන්ට රාජ්‍ය ආයතන හෝ අන් කවරෙකු විසින් රහසේ ඇතුළුවීම වළක්වාලීමට ඇති අයිතිය. පෞද්ගලිකත්වයේ අයිතිය, ස්ත්‍රී අයිතීන් (විවාහක හෝ විවාහයෙන් පිටත උපන් සියලුම දරුවන්ට සමාන සමාජ පිළිගැනීමක් හා සමාන සමාජ ආරක්ෂාවක් ලැබීමේ

අයිතිය, ස්ත්‍රීන්ට සිය ශරීරය පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය එනම්, බලහත්කාරයට හෝ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමෙන් තොරව සෞඛ්‍යය, ශරීරය සහ ලිංගික ජීවිතය පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය ආදිය ද සමග), සියලු ලිංගික අනන්‍යතා - ලිංගික නැඹියාවන් සහ ලිංගික වරණයන් සඳහා සමාන අයිතිවාසිකම් (දණ්ඩ නීති සංග්‍රහයේ 365, 365-අ සහ 399 වගන්ති අවලංගු කිරීම, පාදඩ ආඥාපනත අහෝසි කිරීම ඇතුළු ප්‍රතිසංස්කරණ සමග), සංස්කෘතික ජීවිතයට නිදහසේ ප්‍රවේශ වීමටත් කලාව රස විඳීමටත් විද්‍යාත්මක දියුණුවේ කොටස්කරුවන් වීමටත් ඇති සම අයිතිය, සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ලැබීමේ අයිතිය, පාරිසරික විනාශයන්ගේ ගොදුරු බවට පත් නොවීමේ අයිතිය (ස්වාභාවික පරිසරය ජනතා අයිතියක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කිරීම, අනාගත පරපුරේ අයිතිවාසිකම් වෙනුවෙන් ඕනෑම පුරවැසියෙකුට පෙනී සිටීමට ඇති අයිතිය තහවුරු කිරීම, පරිසර දූෂණය අපරාධ වරදක් බවට පත් කිරීම, තමන් පරිසර හිතකාමී බවට ව්‍යාජව පෙනී සිටින නිෂ්පාදන හා සේවාවල නොමග යවන සුළු ප්‍රචාරයන් තහනම් කිරීමේ

නීති හෙවත් Anti-Greenwashing Rules සම්මත කිරීම, සත්ව සුබසාධන පනතක් නීතිගත කිරීම ආදී වශයෙන්), සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය සහ ආර්ථිකයේ සහ අනෙකුත් ක්ෂේත්‍රවල සංවර්ධනයේ ඵල භුක්ති විඳීමට ඇති සමාන අයිතිය ඇතුළු අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කරනු ඇත.

05. මරණීය දණ්ඩනය, දණ්ඩන ක්‍රමයක් ලෙස පිළි නොගන්නා අතර එය සම්පූර්ණයෙන්ම අහෝසි කරනු ලැබේ.

06. ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට තර්ජනයක් වන ලෙස සකස් කර තිබෙන 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත' වහාම අවලංගු කරන අතර එවැනි අඩංගුවක් සහිත කිසිදු මර්දනීය පනතක් ගෙන ඒමට ඇති ඉඩකඩ වහාම අත්හිටුවනු ලැබේ.

07. මර්දනීය අරමුණෙන් මෑතක දී ගෙන එනු ලැබූ සමාජ මාධ්‍ය මර්දන පනත ('මාර්ගගත ක්‍රමවල ආරක්ෂාව පිළිබඳ පනත'), 'පුනරුත්ථාපන කාර්යාංශ පනත' වැනි මර්දනීය අණ පනත් වහාම අහෝසි කරනු ලැබේ.

08. දූෂණ විරෝධයේ නාමයෙන්, ජනතාවට

අහිතකර ආණ්ඩුවේ කටයුතුවලට එරෙහි වන රාජ්‍ය නිලධාරීන් මර්දනය කිරීම සහ බිය ගැන්වීම අරමුණු කරගෙන නිර්මාණය කර ඇති වත්මන් 'දූෂණ විරෝධී පනත' වහාම අහෝසි කර, දේශපාලන තන්ත්‍රය, ඉහළ පෙළ රාජ්‍ය නිලධාරී තන්ත්‍රය සහ පෞද්ගලික ව්‍යාපාරික කවය තුළ සිදුකෙරෙන වංචා-දූෂණ වැළැක්වීම සඳහා මෙහි පසුව සඳහන් කරන ආකාරයේ ශක්තිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කරනු ලැබේ.

09. මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තීරණය කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී ජනතා පරමාධිපත්‍යයේ බලය දුර්වල කර, ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් උදුරා ගැනීමට ගෙන ඇති සියලු පියවර වහාම ආපසු හරවනු ලැබේ. නිදසුනක් ලෙස, මූල්‍ය ප්‍රතිපත්තිය තීරණය කිරීමේ බලය නිලධාරිවාදී අත්තනෝමතිකත්වයකට ගොදුරු කරන 'මහබැංකු පනත', රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තීරණය කිරීමේ දී ජනතාව තෝරාපත් කරන නියෝජිතයන්ට ඇති බලය දුර්වල කරන 'ආර්ථික පරිවර්තන පනත' හා 'රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත' ඇතුළු ප්‍රජාතන්ත්‍ර - විරෝධී නීති වහාම අහෝසි කරනු ලැබේ.

## (ඈ) ආර්ථිකය

ධනවාදී ආර්ථිකයක සහ සමාජවාදී ආර්ථිකයක ව්‍යුහයන් සම්පූර්ණයෙන්ම පාහේ එකිනෙකින් වෙනස් වේ. නිදසුනක් ලෙස ධනේශ්වර ආර්ථිකය සංවිධානය වී තිබෙන්නේ ප්‍රාග්ධන හිමියාට ලාභ සහතික කිරීම සඳහාය. එමෙන්ම එය හැම විටම පාහේ සුළු ප්‍රාග්ධනය විනාශ කෙරෙමින් ඒකාධිකාර ගොඩනැගෙන යාන්ත්‍රණයක පවතී. ආර්ථිකයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් වන්නේ ප්‍රාග්ධන හිමියාට වැඩි ලාභ - ඉක්මන් ලාභ - පහසු ලාභ අත්පත් කර දීමත්, ගෝලීය මහා ප්‍රාග්ධනයේ සහ ඒකාධිකාරවල අවශ්‍යතාත් උදෙසාය. එමෙන්ම ප්‍රාග්ධනයේ ලාභ උකහා ගැනීමේ ක්‍රියාවලියට තවමත් හොඳින්ම අනුගත නොවූ නොඉඳුල් ක්ෂේත්‍ර වෙත ප්‍රාග්ධනය ඇතුළු කිරීමය. මූල්‍ය ප්‍රාග්ධනයේ යුගය වන අධිරාජ්‍යවාදී යුගයේ දී මෙයට තවත් ලක්ෂණයක් එක් වේ. ඒ ගෝලීය මූල්‍ය ප්‍රාග්ධන හිමියන් වෙනුවෙන් ආර්ථික ප්‍රතිපත්තිය සංවිධානය කිරීමයි. ලංකාවේ ආර්ථික අර්බුදය මෙම ආර්ථික ප්‍රතිපත්තියේ නිසග අර්බුදයක් පුපුරා යාමකි.

අරගලයේ දී ජනතාව අර්බුදයේ මූලහේතු මුලිනුපුටා දැමීමට ඉල්ලා නොසිටියමුත් අර්බුදයේ

බර පොදු ජනයා මත පැටවීමට එරෙහි විය. එහිදී වත්මන් ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි සංවිධාන සමග එක්ව ක්‍රියාවට නගන ප්‍රතිපත්තිය වනුයේ අර්බුදයේ බර, එයට කිසිසේත්ම වගකිව යුතු නැති වැඩකරන ජනතාව මත පටවා, අර්බුදය ධන කුවේරයන්ගේ ලාභ උල්පතක් බවට පත් කිරීමයි.

නමුත් ලංකාවේ ධනපති පන්තිය සිය අතිරික්තයෙන් විශාල කොටසක් නැවත ඵලදායී ක්ෂේත්‍රවල ආයෝජනය කිරීම වෙනුවට පරිභෝජනය කිරීම මෙම අර්බුදයේ එක් මූලයකි. අධිසුඛෝපභෝගී මහල් නිවාස, අධික ලෙස ඉන්ධන නාස්ති කරන සුපිරි වාහන ආදිය සඳහා අතිරික්තයෙන් විශාල අනුපාතයක් වැය කරන අතර එය නැවත නව වටිනාකම් උපදවන්නේ නැත. එමෙන්ම ලංකාවේ ධනපතියන් සිය අතිරික්තය නීත්‍යනුකූල ක්‍රමවලට පමණක් නොව නීති විරෝධී ක්‍රමවලට ද රටෙන් පිටකර විදේශ ගිණුම්වල තැන්පත් කිරීම ප්‍රාග්ධන ක්‍රියාවලියේ ගතිකත්වය නැති වීමට තවත් හේතුවකි. එනිසා අර්බුදයේ පැති ගණනාවක් ලංකාවේ ධනපති පන්තියේ පසුගාමී සහ අවවර්ධිත ස්වභාවය සමග බැඳී තිබේ. මේ මොහොත අර්බුදය ලෙස මෙන්ම අර්බුදයට විසඳුම ලෙස ද ගෝලීය ප්‍රාග්ධනයේ ආධිපත්‍යය වියරුවෙන් ලංකාවේ ආර්ථිකය මතට කඩා වදින මොහොතකි.

ගෝලීය දකුණට ගෝලීය ප්‍රාග්ධනය ගලා එන්නේ මූලික වශයෙන්ම ශ්‍රම සූක්ෂ්ම කර්මාන්ත ආරම්භ කර ඒවායේ වැටුප් වශයෙනි. නමුත් සමාන වැඩ සඳහා ලොව පුරා සමාන වැටුප් නැති අතර ගෝලීය දකුණේ රටවල ගෙවනු ලබන්නේ සාපේක්ෂව අඩු වැටුපකි. එමෙන්ම එම කලාපයට ගෝලීය ප්‍රාග්ධනයේ ගැලීම එහි සියලු දෙනාට රැකියා සැපයීමට තරම් ප්‍රමාණවත් නොවන කොටසකි. සිදු කෙරෙන ආයෝජන සහ ව්‍යාපෘති ආශ්‍රිත ප්‍රාග්ධනය විරැකියාව තුරන් කිරීමට ප්‍රමාණවත් නැති බැවින් රටේ සමස්ත රැකියා නියුක්තිය තබා ගැනීමටනම් අධික ලෙස ණය ගැනීමට එම රටවලට සිදුවේ. මෙම හේතු දෙකම නිසා ගෝලීය දකුණේ රටවලට ණය ගැනීමට සිදුව තිබේ. එමෙන්ම මූල්‍ය ප්‍රාග්ධනය අධිනිශ්චය වූ වත්මන් සමාජය තුළ ලාභය අරමුණු කරගෙන ණය ලබාදීමේ ව්‍යාපාරය ඉදිරියට පැමිණ තිබෙන අතර ගෝලීය දකුණේ රටවල් එම ක්‍රියාවලියේ ගොදුරක්ව ඇත. මෙම තත්වය ගෝලීය ණය අර්බුදයේ ප්‍රධාන පදනම් නිර්මාණය කර තිබේ.

සමාජවාදී ආර්ථිකය ධනේශ්වර ආර්ථිකයේ ඒකාධිකාරවලට පටහැනිව රාජ්‍ය දේපළ, සාමූහික දේපළ සහ සුළු පරිමාණ පෞද්ගලික දේපළ මත ආර්ථික ව්‍යුහය සංවිධානය කරන ආර්ථිකයකි. එය

මූල්‍ය බුබුළු පිම්බවීමේ වත්මන් ආර්ථිකයට වෙනස්ව නිෂ්පාදනය සහ ඒ හා බැඳුණු සේවා වර්ධනය කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙයි. එය ධනවාදයේ මෙන් ලාභයම අරමුණු කරගෙන නොව, සමාජ අවශ්‍යතා සැපිරීම පදනම් කරගෙන ආර්ථිකය සංවිධානය කරයි. ධනවාදයේ දී ආර්ථිකය ලාභ හඹා යන තරගය හමුවේ නිෂ්පාදන අරාජිකත්වයක් ගොඩනගන අතර සමාජවාදී ආර්ථිකය සැලසුම්සහගත ආර්ථිකයකි.

විශේෂයෙන් වත්මන් ආර්ථිකය හසුරුවන සුක්කානම මහා ධන කුවේරයන් අතළොස්සක් සතුවන අතර සමාජවාදී ආර්ථිකය ජන සහභාගී ආර්ථික ක්‍රමයකි. එනම් ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන ලද ක්‍රමයකි. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන්නේ ආර්ථිකයට අදාළ තීන්දු තීරණ ගන්නා ක්ෂේත්‍රයේ දී පමණක් නොව, ආර්ථිකයේ ප්‍රතිලාභ බෙදී යාමේදීත් එය ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත පදනම් වේ. එනම් ධනවාදය ආර්ථික විෂමතාව උග්‍ර කරන දිශානතියකට යද්දී සමාජවාදී ආර්ථිකයක් ආර්ථික සාධාරණත්වයේ සහ සමානාත්මතාවයේ මූලධර්ම මත පදනම් වේ. සමාජවාදී රාජ්‍යයක් සිය ආර්ථික ස්වාධීනත්වය සහ දේශපාලන ස්වෛරීත්වය එකට බැඳී තිබෙන බව තදින් පිළිගන්නා හෙයින් එය හැම විටම ආර්ථිකය අධිරාජ්‍යවාදී මූල්‍ය සංවිධානවල ග්‍රහණයෙන් මුදා

ගැනීමට කටයුතු කරයි. එමෙන්ම ලාභ හඹා යාම වෙනුවට සමාජයේත්, මිහිතලයේත් යහපැවැත්ම පිළිබඳ ප්‍රමුඛතාව දෙන නිසා සමාජවාදී ආර්ථිකයක් පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් සිය සීමා පනවාගනු ලබයි.

අපගේ දිගුකාලීන වැඩපිළිවෙළ 'සමාජවාදී ආර්ථිකයක් ගොඩනැගීම' වන අතර එහි පදනම වනුයේ ප්‍රාග්ධනයේ පරිපථය බිඳ දැමීමේ ඉලක්කයකට ආර්ථිකය මෙහෙයවීමයි. අපගේ කෙටිකාලීන වැඩපිළිවෙළ පදනම් වන්නේ ප්‍රාග්ධනයේ ප්‍රහාරයෙන් වැඩකරන ජනතාව සහ සුළු නිෂ්පාදකයා ආරක්ෂා කිරීමයි. ඒ අනුව විදේශීය ණය අර්බුදය, රාජ්‍ය මූල්‍ය අර්බුදය, ජනතාව මුහුණදී ඇති කුටුම්භ මට්ටමේ ආර්ථික අර්බුදය, ආර්ථිකය සංකෝචනය වීමේ අර්බුදය ඇතුළු අර්බුද කිහිපයක් සඳහා ජනතාවගේ පාර්ශවයෙන් විසඳුම් යෝජනා ඉදිරිපත්කර ඇත. එය අපගේ දිගුකාලීන වැඩපිළිවෙළ සමගම සම්බන්ධ වන්නේ ගෝලීය ප්‍රාග්ධන ආධිපත්‍යයෙන් සහ අධිරාජ්‍යවාදී මූල්‍ය බූවල්ලන්ගේ ග්‍රහණයෙන් ආර්ථිකය මුදාගෙන තිබීම, වැඩකරන ජනතාවගේ සහ සුළු නිෂ්පාදකයාගේ දායකත්වය ආරක්ෂා කර තිබීම සමාජවාදය ගොඩනැගීමේ දී වාසිදායක කොන්දේසි ගොඩනැගීම නිසා පමණක් නොව ප්‍රාග්ධන විරෝධී අරගලය තුළ බලවේග

අභ්‍යාස කරවීම සමාජ දේශපාලන සවිඥානය ගොඩනැගීමේ දී තීරණාත්මක වන නිසාත්ය.

## විදේශ ණය අර්බුදය

10. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදු වැඩසටහනෙන් ඉවත් වීමේ වැඩපිළිවෙළක් සකස් කර, ණය දුන් පාර්ශ්ව සමග සාධාරණ ණය ප්‍රතිව්‍යුහගතකරණයක් සඳහා සාකච්ඡා ආරම්භ කරනු ලැබේ. එහි දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

(i) විලෝපික ණය කපා හැරීම සඳහා වන ජාත්‍යන්තර සහයෝගීතාවක් ඇති කර ගනු ලැබේ.

(ii) විශාල පොලී මත ගෙන තිබෙන අවදානම්කාරී ණය නොගෙවා හැරීම සඳහා නෛතික ආරක්ෂණය සහතික කරනු ලැබේ.

(iii) දැනට ලබාගෙන ඇති ණයවල මුහුණත අගය ප්‍රමාණවත් තරමින්, අවම වශයෙන් 80%කින්වත් කප්පාදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(iv) ආර්ථික අර්බුදයට ලක් වූ රටවල ණය කපා හැරීමේ ජාත්‍යන්තර ව්‍යාපාරය සමග එක් වී

ර්ට අදාළ ගෝලීය දකුණේ සහයෝගීත්වයක් ගොඩනැගීමට මූලාරම්භක පියවර ගනු ලැබේ.

11. ලබාගෙන ඇති සියලු ණය පිළිබඳ වෝහාරික විගණනයක් සිදුකර ණය මුදල් වංචා කළ හෝ නාස්ති කළ හෝ අවභාවිත කළ අයගෙ න් ඒවා අය කර ගැනීමට කටයුතු කරනු ඇත.

12. ආනයන - අපනයන ක්‍රියාවලියේ දී සාවද්‍ය ඉන්වොයිසකරණ ක්‍රියාවලියක් හරහා වංචනික ලෙස රටෙන් පිටකර විදේශවල රඳවා සිටින ඩොලර් බිලියන 56කට අධික මුදල් නැවත ලංකාවට ගෙන්වා ගැනීම සඳහා කඩිනම් නීතිමය පියවර ගනු ලැබේ. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත වහාම සංශෝධනය කර 1953 අංක 24 දරණ විනිමය පාලන පනතේ තිබුණු ආකාරයට විදේශ විනිමය වංචා සහ මුදල් විශුද්ධිකරණය අපරාධ වරදක් ලෙස යළි අර්ථකථනය කිරීම එහි පළමු පියවර ලෙස ක්‍රියාවට නංවනු ඇත.

13. දිගු කාලීනව ගෙවුම් ශේෂ හිඟය අඩු කිරීම අවශ්‍ය බැවින්, ආනයන ආදේශන කර්මාන්ත ආරම්භ කිරීම, ආහාර නිෂ්පාදනයේ ස්වයංපෝෂිත ඉලක්කයක් සම්පූර්ණ කිරීම, සමාගම්වල ප්‍රචාරණ ක්‍රියාවලීන් හරහා

හසුරුවනු ලබන ජනතාවගේ ආහාර පරිභෝජන රටාවන් තාර්කිකකරණය කිරීම ඇතුළු ක්‍රියාමාර්ග හරහා රටේ ආනයන වියදම අඩු කළ හැකිවන සේ ප්‍රායෝගික සහ විද්‍යාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ.

## රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රය

14. රාජ්‍ය මූල්‍ය අර්බුදය උග්‍ර කිරීමට බලපෑ හැකි රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණ වැඩසටහන වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර පාඩු ලබන රාජ්‍ය ආයතන එසේ වීමට හේතු සොයා බලා ඒවා යළි යථා තත්වයට පත් කිරීමටත්, පොදුවේ රාජ්‍ය ආයතන විනාශ වීමට වගකිව යුතු සියල්ලන් පිළිබඳ විධිමත් විමර්ශනයක් හරහා දඬුවම් ලබා දීමටත් ක්‍රියා කරනු ලැබේ.
15. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී සමානාත්මතා පදනම ක්‍රියාත්මක කිරීම සහ කම්කරු අරමුදල්වලට සිදු වූ අසාධාරණය ආපසු හරවන අතර ඒ සඳහා කම්කරු නියෝජනයක් ද සහිත ක්‍රමවේදයක් නිර්මාණය කරනු ලැබේ.

16. නොගෙවා පැහැර හැර ඇති රුපියල් ට්‍රිලියනයකට අධික බදු මුදල් යළි අය කර ගැනීම, ධනපතියන්ට දෙන බදු සහන සීමා කිරීම ආදී ක්‍රියාමාර්ග හරහා පොදු ජනයා මත පටවා ඇති බදු බර ලිහිල් කරමින් රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

17. දැනට 15:85 ලෙස පවතින සෘජු බදු - වක්‍ර බදු අතර අනුපාතය වසරක් තුළ 40 : 60 අනුපාතයටත් වසර 5ක් තුළ 50 : 50 අනුපාතයටත් ගෙන ඒමට කටයුතු කරනු ලැබේ.

18. පළමු පියවරේ දී වැට් බද්ද සැලකිය යුතු මට්ටමකින් පහත හෙළා, සමාජ ආරක්ෂණ බද්ද අහෝසි කර, ආහාර - ඖෂධ - සනීපාරක්ෂක ද්‍රව්‍ය - පාසල් උපකරණ ඇතුළු තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ලැයිස්තුවක බදු මුළුමනින් අහෝසි කර, සහනයක් ලබාදීම සහතික කෙරේ. ඒ සඳහා අවශ්‍ය මුදල සෘජු බද්දෙන් උපයා ගැනීම.

19. ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සංයුක්ත වන සෘජු බද්දේ ඉහළ වැටුප් මත අය කරන 'උපයන විට බද්දේ' කොටස අඩු කර ප්‍රාග්ධනය හා ලාභ මත කොටස වැඩි

කිරීමට පියවර ගනු ලැබේ. ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසායන් ආරක්ෂා කිරීම සඳහා ඒවාට පූර්ණ බදු සහනයක් ලබා දී, මධ්‍යම පරිමාණ හා මහා පරිමාණ ව්‍යවසායන් සඳහා ලාභ අනුපාතිකය වැඩිවන ප්‍රමාණයට සමානුපාතිකව බදු අනුපාතය වැඩි වන අනුක්‍රමික බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලැබේ.

20. ලබාදී ඇති බදු සහන පිළිබඳ පූර්ණ විමර්ශනයක් සිදු කර එය සාධාරණ පදනමකින් නැවත සකස් කිරීම. 2023 වසරේ ලබාදී ඇති බදු සහනවලින් 43%ක් විදේශීය සමාගම්වලටත්, 57%ක් දේශීය ඒකාධිකාර සමාගම්වලටත් ලබාදී ඇති අතර එය වහාම අත්හිටුවනු ලැබේ.

21. කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය සමයේ අධික ලෙස ලාභ ලැබූ සමාගම් පිළිබඳ විමර්ශනයක් කර, එම කාලයේ දී ආර්ථික වශයෙන් විනාශ වූ නිෂ්පාදකයන් සහ ශ්‍රමිකයන් හට වන්දි ගෙවීම සඳහා ඉහත කී සමාගම්වලට විශේෂ බද්දක් හඳුන්වා දීමට පියවර ගනු ලැබේ.

22. සුපිරි ධනවතුන් ඉලක්ක කරගත් දේපළ බද්දක් හඳුන්වා දෙන අතර යම් සීමාවකින්

ඉහළ දේපළ හිමිකාරීත්වයන් සඳහා අනුක්‍රමික ප්‍රතිශත පදනම් කරගත් දේපළ බදු ක්‍රමයක් සකස් කරනු ඇත.

23. ඩිජිටල් මුදල් හුවමාරු ක්‍රම ප්‍රචලිත කිරීම හරහා බදු දැලෙන් රිංගා යාම වැළැක්වීමටත්, විවිධාකාර මූල්‍ය විෂමාචාර අවම කිරීමටත් කඩිනම් පියවර ගනු ලැබේ. මූල්‍ය ගනුදෙනු ඩිජිටල්කරණයේ දී ජනතාවගේ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතියට හානි නොවන ලෙස එය සිදු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරනු ඇත.

## ජනතාවට සහන

24. පොදු ප්‍රවාහනයට ඉන්ධන කෝටාවක් අඩු මිලට ලබාදීම ආදී ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම හරහා ජනතාවගේ ජීවන බරට විසඳුම් සම්පාදනය කෙරේ.

25. ගොවීන්, ධීවරයන් ඇතුළු සුළු නිෂ්පාදකයන්ට බලශක්ති කෝටාවක් අඩු මිලකට ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබේ.

26. අවම සහතික මිල වැඩපිළිවෙළ, නිෂ්පාදනයට දිරි දීමනා ලබාදීමේ වැඩපිළිවෙළ ආදී

වශයෙන් ගොවීන්, ධීවරයන් ඇතුළු සුළු නිෂ්පාදකයන් හට රාජ්‍ය රැකවරණය ලබාදීම ඉලක්ක කරගත් වැඩපිළිවෙළක් හරහා ආහාරවල නිෂ්පාදන පිරිවැය පහත හෙළීමට කටයුතු කරනු ලැබේ.

27. ගොවිතැන ආනයනික කෘෂි යෙදවුම් මත රඳා පැවතීම අවසන් කිරීම සඳහා නව ක්‍රමවේද භාවිතය, ගොවීන් සහ ධීවරයන් සඳහා අවශ්‍ය උපකරණ තීරු බදු රහිතව ලබාදීම ආදිය හරහා ආහාර මිල පහත හෙළීමට පියවර ගනු ලැබේ.

28. සත්ව හානි, දේශගුණ විපර්යාසයේ ප්‍රතිඵල ඇතුළු පාරිසරික උපද්‍රව හා වෙනත් එවැනි ක්‍රමවලින් සිදුවන වගා හානි අවම කිරීමේ වැඩපිළිවෙළක් සහ ඊට අදාළ සමාජමය රක්ෂණ ක්‍රමයක් සකස් කරනු ලැබේ.

29 සේනක බිබිලේ ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවමින්, අත්‍යවශ්‍ය ඖෂධ ලංකාවේම නිෂ්පාදනය කිරීමේත්, අත්‍යවශ්‍ය ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සඳහා මිල පාලනයක් ඇති කිරීමේත් ක්‍රියාමාර්ග හරහා සෞඛ්‍ය සේවය සඳහා ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීමට පියවර ගනු ලැබේ.

### ජනතාවගේ ප්‍රතිපත්තිය

30. අතරමැදියාගේ සූරාකෑමෙන් ජනතාව මුදා ගැනීමේ වගකීම රජය විසින් භාරගෙන, ඒ සඳහා මැදිහත් වන පූර්ණ බලැති ජන සහභාගී ව්‍යුහයක් ස්ථාපිත කර, නිෂ්පාදන සඳහා සහතික මිලක් නීතිගත කිරීම තවදුරටත් පුළුල් කිරීම, මිල පාලන නීති උපරිමයෙන් ක්‍රියාවට නැංවීම සහ නිෂ්පාදනවල ගුණාත්මක භාවය සහ ප්‍රමිතිය සහතික කිරීම ඇතුළු විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගනු ඇත.

## කම්කරු ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් බහුතරය අවිධිමත් ක්ෂේත්‍රවල රැකියාව කරන්නන් ලෙස සැලකේ (මුළු ශ්‍රම බලකායෙන් 67%ක් පමණ). ශ්‍රී ලංකාවේ කම්කරුවන් අභියෝග කිහිපයකට මුහුණ දෙන අතර දශක ගණනාවක් තිස්සේ කම්කරුවන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමට රජය අසමත් වී ඇත. එබැවින්, කම්කරුවන් ශක්තිමත් කිරීම, ආරක්ෂා කිරීම, රටේ වර්ධනයට සක්‍රියව දායක වන ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සහ පුහුණු කිරීම සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති සහ

නිර්දේශ යෝජනා කරනු ලැබේ.

31. වත්මන් රජය ශ්‍රම බලකාය තවදුරටත් අවිධිමත් කිරීමට තල්ලු කිරීම, කම්කරුවන් සඳහා වන සියලු ආරක්ෂණ ඉවත් කිරීම, රැකියා සුරක්ෂිතභාවය අවදානමේ හෙළීම ඇතුළු ලක්ෂණ සහිත නව කම්කරු නීතියක් යෝජනා කර ඇත. රට තුළ දැනට පවතින සියලුම කම්කරු නීති සමාලෝචනය කර කම්කරු නීතිවල ධනාත්මක වර්ධනයක් සඳහා සියලුම පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡාවක් ආරම්භ කළ යුතුය. එහි දී ප්‍රතිපත්තියක් ලෙස ශ්‍රමය අවිධිමත් කිරීම අධෛර්යමත් කරන අතර අවිධිමත් සේවකයන්ට විධිමත් සේවකයන්ට සමාන ව්‍යවස්ථාපිත ආරක්ෂාවක් ලබා දෙනු ඇත. උදාහරණයක් ලෙස ගෘහ සේවක සේවිකාවන් EPF, ETF සහ රාජ්‍ය අනුග්‍රහය ලබන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා හිමිකම් ඇති 'සේවකයන්' කාණ්ඩයක් ලෙස හඳුනා ගැනීම, කම්කරු නීති ප්‍රතිසංස්කරණවලට වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ නීති, සේවා ස්ථාන හිරිහැර විරෝධී නීති සහ සේවා ස්ථානයේ වෙනස්කම් කිරීම් විරෝධී නීති සම්මත කිරීම ද ඇතුළත් වනු ඇත. ඊට

අමතරව සේවකයෙකු රැකියාවෙන් ඉවත් කිරීමේ දී, කම්කරු දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන විමර්ශනයේ දී අදාළ සමාගම අසාධාරණ ක්‍රියාවක් සිදු කර ඇති බවට අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීම් අත්හිටුවීමට කම්කරු දෙපාර්තමේන්තුවට ඇති නෛතික බලතල වැඩි කිරීම ඇතුළු නීතිමය පදනම් ශක්තිමත් කෙරේ. ඊට අමතරව කම්කරුවන්ට සිදුවන අසාධාරණයන් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ නඩු පැවරීමේ අංශයක් ඇති කරනු ලැබේ.

32. ලංකාවේ වෘත්තීය සමිතියක සංවිධානය වූ කම්කරු අනුපාතය 10%ට වඩා අඩු බැවින්, පුහුණු වැඩසටහන්, කම්කරු අධ්‍යාපන ප්‍රවේශ වැඩසටහන් සහ අනිවාර්ය සාමූහික ගිවිසුම් හරහා වෘත්තීය සමිති සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීමට රජය මැදිහත් වනු ඇත. සිය සේවකයන්ගෙන් 40%ක් වෘත්තීය සමිතිවල සාමාජිකයන් වන සමාගම් සඳහා සාමූහික ගිවිසුම් ඇති කර ගැනීම් විධිමත් කෙරේ.

33. අසනීප නිවාඩු ව්‍යවස්ථාපිත නිවාඩු තුළට ඇතුළත් කරනු ලබන අතර ස්ත්‍රී කම්කරුවන්ට

අසනීප නිවාඩු හිමිකමේ කොටසක් ලෙස 'ඔසප් නිවාඩු' හිමිවීම සහතික කරනු ඇත.

34. දරුවන් සිටින කාන්තාවන් සඳහා රැකියා ස්ථාන අසල ළමා නිවාස, රාත්‍රී සේවයේ යෙදෙන කාන්තාවන් සඳහා ප්‍රවාහන පහසුකම්, සාප්පුවල සේවය කරන සියලුම කාන්තාවන්ට අනිවාර්ය වැසිකිළි පහසුකම් ඇතුළුව ශ්‍රම බලකායට බැඳීමට කාන්තාවන් දිරිමත් කිරීමේ අරමුණ ඇතිව ශක්තිමත් නෛතික ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇත.

35. නිෂ්පාදන හා සේවා අංශයේ සේවකයන් සඳහා අඩු පොලී අනුපාත සහිත විශේෂ නිවාස ණය යෝජනා ක්‍රම ලබා දෙන අතර මෙම යෝජනා ක්‍රමය විධිමත් හා අවිධිමත් කම්කරුවන් සඳහා ව්‍යාප්ත කෙරේ.

36. නිෂ්පාදන හා සේවා අංශයේ සේවකයන් උසස් අධ්‍යාපනයේ යෙදීමට දිරිගැන්වීම සඳහා සේවා අවශ්‍යතා සමග සම්බන්ධ පාඨමාලා සහිත තාක්ෂණික පුහුණු පාසල් පිහිටුවීම, සන්ධ්‍යා පාසල් ඇතුළු කම්කරුවන් සඳහා වන වැඩිදුර අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම ආදිය සඳහා රජය මැදිහත් වනු ඇත.

37. EPF/ ETF අරමුදල් කම්කරුවන්ගේ විශ්‍රාමික වයසේ අවශ්‍යතාවලට ගැළපෙන සේ

ප්‍රතිව්‍යුහගත කිරීම.

38. වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප රු. 2000 කිරීමටත්, වතු සමාගම් සහ වෘත්තීය සමිති අතර සාමූහික ගිවිසුම් පිළිබඳ සාකච්ඡා එම පදනමෙන් නැවත ආරම්භ කිරීමටත් කටයුතු කරනු ලැබේ.

39. ධීවරයන්ට භූමිතෙල් සහනාධාර ලබා දෙන අතර, ඊට අමතරව කුඩා පරිමාණ ධීවරයන්ගේ මසුන් ඇල්ලීමේ භාවිතයන් ඉන්ධන මතම යැපීම වෙනස් කිරීම සඳහා උත්සාහ කරනු ඇත. ගෝලීය වශයෙන් පවතින නව තාක්ෂණය හඳුන්වා දීමත් සමඟ මෙය අනුක්‍රමිකව සිදු කෙරෙනු ඇත.

40. මුහුදු යාම අනතුරුදායක වන දිනවල දී ධීවරයන්ට ආදායම නැතිවීමේ අවදානමට රාජ්‍ය ආරක්ෂණයක් ලබා දෙනු ඇත.

41. කුඩා පරිමාණ මසුන් ඇල්ලීම දිරිමත් කිරීම සහ කුඩා පරිමාණ ධීවරයන් සඳහා ශක්තිමත් වෙළෙඳපොළ සහ අපනයන අවස්ථා නිර්මාණය කිරීම ඉලක්ක කරගත් රාජ්‍ය ප්‍රතිපත්තියක් සකසනු ඇත.

42. වෙළෙඳපොළ උච්චාවචනයන් නොතකා ගොවීන්ගේ නිෂ්පාදන සඳහා සහතික මිලක් නියම කර ආහාර ස්වෛරීභාවය සහ ආහාර

තිරසරභාවය පිළිබඳ ප්‍රතිපත්තියේ කොටසක් ලෙස කුඩා පරිමාණ ගොවීන් සහ ඔවුන්ගේ ගොවිබිම් ආරක්ෂා කරනු ඇත.

## වැටුප් ප්‍රශ්නය විසඳීම

43. රාජ්‍ය - අර්ධ රාජ්‍ය - පෞද්ගලික - වතු ආදී සියලු ක්ෂේත්‍රවල වැටුප් විෂමතා තුරන් කිරීමේ කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.
44. අවම වැටුප නියම කිරීම - දැනට අවම වැටුප රු. 16,000/- වන අතර එය ප්‍රමාණවත් නොවන බැවින්, පාරිභෝගික මිල දර්ශකය සහ ජීවන වියදම යන දර්ශක මත පදනම්ව සෑම වසර 2කට වරක් අවම වැටුප සංශෝධනය කිරීමට කටයුතු කරනු ඇත. පළමු පියවර ලෙස පවුලක් නඩත්තු කිරීමට අවශ්‍ය අවම ආදායම සම්බන්ධයෙන් පවතින නිල දත්ත මත පදනම්ව අවම වැටුප රු. 57,500/- දක්වා ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.
45. ජාතික වැටුප් කොමිසමක් පත්කර අවම වැටුප් තල සහ වාර්ෂික වැටුප් වර්ධක පිළිබඳ රාජ්‍ය නිර්ණායක සකස් කිරීමට කටයුතු කරනු

ලැබේ. රාජ්‍ය - අර්ධ රාජ්‍ය - පෞද්ගලික - වතු ආදී ක්ෂේත්‍ර පමණක් නොව කොන්ත්‍රාත් - අනියම් - මෑන් පවර් - බයිබැක් කරන ලද ශ්‍රමය - ගෘහ සේවය ඇතුළු අසංවිධිත ශ්‍රම ක්ෂේත්‍ර ද වැටුප් කොමිසමේ විෂය ක්ෂේත්‍රයට ඇතුළු කරනු ලැබේ.

46. රාජ්‍ය, පෞද්ගලික සහ වතු අංශවලට වහාම ජීවන වියදමට සරිලන වාර්ෂික වැටුප් වැඩි වීමක් සඳහා වැටුප් සූත්‍රයක් සකස් කර කම්කරුවන්ගේ ජීවන මට්ටම් කඩා වැටීම නැවැත්වීමට පියවර ගනු ඇත.

47. පෞද්ගලික සහ වතු අංශවල සේවකයන්ට අවම වැටුප් තල යළි නිර්ණය කිරීම සහ විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීමට වහාම කටයුතු කරනු ලැබේ.

48. සියලු වෘත්තීය ක්ෂේත්‍රවල ගෞරවය සුරැකෙන සේ ඒවායේ ශ්‍රේණිගත කිරීම්, වෘත්තීය නාමකරණය සහ වැටුප් තල යළි සමාලෝචනය කර ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට පියවර ගනු ලැබේ.

## වංචා - දූෂණ තුරන් කිරීම

49. වත්කම් ප්‍රකාශන පනතක් මගින් යම් සීමාවකින් ඔබ්බෙහි පවතින සියලු වත්කම් පිළිබඳ තොරතුරු රජය සතු කර ගැනීම සඳහාත්, හෙළිදරව් නොකරන වත්කම් රාජසන්තක කිරීම සඳහාත් නීතිමය රාමුවක් ශක්තිමත් කරන අතර, එම වත්කම් සහ ඒවා රැස් කරගත් ආකාරය පිළිබඳ තොරතුරු ජනතාවට විවෘත කිරීම. එහිදී දීර්ඝ කාලයක් තිස්සේ නිරාවරණය නොවූ දේශපාලකයන්ගේ, රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ, පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන්ගේ වත්කම් සියල්ල අධීක්ෂණයට ලක් කිරීමට පියවර ගනු ඇත. දැනට අවධානය යොමු නොවන වාණිජ ක්ෂේත්‍රයේ දූෂණ (corporate corruption) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

50. ජනතාවගේ සහභාගීත්වය සහිත, පූර්ණ බලැති දූෂණ කොමිසමක් ස්ථාපිත කර දැනට පිළිලයක් ලෙස සියලු ක්ෂේත්‍ර පුරා පැතිර යන දූෂණ තුරන් කිරීමට කඩිනම් පියවර ගනු ලැබේ.

51. පසුගිය වකවානුවේ දේශපාලන බලපෑම්

හේතුවෙන් අල්ලස් කොමිසම විසින් ඉල්ලා අස්කර ගත් සහ නීතිපතිවරයා විසින් සාක්ෂි ප්‍රමාණවත් තරමින් නැති බව පැවසීම නිසා චූදිතයන් නිදොස් කොට නිදහස් කරනු ලැබූ අල්ලස් - වංචා - දූෂණ පිළිබඳ නඩු සියල්ල පුළුල් සමාලෝචනයකට ලක්කර ඒවා සම්බන්ධ කඩිනම් යුක්තිය ඉටු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.

## ආර්ථිකය යළි පණගැන්වීමේ ක්‍රියාමාර්ග

52. ආර්ථිකය හකුළුවාලීමේ මූල්‍ය අරමුදලේ වැඩසටහනෙන් ඉවත් වී නිෂ්පාදනය පුළුල් කිරීමට මැදිහත් වීම.

53. කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයා යළි නගා සිටුවීම සඳහා උපායමාර්ගික සැලසුමක් සකස් කර, නූතන තාක්ෂණය සහ වෙළෙඳපොළ සමීප කරවීමේ වැඩසටහනක් ද, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය වෙළෙඳ සහ හස්ත කර්මාන්තවලට සීමා වී ඇති වත්මන් පසුගාමී තත්වයෙන් එම ක්ෂේත්‍රය මුදවා ගෙන කාර්මිකකරණය කිරීමේ වැඩසටහනක් ද, දැනට බිඳ වැටී ඇති සුළු

හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වන්දි ගෙවීමේ සහ සංවර්ධන බැංකු ක්‍රමයක් හරහා සහන ණය සැපයීමේ වැඩසටහනක්ද සැකසීම.

54. පරාටේ නීතිය තාවකාලිකව අත්හිටුවීම වෙනුවට එය සම්පූර්ණයෙන් අහෝසි කිරීම සහ දැනට ගෙවාගත නොහැකිව සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ණයවලින් තෝරාගත් කොටසක් කපා හැරීමට පියවර ගනු ලැබේ. ඒ සඳහා අක්‍රිය ණය ලෙස නම්කර ඇති ධන කුවේරයන්ගේ ණය යළි අය කර ගැනීම සඳහා වන නෛතික ක්‍රියාමාර්ග හරහා අරමුදලක් සකස් කරනු ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් අසාධාරණ පොලී අනුපාතවලින් ආරක්ෂා කර ගැනීම සඳහා පියවර නීතිගත කරන අතර ණය ගෙවීම අපහසු වීමට අදාළ සමාජ රක්ෂණ ක්‍රමයක් සකස් කරනු ලැබේ.

55. සියලු නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ ද්විපාර්ශ්වික ගිවිසුම් යළි සමාලෝචනය කර සුළු නිෂ්පාදකයා රැක ගැනීමේ තීරුබදු රැකවරණ කියල්ල ස්ථාපිත කළ යුතුය.

56. ක්ෂුද්‍ර මූල්‍ය ණය අහෝසි කිරීම සහ එමගින් මූල්‍ය පද්ධතියට වන බලපෑම අවම කිරීම

සඳහා ධනවතුන්ගේ අක්‍රිය ණය සියල්ල අය කර ගැනීම.

57. සැලසුම්සහගත ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කිරීම මගින් දැනට සක්‍රිය කළ නොහැකි ක්ෂේත්‍රවල ශ්‍රමිකයන් වෙනත් ක්ෂේත්‍රවලට උරා ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම. (නිදසුනක් ලෙස ඉදිකිරීම් කර්මාන්තය, ඇතැම් මූල්‍ය සේවා වැනි ක්ෂේත්‍රවල බුබුළු නැවත ඇති කිරීම වෙනුවට එම ක්ෂේත්‍රවල සේවයේ නිරතව සිටි ශ්‍රමිකයන් වෙනත් ක්ෂේත්‍රවල සේවයේ නියුක්ත කරවීමේ සැලැස්මක් සකස් කිරීම)

58. ආර්ථිකය පුළුල් කිරීමේ දී ආහාර සුරක්ෂිතතාව සහ ආහාර ස්වෛරීත්වය ආරක්ෂා කිරීමට ප්‍රමුඛතාව ලබා දෙමින් කෘෂිකර්මාන්තයට, ධීවර කර්මාන්තයට සහ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමේ වැඩසටහනක් කඩිනමින් සකස් කරනු ඇත. නිදසුනක් ලෙස රටේ කිරි නිෂ්පාදනය කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර තාක්ෂණය සහ මාර්ගෝපදේශ ලබාදෙන මහජන අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීම, අවම ආදායම් මට්ටමක් සහතික කිරීම,

නිෂ්පාදිත මිලට ගැනීම සඳහා කිරි ගොවි සමූපකාර ක්‍රම සැකසීම, රජයේ ගොවිපොළ හරහා මැදිහත්වීමක් කිරීම වැනි සැලසුමක් හරහා කිරි අවශ්‍යතාව සම්පූර්ණයෙන් සපුරා ගැනීමේ ඉලක්කයට ගමන් කරනු ඇත. දැනට සමස්ත ආනයන වියදමෙන් 7%ක් පමණ වන ආහාර ද්‍රව්‍ය ආනයන වියදම් අඩු කර ගැනීමට පියවර ගනු ඇත.

## (ඇ) මහජන සේවාවන් ශක්තිමත් කිරීම

රජය විසින් ජනතා බදු මුදලින් රාජ්‍ය සුබසාධන සේවාවන් පවත්වාගෙන යාම ධනවාදය සහ සමාජවාදය තුළ සිදු කෙරෙන්නේ වෙනස් වැඩපිළිවෙළ හා වෙනස් අරමුණු තුළය. නව ලිබරල් ධනවාදී ආකෘතියට පෙර පැවතුණු රාජ්‍ය ඒකාධිකාර ධනවාදය තුළ රජය මැදිහත් වී සුබසාධන සේවා පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණ වූයේ සමාජයේ ක්‍රය ශක්තිය හෙවත් මිල දී ගැනීමේ හැකියාව පවත්වාගෙන යාමයි. නමුත් එමගින් ප්‍රාග්ධනය ඇතැම් ක්ෂේත්‍රවලට ඇතුළු වී ක්‍රියාකාරී වීමට බාධා පැමිණෙවේ. එය ප්‍රාග්ධන සමුච්ඡගතකරණ ක්‍රියාවලිය අඩාළ කර ආර්ථික අවපාත ඇති කරයි. 1973 ආර්ථික අර්බුදය මෙවැනි අර්බුදයක ප්‍රකාශනයක් වන අතර නව ලිබරල් ධනවාදය තුළ සියලු ක්ෂේත්‍ර ප්‍රාග්ධන සමුච්ඡගතකරණ ක්‍රියාවලිය සඳහා විවෘත කරයි.

නව ලිබරල් ධනවාදයේ දෙවන ඉනිම තුළ ප්‍රාග්ධන සමුච්ඡගතකරණයේ ප්‍රධාන මාර්ග යක් වන්නේ සමාජ ආරක්ෂණ සේවා, රාජ්‍ය සුබසාධන සේවා, මහජන අරමුදල් ආදිය ප්‍රාග්ධන ක්‍රියාවලියට උකහා ගැනීමක්, 'අසන්තකය හරහා සමුච්ඡගතකරණය' බව දැන් පිළිගැනේ. පොදු

සමාජ ආරක්ෂණ සේවා අහෝසි කර අන්ත දිළින්දන් ලෙස හඳුනා ගන්නා අතළොස්සකට පමණක් 'සමාජ ආරක්ෂණ දැලක්' නිර්මාණය කිරීමේ යෝජනාව එන්නේ ඒ අනුවය.

නමුත් සමාජවාදය තුළ සමාජ ආරක්ෂණ වනාහී සියල්ලන්ටම මූලික අවශ්‍යතාවල අවම පරිසාදන මට්ටමක් සහතික කිරීම, සමාජ විෂමතාව අවම කිරීම, ආර්ථිකය විසින් උත්පාදනය කරන නව වටිනාකම් සමාජය සන්තක කිරීමේ ක්‍රමයක් ආදී වශයෙන් භාවිත වන්නකි. එමෙන්ම කේවල පුද්ගලයාගේ රැකවරණය පිළිබඳ වගකීමක් සමාජය විසින් උසුලනු ලබන සාමූහික සමාජ භාවිතවක් අභ්‍යාස කිරීමකි. සමාජ ආරක්ෂණ සේවා වෙළෙඳපොළකරණය කිරීමට එරෙහිව ඇති අපගේ කෙටිකාලීන වැඩපිළිවෙළ ආර්ථික යුක්තිය ස්ථාපිත කිරීමේත්, සාමූහික සමාජමය වගකීම ප්‍රවර්ධනය කිරීමේත් මාර්ගයක් බැවින් එය නැවත අපගේ දිගු කාලීන වැඩපිළිවෙළෙහිම කොටසකි.

**සමාජ ආරක්ෂණ සේවා**

59. රාජ්‍ය අයවැයේ මිලිටරි වියදම් අවම කිරීම, බදු පැහැර හැරීම් සහ බදු වංචා හරහා අහිමි වූ මුදල් යළි අත්පත් කර ගැනීම යනාදී

ක්‍රියාමාර්ග හරහා ලබා ගන්නා මුදල්වලින් සමාජ ආරක්ෂණ අරමුදලක් සකස් කර සමාජ ආරක්ෂණ සේවාවල ප්‍රතිපාදන වැඩි කිරීමට කටයුතු කරනු ලැබේ.

60. අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් 6%ක් වෙන් කිරීමේ අනිවාර්යතාව පිළිගනිමින්, ප්‍රථම පියවරක් ලෙස දැනට අධ්‍යාපනය සඳහා සහ සෞඛ්‍ය සේවය සඳහා කරන වියදම දෙගුණ කිරීමට කටයුතු කළ යුතුය.

61. අධ්‍යාපනය පෞද්ගලිකකරණය කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සහ නව විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත ආදිය වහාම අහෝසි කර, පහත මූලධර්ම මත පදනම් වූ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් කෙටි කලක් තුළ නිර්මාණය කිරීම සහ වැඩි කරන ප්‍රතිපාදන හරහා එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීමට වගකියන ජන සහභාගී ව්‍යුහයක් පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(i) අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් බවට පත්වීම වැළැක්වීම හා අධ්‍යාපනයට සියලු දෙනාට සම ප්‍රවේශ අවස්ථා සහතික කිරීම.

(ii) සියලු සුදුසුකම් ඇති අය ආවරණය වන සේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම.

(iii) සදාචාරවත්, කායික සහ මානසික වශයෙන් සෞඛ්‍ය සම්පන්න, නිපුණතා වර්ධනය කරගත්, නිර්මාණශීලී, පරිසරය සහ සමාජය පිළිබඳ වගකීම්සහගත, සුසමාහිත පෞරුෂයකින් යුතු පුරවැසියෙකු ගොඩනැගීම අරමුණු කරගෙන විෂයමාලා සංවර්ධනය සිදු කිරීම.

(iv) ලොව විවිධ දැනුම් ක්ෂේත්‍රවල සිදුවන වර්ධනයන් අත්පත් කර ගැනීම සහ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල නිපුණතා සිසුන් තුළ වර්ධනය කිරීම.

62. ප්‍රථම වසර දෙක තුළ ප්‍රමාණවත් ප්‍රාග්ධන වියදමක් පාසල් පද්ධතිය සඳහා වෙන් කර, වරින් වර විවිධ පුද්ගල රුචිකත්වයන් මත ස්මාර්ට් පන්ති කාමර වැනි සංකල්ප අවිධිමත් ලෙස හා ඵලදායී නොවන ලෙස උත්තරාරෝපණය කිරීම වෙනුවට වැසිකිළි - ජලය - විදුලිය - අන්තර්ජාල පහසුකම් - පරිගණක පහසුකම් - විද්‍යාගාර - පුස්තකාල - ක්‍රීඩා පහසුකම් ආදී මූලික පහසුකම්වල අවම පරිසාධන මට්ටමක් සියලු පාසල්වලට ලබාදීමට කටයුතු කරනු ඇත.

63. දේශපාලන උවමනාවන් මත ප්‍රාදේශීය විශ්වවිද්‍යාල තව තවත් ආරම්භ කිරීම වෙනුවට

පවතින ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය වැඩෙන සමාජ උවමනාවන්ට ගැළපෙන සේ පුළුල් කිරීමේ යෝජනා සකස් කිරීමේ කොමිසමක් වහාම පත් කිරීමට කටයුතු කරනු ඇත. විවිධ විෂයන්ට අදාළ මෙන්ම විවිධ සංස්කෘතීන්ට අදාළ විශේෂඥතාව සහිත විශ්වවිද්‍යාල (නිදසුනක් ලෙස ක්‍රීඩා විශ්වවිද්‍යාලයක්, ආයුර්වේද හා දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයක් ආදී වශයෙන්) බිහි කිරීමට පියවර ගනු ඇත.

64. දැනට ලංකාවේ පර්යේෂණ සඳහා වන රාජ්‍ය ප්‍රතිපාදන දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.11%ක් තරම් අවම අගයක පවතින අතර එය කලාපයේ ඉන්දියාව (0.65%), පාකිස්තානය (0.2%), නේපාලය (0.3%) සමග සසඳන විට ඉතා අඩු අගයකි. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ සහ නවෝත්පාදන සොයාගැනීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සහ පර්යේෂණ සඳහා වන රාජ්‍ය ප්‍රතිපාදන ප්‍රථම පියවරක් ලෙස පර්යේෂණ සඳහා වන රාජ්‍ය ප්‍රතිපාදන දෙගුණ කිරීමට කටයුතු කරනු ඇත. පර්යේෂණ ගෝලීය ප්‍රාග්ධනයේ සහ ඒකාධිකාර සමාගම්වල ලාභ අරමුණු කරගත් පර්යේෂණ රටාවෙන් වෙනස් කර, ලංකාවේ ආර්ථිකයේත් - සමාජයේත් අවශ්‍යතා උදෙසා

ඉලක්කගත කරවනු ඇත.

65. විනාශ කෙරෙමින් යන තාක්ෂණික විද්‍යාල සහ කාර්මික විද්‍යාල පද්ධතිය යළි නගා සිටුවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පළමු වසර තුළ වෙන් කිරීම සහතික කරනු ඇත.

66. රෝග නිවාරණය, රෝග විනිශ්චය, මූලික ප්‍රතිකාර, වැඩිදුර ප්‍රතිකාර, ඖෂධ සහ වෛද්‍ය උපකරණ, රෝගීන් පුනරුත්ථාපනය, මහජන සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය යනාදී ක්ෂේත්‍ර ආවරණය කරගත්, සෞඛ්‍ය සේවය වෙළෙඳභාණ්ඩකරණයෙන් මුදා ගන්නා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් වහාම නිර්මාණය කර, සෞඛ්‍ය සේවය යාවත්කල් කිරීම සඳහා අවශ්‍ය පූර්ණ ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කරන අතර නිදහස් සෞඛ්‍ය සේවයේ පැවැත්මට හානිකර වන සියලු ක්‍රියාකාරකම් නීතියෙන් තහනම් කිරීමට කඩිනම් පියවර ගනු ඇත.

67. මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවය, පවුල් සෞඛ්‍ය සේවය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සේවය ඇතුළු රෝග නිවාරණ අංශය වත්මන් ඛේදජනක තත්වයෙන් මුදාගෙන වර්ධනය කිරීම සඳහා වසරක් තුළ කඩිනම් පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

68. ආර්ථික අර්බුදය විසින් ළමා මන්දපෝෂණය 26% දක්වා වැඩි වීමත්, ගැබිණි මව්වරුන්ගේ නීරක්තිය 33% සීමාව ඉක්මවා ඉහළ යාමත් සැලකිල්ලට ගෙන, තාවකාලික පියවරක් ලෙස එය අවශ්‍ය ගැබිණි මව්වරුන් සහ කුඩා දරුවන් සඳහා අත්‍යවශ්‍ය පෝෂණ ද්‍රව්‍ය අඩංගු ආහාර සලාකයක් මාසිකව ලබාදීම සඳහා වහාම පියවර ගනු ලැබේ.

69. සේවක හිඟයට කඩිනම් විසඳුම් සපයා රජයේ රෝහල්වල බාහිර රෝගී අංශ පස්වරුවේ පැය කිහිපයක් විවෘත කර තැබීම සහ රජයේ ඖෂධ ශාලා ජාලය යළි සක්‍රිය කර පුළුල් කිරීම හරහා දෛනික කුඩා ලෙඩ රෝග සඳහා නිදහස් සෞඛ්‍ය සේවා ප්‍රවේශය සහතික කිරීම.

70. මත්ද්‍රව්‍යවලට ගොදුරුවූවන් එයින් මුදා ගැනීම සඳහා කඳවුරුවල ගාල් කිරීම වෙනුවට ප්‍රජා සහභාගීත්ව සැලැස්මක් සකස් කිරීමටත්, අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සඳහා දැනට සිදු කෙරෙන ආකාරයට මිලිටරිය මැදිහත් කිරීම වෙනුවට සෞඛ්‍ය වෘත්තිකයන් සම්බන්ධ කිරීමටත් පියවර ගනු ඇත. මත්ද්‍රව්‍ය ජාවාරම මැඩීම සඳහා මතට තිත, යුක්තිය වැනි සංදර්ශන වෙනුවට එහි

මහා පරිමාණ ජාවාරම්කරුවන්, දේශපාලන අනුග්‍රහය ලබා දෙන්නන් ඉලක්ක කරගත් හා ඔවුන්ගේ ගෝලීය අපරාධ ජාලය සමග ඇති සබඳතා බිණ්ඩනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබේ.

71. සියලු දෙනාගේ මානසික යහපැවැත්ම ආරක්ෂා කිරීම, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, මානසික රෝග ඇතිවීමේ කොන්දේසි සමාජමය ලෙස පාලනය කිරීම, මානසික රෝගවලට ගොදුරුවූවන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, මානසික රෝගවලට ගොදුරුවූවන් සඳහා පූර්ණ නිදහස් සෞඛ්‍ය ආවරණයක් සැපයීම, රෝගීන් පුනරුත්ථාපනය සහ මානසික සෞඛ්‍ය පිළිබඳ ආකල්ප පරිවර්තනය කිරීම මගින් රෝගීන්ට මනෝ සමාජයීය ආ කවරණය සහතික කිරීම, මානසික රෝග යනු සුව කළ හැකි සාමාන්‍ය සෞඛ්‍ය ගැටලුවක් ලෙස සමාජගත කිරීම ආදිය සඳහා ප්‍රමුඛත්වය දෙන මානසික සෞඛ්‍යය පිළිබඳ ප්‍රතිපත්තියක් වහාම ක්‍රියාවට නංවනු ඇත. ලංකාවේ සියදිවි නසා ගැනීම් ඉතා ඉහළ අගයක පැවතීම (2020, 2021, 2022 වර්ෂවල දී ලංකාවේ ජනගහනයෙන් ලක්ෂයකට 15.6ක්

වශයෙන් සියදිවි නසාගැනීම් වාර්තා වූ අතර සියදිවි නසාගැනීම් එකට විස්සක් ලෙසින් ඊට තැත්කිරීම් වාර්තා වී තිබිණි.) සැලකිල්ලට ගෙන මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා කඩිනම් ප්‍රජා සහභාගී වැඩපිළිවෙළක් සකස් කරනු ඇත.

72. පළමු වසරේ දී පොදු ප්‍රවාහනය සඳහා වන ප්‍රතිපාදන දෙගුණ කර මගී ජනතාවගේ ආරක්ෂාව සහ ගෞරවනීය ප්‍රවාහනය සඳහා ඇති අයිතිය සුරක්ෂිත කරනු ලැබේ. පොදු ප්‍රවාහනය ඉක්මවා පෞද්ගලික ප්‍රවාහන ක්‍රම පෙරට ඒම විසින් උද්ගතව ඇති ඉන්ධන ආනයන වියදම ඉහළ යාම, රථ වාහන තදබදය විසින් විශාල මිනිස් පැය ප්‍රමාණයක් විනාශ වීම, පරිසර දූෂණය ආදී ගැටලු විසඳීමට කටයුතු කරනු ලැබේ. පොදු ප්‍රවාහනය ලාභදායී, කාර්යක්ෂම හා ආරක්ෂිත ප්‍රවාහන ක්‍රමයක් ලෙස වර්ධනය කිරීම දෛනිකව පෞද්ගලික වාහන භාවිතය අධෛර්යමත් කිරීමට බලපානු ඇත. ප්‍රවාහනය දියුණු කිරීම පමණක් නොව ප්‍රවාහන අවශ්‍යතාව අවම කිරීමේ අරමුණ ඇතිව පරිපාලනය විමධ්‍යගත කිරීම, පාසල් පද්ධතියේ විෂමතාව තුරන් කර ළඟම පාසල ප්‍රවර්ධනය කිරීම,

ආර්ථිකයේ ව්‍යාප්තියේ ඇති අසමානතා අවම කර වැඩකරන ජනතාවට සිය ප්‍රදේශ තුළම රැකියා උත්පාදනය කිරීම වැනි මධ්‍යගත සැලසුමක් සකස් කිරීමට පියවර ගනු ඇත.

73. සියලු දෙනාට රැකියාවක් හෝ යම් ජීවනෝපායක් හිමිකර ගැනීම අයිතියක් ලෙස ව්‍යවස්ථාවෙන් පිළිගෙන දිළිඳුම පවුල් නගා සිටුවීමේ වැඩසටහන්, විරැකියා දීමනාවක් ලබාදීම වැනි ක්‍රියාමාර්ග හරහා සමාජයෙන් ආන්තිකකරණය වූ කොටස් සඳහා වන සමාජමය ආරක්ෂාව වැඩි කිරීම සඳහා කඩිනම් පියවර ගනු ඇත.

74. වැඩි වූ ජීවන වියදම සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප් සහ වැඩිහිටි ජීවනාධාර දීමනා වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩි කරනු ලැබේ.

## බලශක්ති අර්බුදය විසඳීම

### විදුලි බල ක්ෂේත්‍රය

75. ජනතාවගේ බලශක්ති අයිතිය සහ රටේ බලශක්ති ස්වෛරීත්වය උදුරා ගන්නා නව විදුලි බල පනත වහාම අහෝසි කිරීම.

76. විදුලිය ලාභය අරමුණු කරගත් ව්‍යාපාරයක් නොව මහජන සේවාවක් ලෙස පිළිගෙන, එම පදනම මත බලශක්ති ක්ෂේත්‍රයේ රැඩිකල් හැරවුමක් සනිටුහන් කරන බලශක්ති ජාතික සැලැස්මක් සකස් කරනු ලැබේ. එහි දී දිගුකාලීන අඩු පිරිවැය ජනන සැලැස්මක් සහ විදුලි ක්ෂේත්‍රය සඳහා රාජ්‍ය සුබසාධනයක් සහිත ගාස්තු නිර්ණය ක්‍රමවේදයක් සකස් කරනු ඇත. අඩු විදුලි පරිභෝජනයක් සහිත අඩු ආදායම් කුටුම්බ සහ සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන සඳහා පහත කරුණු මත පදනම්ව විශේෂ සහන ලබාදීම සහතික කරනු ඇත.

(i) විදුලි ගාස්තු වහාම ක්‍රියාත්මක වන ලෙස අඩු කිරීම සහ 2023 වසරේ ලබාගත් අයුක්තිසහගත ලාභය නැවත විදුලි පාරිභෝගිකයන් අතර බෙදා හැරීම.

(ii) විදුලි සම්බන්ධතාවක් ලබා ගැනීමේ දී ලබාදෙන අත්තිකාරමේ පොලිය විදුලි පාරිභෝගිකයාගේ ගාස්තුවෙන් අඩු කිරීම.

(iii) මසකට ඒකක 30ට අඩු විදුලි පරිභෝජනයක් සහිත කුටුම්භවලට විදුලිය නොමිලේ ලබාදීම, මසකට විදුලි ඒකක 90ට අඩු කුටුම්භවලට ජල විදුලියේ පිරිවැය පමණක් අය කිරීම

සහ විදුලිය පරිභෝජනය වැඩි වීමේ දී විදුලි ගාස්තු සමානුපාතිකව වැඩි කරන නව විදුලි ගාස්තු සූත්‍රයක් හඳුන්වා දීම.

(iv) ප්‍රධාන සම්ප්‍රේෂණ පද්ධතියෙන් විදුලිය ලබාදීම නිවෙස් සඳහා මසකට විදුලි ඒකක 250කට සීමා කිරීම සහ ඊට වැඩි විදුලි පරිභෝජනයන් සඳහා සූර්ය පැනල වැනි ක්‍රම දිරිගැන්වීම සහ අඩු පොලී ණය ක්‍රම ඇතුළු ප්‍රවර්ධන වැඩසටහන් සකස් කරනු ලැබේ.

(v) කර්මාන්ත සඳහා අය කරන විදුලි ගාස්තුව කලාපයේ අනෙක් රටවලට සමාන්තර මට්ටමක පවත්වාගෙන යාම.

(vi) ජලාශවල මහා පරිමාණව සූර්ය පැනල සවි කිරීම, වනාන්තර කපා දමා සූර්ය පැනල සවි කිරීම, සංචාරක පක්ෂි පර්යටන මාර්ගවල සුළං විදුලි බලාගාරවලට අවසර දීම, කුඩා දියඇලි ආශ්‍රිත විශාල පරිසර විනාශයක් සිදුවන සේ ඉදි කරන බලාගාර ඇතුළු පරිසර සංහාරක විදුලි ජනන ක්‍රම වෙනුවට විකල්ප ක්‍රම ප්‍රවර්ධනය කිරීමට මැදිහත් වනු ඇත.

77. පුනර්ජනනීය බලශක්තිය භාවිතය සඳහා ඇති බාධාවන් ඉවත් කිරීමට, නිදසුනක් ලෙස කුඩා පරිමාණ පියැසි මත සූර්ය පැනල සවි

කිරීමේ ක්‍රියාවලියට අනුමැතිය ලබා ගැනීමේ දී දැනට ඇති කල්ගත වන සහ දුෂ්කර, එමෙන්ම අල්ලස් දූෂණවලට මග විවෘත කරන අකාර්යක්ෂම ක්‍රමවේදය වෙනුවට වඩා සරල නීතිමය ක්‍රමයක් සකස් කිරීමට පියවර ගනු ඇත.

78. පසුගිය කාලයේ ගල් අඟුරු මිලදී ගැනීමට අදාළව සිදුව ඇති වංචා පිළිබඳ පූර්ණ විමර්ශනයක් සිදුකර වගකිවයුත්තන්ට දඬුවම් දීම.

79. ලංකා විදුලිබල මණ්ඩලයට ඉන්ධන ලබාදීම බද්දෙන් නිදහස් කිරීම.

80. පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමට අදාළව එළඹ ඇති සියලු ගිවිසුම් සමාලෝචනය කර දූෂිත ක්‍රියාවලියට තිත තැබීම.

81. හදිසි විදුලිය මිලදී ගැනීම් ශූන්‍ය වන සේ විධිමත් හා විද්‍යාත්මක දිගුකාලීන විදුලිය උත්පාදන සැලැස්මක් සකස් කිරීම.

82. රටේ බලශක්ති ස්වෛරීත්වයට හානි වන සේ එළඹ ඇති සියලු ගිවිසුම් අවලංගු කිරීම.

## ඛනිජතෙල් ක්ෂේත්‍රය

83. ඛනිජතෙල් ක්ෂේත්‍රය ලාභය අරමුණු කිරීම වෙනුවට මහජන සේවාවක් ලෙස පිළිගැනීම.
84. ඉන්ධන සඳහා වන බද්ද අඩු කර පොදු ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය, ගොවිතැන, ධීවර වෘත්තීය ආදිය සඳහා සහන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම. පොදු ප්‍රවාහනය දියුණු කිරීම ඇතුළු ඉන්ධන පරිභෝජනය තාර්කිකකරණය කිරීමේ ව්‍යාපෘතියක් හරහා ඉන්ධන ආනයන වියදම සීමා කර පෞද්ගලික ඉන්ධන පරිභෝජනය ඉහළ යාම වැළැක්වීම සඳහා ඉන්ධන කෝටා ක්‍රමයක් හඳුන්වා දීම.
85. නිමි නිෂ්පාදන ආනයනය වෙනුවට බොරතෙල් පිරිපහදු කිරීමට ප්‍රමුඛතාව ලබාදීම. සපුගස්කන්ද පිරිපහදුව පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක කරවීම, එය පුළුල් කිරීම, තෙල් පිරිපහදුව ආශ්‍රිත අනෙකුත් කර්මාන්ත නැවත ආරම්භ කිරීම ඇතුළු ඉන්ධන අවශ්‍යතාව සැපිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම.
86. තීරු බදු රහිත වාහන ආනයනයට බරපතළ සීමාවන් පැනවීම.

87. ඉන්ධන ක්ෂේත්‍රය බහුජාතික සමාගම්වල ලාභ උල්පතක් කරන නව ඛනිජතෙල් සංශෝධන පනත වහාම අහෝසි කිරීම.

88. දැනට පෞද්ගලික සමාගම් සතු කර ඇති නැව්තෙල් ආදායම රජය සතු කර ගැනීම සඳහා පියවර ගැනීම.

89. ඉන්ධන බෙදා හැරීමේ ක්‍රියාවලියේදී සිදුකර ඇති වංචා පිළිබඳ විමර්ශනය කර එම මුදල් නැවත අය කර ගැනීම.

90. හෙජින් ගිවිසුම ඇතුළු විශාල මුදලක් රටට අහිමි කළ ගිවිසුම්වලට අදාළ වගකිවයුත්තන් නීතිය හමුවට පමුණුවා එම මුදල් යළි අය කර ගැනීම.

## (ඉ) ජාතික ගැටලුව

ලංකාව බහුජාතික ජාතික රාජ්‍යයකි. සිංහල, තමිල්, මුස්ලිම් හා කඳුකර තමිල් යනුවෙන් වූ ජාතික ජන කොටස් හා බර්ගර්, මැලේ වැනි ජාතික අනන්‍යතා සහිත ජන කොටස් මෙහි ජීවත් වේ. ලංකාවේ ධනවාදය තහවුරු වූයේ බ්‍රිතාන්‍ය දේශපාලනයේ හා ප්‍රාග්ධනයේ මැදිහත්වීමෙනි. උත්තරාරෝපිත වූ ලාංකේය ධනවාදය ආරම්භයේ පටන්ම පසුගාමී ස්වභාවයක් ගත්තේය. කාර්මිකකරණය ඉතා පහළ මට්ටමක පැවැති අතරම බ්‍රිතාන්‍ය ප්‍රාග්ධනයේ මැදිහත්වීමෙන් ලාංකේය නිෂ්පාදන සබඳතා ධනේශ්වර ආර්ථික පදනමකට ගෙන එන ලදී.

ආර්ථික ක්ෂේත්‍රයේ පැවැති පසුගාමී තත්වයෙහි පරාවර්තනයක් අනෙකුත් ක්ෂේත්‍රවලද දක්නට ලැබුණි. එනිසාම සමහර ධනේශ්වර රටවල ධනේශ්වර සංවර්ධනයේදී සැලකිය යුතු මට්ටමකින් විසඳාලූ ජාතික ප්‍රශ්නය, කාන්තා පීඩනය සම්බන්ධ ගැටලු තවදුරටත් නොවිසඳුණු ධනේශ්වර කර්තව්‍යයන් වශයෙන් ඉතිරිව පවතී. ජාතික පදනමින් සිංහල, තමිල් හා මුස්ලිම් ජනතාව බෙදා වෙන්කොට පාලනය කිරීමේ උපක්‍රමය සිංහල ජනතාව උඩරට හා පහතරට යනුවෙන් වූ බෙදීමක්

දක්වා ද ගෙනයාමේ උපක්‍රමයක් බ්‍රිතාන්‍ය පාලනය විසින් ක්‍රියාත්මක කරන ලදී.

ඊනියා නිදහසින් පසුව බලයට පත් දේශීය ධනේශ්වර පංතිය බ්‍රිතාන්‍යයන් විසින් අනුග මනය කරන ලද උපක්‍රමික මැදිහත්වීමේ දැනුවත් අතකොළු වෙමින් ජාතික පීඩනය තම දේශපාලන බල ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ලදී. ජාතික ජන කොටස් අතර බහුතරය සිංහල වීම පදනම් කරගනිමින් බලයට පත් සෑම ධනේශ්වර දේශපාලන පක්ෂයක් හෝ සන්ධානයක් විසින්ම ධනේශ්වර රාජ්‍ය පාලනය පවත්වා ගැනීමේ දී තම පක්ෂ බල ව්‍යාපෘතිය තහවුරු කරගැනීම සඳහා ජාතිවාදය ප්‍රබල දෘෂ්ටිවාදයක් වශයෙන් අඛණ්ඩව භාවිතයට ගන්නා ලදී. එනිසාම සිංහල ජනතාවට නැති සුළුතර ජාතික ජන කොටස්වලට පමණක් ඇති ජාතික පීඩනය ඊනියා නිදහසින් පසු ක්‍රමානුකූලව වර්ධනය වූවා මිස එහි පහව යාමක් සිදු වූයේ නැත.

මෙයට ප්‍රතිචාර වශයෙන් උතුරේ හා නැගෙනහිර පදනම් කරගත් තමිල් ධනේශ්වර හා සුළු ධනේශ්වර ජාතිකවාදී දේශපාලන ප්‍රවේශය විසින්ද ජාතික පදනමින් තම පක්ෂ දේශපාලන බලය තහවුරු කරගැනීම සඳහා ජාතිවාදයේම සරණ ගියේය. මෙම තත්වයට පටහැණි දේශපාලන වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීමට ලංකාවේ වාමාංශික ව්‍යාපාරයද

අසමත් වූවා පමණක් නොව මැතිවරණවාදයේ ගිලීයාම නිසා අවසානයේ දී මෙම දේශපාලන ව්‍යාපාර ද ජාතිකවාදී දේශපාලනයටම ගොදුරු විය. ආරම්භයේ දී ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම් වෙමින් දෙමළ ජාතිකවාදී දේශපාලන පක්ෂවලින් සහ නායකයන්ගෙන් ඉදිරිපත් වූ ෆෙඩරල් යෝජනා ලංකාවේ විවිධ රජයන් විසින් ප්‍රතික්ෂේප වීමෙන් අනතුරුව අවසානයේදී වෙනම තම්ල් ඊලාම් රාජ්‍යයක් දක්වා වූ සන්නද්ධ දේශපාලන පෙළගැස්මකට මෙම තත්වයන් මග පෑදුවේය.

නමුත් අප විවාදයකින් තොරවම පිළිගත යුතු කරුණක් වන්නේ ලංකාවේ ධනේශ්වර ක්‍රමයට හෝ එමගින් නිර්මිත දේශපාලන ව්‍යුහයන්ට ප්‍රමාණයෙන් සුළුතරයක් වන ජාතික ජන කොටස්වල දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට අසමත් වීමයි. එනිසා බලයට පත්වන දේශපාලන පක්ෂ මෙන්ම බලය ඉල්ලා සිටින දේශපාලන පක්ෂවල වැඩපිළිවෙළවල් තුළ බලයට පැමිණීමට පෙරාතුවත් බලයට පැමිණීමෙන් පසුවත් තම ඡන්ද පදනම් ආරක්ෂා කරගැනීමටත් තහවුරු කරගැනීමටත් සිංහල ජාතිකවාදය හා ජාතිවාදය පදනම් කරගත් සටන් පාඨ හා ඉල්ලීම් ක්‍රමානුකූලයව වර්ධනය විය. අවසානයේදී එය සිංහල-බෞද්ධ අධිපති දෘෂ්ටිවාදයක් මත ප්‍රසාරණය විය. එය ධනේශ්වර

පක්ෂ තුළින් පමණක් නොව ඉපැරණි වමේ පක්ෂ හා අභාවයට යමින් ඇති වමේ පක්ෂ තුළින්ද මැතිවරණවාදය මුල් කරගනිමින් බහුතර සිංහල ඡන්දදායකයා ජාතිවාදී දේශපාලනයෙන් දුර්මුඛ කරමින් යන මෙම ක්‍රියාමාර්ගයන් වෙත තල්ලු වීම නිරීක්ෂණය කළ හැකි විය.

තමිල් ඊළාම් ජාතිකවාදී දේශපාලන ව්‍යාපාරයේ සන්නද්ධ ප්‍රකාශනය රට තුළ දිග හැරුනේ තමිල්, මුස්ලිම් හා සිංහල මිනිස් සංහාරයක් දියත් වීමෙන් හා ලංකාවේ ජාතික ජන කොටස් අතර පෙර නොවූ විරූ පසමිතුරු තත්වයන් නිර්මාණය කරමිනි. විනාශ වූ මහජන දේපළවල වටිනාකම අතිශය ඉහළ අගයක් ගන්නා ලදී. විවිධ ජාත්‍යන්තර දේශපාලන බලවේගයන්ගේ න්‍යාය පත්‍ර රටේ අභ්‍යන්තර දේශපාලනය තුළ ක්‍රියාත්මක වීම අද වනතුරු දක්නට ලැබේ.

තමිල් ඊළාම් සන්නද්ධ දේශපාලන ව්‍යාපාරයේ පසුබෑමත් සමගම ජාත්‍යන්තර දේශපාලනයේ විවිධ ප්‍රවණතා සමග ලාංකේය ධනේශ්වර පක්ෂවල දේශපාලන න්‍යාය පත්‍රය තවදුරටත් අධිපති සිංහල බෞද්ධ දේශපාලන දෘෂ්ටිවාදය තුළම තම උපාය උපක්‍රම සකස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අඩු වැඩි වශයෙන් පවත්වාගෙන ආ මුස්ලිම් විරෝධය තම දේශපාලන අභිමතාර්ථයන් සාක්ෂාත් කරගැනීම

සඳහා ඉහළ මට්ටමකින් යොදා ගැනීමට යුහුසුළු විය.

2022 ජූලි මාසයේ දී පලා ගිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ 2019 දී සිය ජනාධිපතිවරණ ජයග්‍රහණයෙන් පසුව පැවසුවේ තමන් 'සිංහලයන්ගේ ජනාධිපති' බවයි. මෙය අනෙකුත් ජාතික ජන කොටස් රාජ්‍යයෙන් පිටමං කෙරෙන මනෝභාවයකට සවිඥාණකවම ඇද දැමීමකි.

අනෙක් අතට වසර 200ක පටන් ලංකාවේ ධනේශ්වර ක්‍රමය තහවුරු කිරීම වෙනුවෙන් අර්ධ වහල් භාවයක් තුළ පීඩනයට ලක් කොට ඇති කඳුකර තමිල් ජාතික ජන කොටස වෙත අවධානය යොමු කළ යුතුය. එක් අතකින් ලාංකේය තමිල් ජාතික ව්‍යාපාරයේ දේශපාලන ඉල්ලීම්වලට අදාළ කර නොගත් මෙම ජන කොටස ඉන්දියාවේ හා ලංකාවේ ධනේශ්වර රාජ්‍යයන්ගේ බල දේශපාලන කඹ ඇදිල්ලේ ගොදුරු බවට පත් වී ඇත. ආර්ථික පීඩනයේ හා සමාජ අසමානතාවයේ බලවත් ගොදුරු බවට පත්කොට ඇති මෙම ජන කොටස අද වන විටත් නිවසකට, ඉඩමකට, සිවිල් අයිතිවාසිකම්වලට හෝ අඩුම තරමින් ලිපිනයකට හෝ හිමිකම් නොකියන පූර්ව ධනේශ්වර තත්වයේ ජීවන තත්වයකට ඇද දමා ඇති ජන කොටසකි. ඔවුන්ගේ ජාතික අනන්‍යතාව අමතර සූරාකෑම

සඳහා පදනමක් කොට ගෙන ඇති අතර මොවුන් ලාංකේය ධනවාදය ගොඩනැගීමේ ආරම්භක කම්කරු පංතිය බවත් තවමත් වැවිලි ආර්ථිකයේ ධන කුවේරයන් වෙත අධික ලාභ සොයා දෙන කම්කරු ජන කොටසක් බවත් අවධාරණය කළ යුතුව ඇත. අද වන විට මෙම ජන කොටස දිවයිනේ විවිධ ප්‍රදේශවලට සංක්‍රමණය වී ඇති අතර දිවයිනේ කුමන ප්‍රදේශවල ජීවත් වුවත් තවමත් තම අනන්‍යතාවය කඳුකර තමිල් වශයෙන් අවධාරණය කරයි. එනිසාම ලංකාවේ ජාතික ගැටලුව විසඳීමේ දී මෙම ජන කොටස මුහුණ දෙන ජාතික හා සංස්කෘතික පීඩනය අහෝසි කිරීමේ අරගලය තම දේශපාලන වැඩපිළිවෙළ තුළ අවධාරණය කරගැනීමට මෙරට වාමාංශික ව්‍යාපාරය වගබලාගත යුතුය. ඒ සඳහා අත්‍යවශ්‍ය ප්‍රමුඛ කාරණයක් වශයෙන් සිංහල, තමිල්, මුස්ලිම් මෙන්ම මෙරට කඳුකර තමිල් ජනතාව ද වෙනම ජාතික ජන කොටසක් වශයෙන් පිළිගත යුතුව ඇත.

මෙම තත්වය හමුවේ අප විසින් ලංකාවේ ජාතික ගැටලුව විසඳීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රමුඛ පියවරක් වශයෙන් පහත සඳහන් හදිසි දේශපාලන ප්‍රතිසංස්කරණ වහා ක්‍රියාවට නැගීමට යෝජනා කර සිටී. මෙහි දී ජනතාවාදී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම මෙන්ම පසුගිය අරගලයෙන්

ලාංකේය ජනතාව ලැබූ ඉතා තීරණාත්මක අත්දැකීමක් වූ මහජන බලය සම්බන්ධ දේශපාලන වැඩපිළිවෙළ ද මෙම යෝජනාවලට පදනම් කොට ගෙන ඇත.

91. ලංකාව සිංහල - තමිල් - මුස්ලිම් - කඳුකර තමිල් යන ජාතික ජනකොටස්වලින් සමන්විත බහුජාතික රාජ්‍යයක් වන අතර, රාජ්‍යයේ ජනගහනයෙන් අඩු ප්‍රතිශතයක් නියෝජනය කරන තමිල් - මුස්ලිම් - කඳුකර තමිල් යන ජාතික ජනකොටස් ඓතිහාසික - සමාජ - ආර්ථික - දේශපාලන හේතු මත විශේෂ ජාතික පීඩනයකට මුහුණ දී ඇති බව පිළිගෙන, ජාතිවාදය හා ජාතික පීඩනය අහෝසි කිරීම සඳහා ආර්ථික - දේශපාලන - සංස්කෘතික - සමාජ මනෝ විද්‍යාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවනු ලැබේ.

92. විවිධ ජාතික ජන කොටස් සඳහා ස්වයං පාලනය හිමිවන පරිදි බලය විමධ්‍යගත වන නව ස්වයං පාලන ප්‍රදේශ හා ස්වයං පාලන ඒකක ප්‍රාදේශීය ව්‍යුහයක් යෝජනා කරනු ලැබේ. ස්වයං පාලන ප්‍රදේශ හා ස්වයං පාලන ඒකක සඳහා බලය විමධ්‍යගත කිරීමේ දී ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගත රාජ්‍ය පදනමත් ජාතික ස්වීකරණයේ දිශාවත් ආරක්ෂා වන

පදනමින් ආර්ථික හා දේශපාලනික බලය විමධ්‍යගත කෙරේ. එසේ බලය විමධ්‍යගත කිරීමේ විෂය හා සීමාවන් සකස් කිරීමේ දී ජනතා අදහස් විමසන අතර අවසන් යෝජනාව ජනතා අනුමැතිය ට යටත්ව සිදු කරන අතර, එම ස්වයං පාලන ප්‍රදේශ හා ඒකකවල සීමා නිර්ණය සඳහා නව සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කෙරේ. ජනතා අදහස් විමසීමෙන් අනතුරුව සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සකස් කරන අවසන් යෝජනාව ජනතා අනුමැතිය සඳහා යොමු කෙරේ.

93. ස්වයං පාලන ප්‍රදේශ හා ස්වයං පාලන ඒකක ඇතුළත් රට පුරා සියලු පාලන ව්‍යුහයනට සමගාමීව නෛතිකවත් දේශපාලනිකවත් පිළිගැනෙන ජනතා බලය සහතික කෙරෙන මහජන සභා ව්‍යුහයක් පිහිටවනු ලැබේ.

94. රාජ්‍ය ව්‍යුහයෙ දී ව්‍යවස්ථාදායකය හා විධායකය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ සහ එමගින් සම්මත කරනු ලබන පනත් මගින් සුළුතර ජාතික සංස්කෘතික ජන කොටස්වලට අසාධාරණයක් වීම වැළැක්වීම සඳහා ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකයක් පිහිටුවනු ඇත. එම ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකයට

අයත් ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් මත නව ජනතාවාදී ව්‍යවස්ථාවකින් ස්ථාපිත කරන පාර්ලිමේන්තුවට අමතරව පිහිටුවනු ලබන නව මණ්ඩලයට නියෝජිතයන් තෝරා පත් කිරීම සියලු ජාතික ජන කොටස්වලට සමාන නියෝජනයක් ලැබෙන සේ මහජන ඡන්දයෙන් සිදුකරනු ඇති අතර ඒ සඳහා සුදුසු මැතිවරණ ක්‍රමයක් සකස් කරනු ඇත. විශේෂයෙන් දෙවන මණ්ඩලයේ අරමුණ වනුයේ ස්වයං පාලන ප්‍රදේශවල සහ ස්වයං පාලන ඒකකවල බලතල සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් සංශෝධනයක් හෝ ජාතික සමගියට සහ ජාතික සංස්කෘතික සමානාත්මතාවට බලපෑම්සහගත විය හැකි පනත් කෙටුම්පත් හෝ යම් නීතියක් මෙම ද්විමණ්ඩලවලම සම්මත වීම අනිවාර්ය කෙරේ.

95. පළමු මණ්ඩලයට තෝරා ගැනීම සඳහා දැනට පවතින මැතිවරණ ක්‍රමයේ ඇති ජාතිවාදී පදනමින් සැකසූ මැතිවරණ කොට්ඨාශ සීමා බෙදීම් ජන අනුපාතයන් සහ ජනගහණයේ ව්‍යාප්ති රටාවන් නිවැරැදිව නියෝජනය වීම සඳහා ද, මැතිවරණයේ දී ප්‍රකාශිත ජනමතය නිවැරදිව නියෝජිත මණ්ඩල තුළ ප්‍රකාශයට

පත් කිරීම සඳහාද මැතිවරණ කොට්ඨාසවල සීමාවන් විද්‍යාත්මක හා ජන සහභාගී සීමා නිර්ණය ක්‍රමයකට අනුව යළි නිර්ණය කර, නියෝජන ක්‍රමය සාධාරණ හා යුක්තිසහගත ලෙස යළි සකස් කිරීම.

96. රාජ්‍යයේ ලෞකික ස්වභාවය සහතික කරනු ඇත. කිසිදු ආගමකට විශේෂ රාජ්‍ය අනුග්‍රහයක් ලබා නොදෙන අතර ආගම ජනතාවගේ පෞද්ගලික ක්ෂේත්‍රයක් ලෙස සලකා එය රාජ්‍යයෙන් ස්වාධීන කරනු ඇත.

97. කිසිදු ජාතික ජන කොටසක්, කිසිදු සංස්කෘතියක් හෝ කිසිදු ආගමක් උස්කොට - පහත්කොට සැලකීම නීතියෙන් තහනම් කරනු ලැබේ.

98. සිංහල - තමිල් - ඉංග්‍රීසි යන භාෂා තුනම ජාතික භාෂා ලෙස පිළිගනු ලැබේ.

99. සිංහල - තමිල් - ඉංග්‍රීසි යන ජාතික භාෂා තුනම හැදෑරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් සකස් කරනු ලබන අතර, ඒ සඳහා පාසල් - විශ්වවිද්‍යාල - අධ්‍යාපන විද්‍යා පීඨ - ගුරු විදුහල් ඒකාබද්ධ කරගත් 'ජාතික භාෂා අධ්‍යයන ආයතනයක්' ස්ථාපිත කරනු ලැබේ.

100. නීති කටයුතු, රාජ්‍යයේ නියෝග ඇතුළු සියලු නිල කටයුතු සෑම ජාතික භාෂාවකින්ම

සිදුකිරීම අනිවාර්ය කරනු ලැබේ.

101. තමන් කැමති ඕනෑම ජාතික භාෂාවකින් අධ්‍යාපනය ලැබීමටත්, තමන් කැමති ජාතික භාෂාවකින් රාජ්‍යය සමග කටයුතු කිරීමටත් සියලුම පුරවැසියන්ට ඇති අයිතිය තහවුරු කරනු ලැබේ.

102. සියලු ජාතික ජනකොටස් සඳහා දේශපාලන - සමාජ - සංස්කෘතික ක්ෂේත්‍රවල සම අයිතිය තහවුරු කරනු ලබන අතර ඒ මත පදනම්ව සියලු ආකාරයේ විශේෂ වරප්‍රසාද සහ සියලු ආකාරයේ පීඩාවන් නීතියෙන් තහනම් කරනු ලැබේ.

103. දශක කිහිපයක් තිස්සේ පැවතුණු විනාශකාරී යුද්ධයේ අතුරුඵල ලෙස පවතින අතුරුදන්වූවන් පිළිබඳ ප්‍රශ්නය, දේශපාලන රැඳවියන් පිළිබඳ ප්‍රශ්නය, යුද අපරාධ ඇතුළු මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවලට එරෙහි පියවර නොගැනීමේ ප්‍රශ්නය, ජනතාවගෙන් පවරාගත් ඉඩම් පිළිබඳ ප්‍රශ්නය සහ දේශපාලන ඝාතන පිළිබඳ ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න විසඳීම සඳහා වසරක කාලයක් තුළ යුක්තිය හා වගවීම ඉටු කිරීමේ සම්පූර්ණ යාන්ත්‍රණයක් සකස් කරනු ලැබේ. එමෙන්ම යුද්ධයේ දී මියගිය සිය ඥාති හිතවතුන් සැමරීමට උතුරු

- නැගෙනහිර ජනතාවට අවකාශ ලබා නොදී බාධා කිරීමේ ප්‍රශ්නය විසඳීම සඳහා කඩිනම් පියවර ගනු ලැබේ.

104. කඳුකර තමිල් ජනතාව ලංකාවට පැමිණ වසර 200ක් ඉක්ම ගොස් ඇතත්, තවමත් සම්පූර්ණ කොට නැති කඳුකර තමිල් ජනතාවගේ ඉඩම් - නිවාස අයිතිය සහ සිවිල් අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා කඩිනම් පියවර ගනු ඇත. එමෙන්ම රටේ අනෙකුත් ජන කොටස් සමග ඔවුන්ගේ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවා පිළිබඳ ස්ථිර ක්‍රියාමාර්ග ගනු ලැබේ. කඳුකර තමිල් ජනතාව අධ්‍යාපන, සෞඛ්‍ය ආදී ක්ෂේත්‍රවල අතිශය පසුගාමී තත්වයකට ගොදුරු කර තිබීම සලකා කඳුකර තමිල් ජනතාවගේ ආර්ථික - දේශපාලන - සංස්කෘතික වර්ධනය සඳහා පියවර ගනු ඇත.

(අ) විශේෂයෙන් කඳුකර තමිල් ජනයා පාසල් අධ්‍යාපනයෙන් පිටමං කෙරෙන සේ සකස් වී ඇති වත්මන් පාසල් අධ්‍යාපන ව්‍යුහය විශාල පරිවර්තනයකට ලක් කිරීම සඳහා ප්‍රතිපාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාව ලබාදෙනු ඇත.

(ආ) කඳුකර තමිල් ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් ඔවුන්ගේ ආර්ථික ජීවිතය, ඉතිහාසය, සංස්කෘතිය, විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රවේශයන් අධ්‍යයනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිත ව එම ක්ෂේත්‍රයට අයත් උසස් අධ්‍යාපන ව්‍යුහයන් පුළුල් කරන අතර පාසල් අධ්‍යාපනයේ සහ උසස් අධ්‍යාපනයේ අවස්ථා පුළුල් කරනු ලැබේ.

## (ඊ) විදේශ ප්‍රතිපත්තිය

1990 දශකය මුල දී සෝවියට් කඳවුර බිඳ වැටීමත් සමග අධිරාජ්‍යවාදයේ තනි බලය තහවුරු වූ තත්වය මඳක් වෙනස් වෙමින් වර්තමාන ලෝක දේශපාලනය බහුධ්‍රැවීය බලකේන්ද්‍ර පද්ධතියක් වෙත ගමන් කර ඇත. නමුත් ඒ අධිරාජ්‍යවාදී බල කඳවුරු අතරම ප්‍රතිවිරෝධයක් පුපුරා යමිනි.

අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධය සහ දිනෙන් දින වර්ධනය වන ගෝලීය පරිමාණ ධනවාදයේ අර්බුදය විසින් ලොව පුරා ජනඝාතක යුද්ධ නිර්මාණය කර තිබේ. මේ අතර චීනය, රුසියාව, ඉන්දියාව, ඉරානය යනාදී නව ලෝක බලවතුන් සහ කලාපීය බලවතුන්ගේ නැගී ඒමක් ද නිරීක්ෂණය කළ හැක. ලෝක බල කඳවුරුවල බෙදුම් ඉරිද මින් පෙර නොවූ විරූ ලෙස චලනය වෙමින් තිබේ. නිදසුනක් ලෙස ඉන්දීය සාගරයේ දේශපාලන සහ යුදමය ආධිපත්‍යය පිළිබඳ කරුණේ දී ඇමරිකා එක්සත් ජනපද කඳවුර සමග සිටින ඉන්දියාව, සිය ලෝක ආර්ථික බලවතෙකු බවට පත්වීමේ වැඩසටහන තුළ ආර්ථික ආධිපත්‍යය සඳහා බ්‍රික්ස් රටවල් සමූහය සමග එක්ව කටයුතු කරයි.

අපගේ දිගුකාලීන වැඩපිළිවෙළ දිශානතිගත

වන්නේ නිර්ධන පන්ති ජාත්‍යන්තරයක් ගොඩනැගීමේ ඉලක්කය වෙතට වන අතර කෙටිකාලීන වැඩපිළිවෙළ එහි ආරම්භක පියවරක් ලෙස අධිරාජ්‍යවාදයෙන් පීඩාවට පත් ලොව පුරා ජනතාව සංවිධානය කරන පුළුල් අධිරාජ්‍ය විරෝධී සහ යුද විරෝධී ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් ගොඩනැගීම සහ පීඩිත ජාතීන්ගේ සහයෝගිතාවක් උදෙසා විකල්ප ගෝලීය සංවිධාන ජාලයක් ගොඩනැගීම යෝජනා කරයි. විශේෂයෙන් ඉන්දීය සාගරයේ භූ දේශපාලන බල පොරය හමුවේ එක් කඳවුරකට හෝ ගැති නොවන නොබැඳි ප්‍රතිපත්තියක් යෝජනා කරයි.

105. ඉන්දීය සාගරයේ භූ - දේශපාලන බලපොරය සහ එය විවිධ ආකෘතිවලින් ලංකාවට මැදිහත්වීම සැලකිල්ලට ගෙන, ඉන්දීය සාගර කලාපය සාම කලාපයක් ලෙස පිළිගෙන කිසිදු රටක් ඉන්දීය සාගරයට මායිම් වන රටවල් සමග මිලිටරි ගිවිසුම් ඇතිකර නොගත යුතු බවට වන 1972 එක්සත් ජාතීන්ගේ යෝජනාව විදෙස් ප්‍රතිපත්තියේ පදනම බවට පත් කරගනු ඇත. ඒ අනුව සියලු බල කඳවුරුවලට අයත් රටවල් සමග ආර්ථික - වෙළෙඳ - දේශපාලන - රාජ්‍යතාන්ත්‍රික - සංස්කෘතික සහයෝගීතාව තහවුරු කරන

අතරම සෘජු හෝ වක්‍ර මිලිටරි කටයුතුවලින් වහාම ඉවත් වනු ලැබේ.

106. ගෝලීය බලවතුන් සහ කලාපීය බලවතුන් සමගත් ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන සමගත් දැනට එළඹ ඇති සියලු ගිවිසුම් සමාලෝචනයකට ලක් කර, අහිතකර ගිවිසුම්වලින් ඉවත් වීමට කටයුතු කරනු ලැබේ.

107. අධිරාජ්‍යවාදී යුද වැඩපිළිවෙළ නිසා පීඩාවට පත්වන ලොව ඕනෑම ජනතාවක් වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටින අතර ජනඝාතක යුද්ධවලට එරෙහි ජාත්‍යන්තර සහයෝගීත්වයක් ගොඩනැගීමට පුරෝගාමී මැදිහත්වීමක් සිදු කරනු ඇත. විශේෂයෙන් මැදපෙරදිග ගාසා තීරයත්, නැගෙනහිර යුරෝපයේ යුක්‍රේනයත් මුල් කරගෙන ක්‍රියාත්මක කෙරෙන අධිරාජ්‍යවාදී යුද්ධවලට එරෙහි පුළුල් ගෝලීය සහයෝගීත්වයක් ගොඩනැගීමට කටයුතු කරන අතර දකුණු චීන මුහුද සහ ඉන්දීය සාගරය ආශ්‍රිත කලාපයේ විනාශකාරී යුද්ධයක් ඇතිවීමේ අවදානම තුරන් කිරීම සඳහා සක්‍රිය මැදිහත්වීමක් සිදු කරනු ලැබේ.

108. කවර හෝ ගෝලීය බල කඳවුරකට ගැති

වීමේ විදෙස් ප්‍රතිපත්තියක් වෙනුවට රටේ විදෙස් ප්‍රතිපත්තිය ප්‍රජාතන්ත්‍රවාදය සහ සමානාත්මතාව මත පදනම් වූ අන්‍යෝන්‍ය ගෞරවය ආරක්ෂා වන විදෙස් ප්‍රතිපත්තියක් බවට වහාම පරිවර්තනය කරනු ලැබේ.

109. ආක්‍රමණකාරී අඛණ්ඩ භාරත් ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් ලංකාවේ ආර්ථික ස්වාධීනත්වයට සහ දේශපාලන ස්වාධිපත්‍යයට හානිකර ලෙස ඉන්දියාව සමග එළඹ ඇති ගිවිසුම් සියල්ල වහාම අවලංගු කර, අත්සන් කිරීමට නියමිතව ඇති එට්කා වැනි ගිවිසුම් පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කරනු ලැබේ. කලාපීය ආධිපත්‍යය ඉදිරියේ නිවට බව මත පදනම් වන ඉන්දියාව සමග වන විදෙස් ප්‍රතිපත්තිය වහාම ක්‍රියාත්මක වන පරිදි සමානාත්මතාව සහ ප්‍රජාතන්ත්‍රවාදය මත දෙරටේ ජනතාව අතර සහයෝගීත්වයක් ගොඩනැගීමේ පදනම මත යළි සකස් කරනු ලැබේ.

110. ලොව ඇති අධිරාජ්‍යගැති ආණ්ඩු, රූකඩ රාජ්‍යයන් සහ ඒකාධිපති පාලනයන් විසින් එම රටවල ජනතාව මර්දනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගවලට එරෙහිව එම ජන අරගලවලට සහයෝගීතාව පළ කිරීම සහතික

කෙරේ.

111. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ලෝක වෙළෙඳ සංවිධානය, ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු අධිරාජ්‍යවාදී ආර්ථික හා දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාත්මක වන සංවිධානවලින් ඉවත් වන අතර ඊට විකල්ප ගෝලීය සංවිධාන ජාලයක් සකස් කිරීමට ප්‍රමුඛතාවක් සහිතව මැදිහත් වනු ලැබේ.

## (උ) කලාව, සංස්කෘතිය, ජනමාධ්‍ය හා ක්‍රීඩාව

ධනවාදී සමාජයක කලාව, සංස්කෘතිය, ජනමාධ්‍ය සහ ක්‍රීඩාව පවා මහා පරිමාණ සමාගම්වල ලාභ ඉපයීම උදෙසාත් හුදු විනෝදාස්වාදයක් සඳහාත් පමණක් යොදා ගැනේ. පරිභෝජනවාදයට හුරු කිරීම සඳහාත්, දුෂ්ඨ සහ පරපීඩක වෙළෙඳපොළ ආකෘති සහ රාජ්‍යය පිළිගැනීම සඳහාත් මේ ක්ෂේත්‍ර අවභාවිත කරමින් සිටී. අවිඥානිකව ජනතාව තමන්ට වුවමනා ලෙස හසුරුවා ගැනීමට තියුණුම අවියක් ලෙස කලාව පාවිච්චි කෙරෙන පසුබිමක, අමෙරිකාව හා ඉන්දියාව ඇතුළු බොහෝ රාජ්‍යයන් තමන්ගේ ප්‍රචාරක යාන්ත්‍රණ (propaganda) සහ අධිරාජ්‍යවාදී අරමුණු සඳහා මෙම ක්ෂේත්‍ර පාවිච්චි කරමින් සිටී. ඍජු හා වක්‍ර වෙළෙඳ දැන්වීම්කරණයන් තුළ සමාජය අන්ධ කර ඇත. සිනමා නිෂ්පාදනය, ජනමාධ්‍ය ආයතන බොහොමයක් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලීන්ටත් හසු වී තිබේ. චිත්‍ර කලාව ආදී ඇතැම් දෘශ්‍ය කලාවන් මෙන්ම උසස් සංගීත ප්‍රසංග පවා ප්‍රභූන්ට සීමා වූ සංස්කෘතිකාංග වී තිබේ.

ක්‍රීඩාව ප්‍රජා සහභාගීත්වයක් නොමැති, ප්‍රේක්ෂකාගාරයක් සහ රූපවාහිනී ප්‍රසංගයක් දක්වා සීමා කර තිබේ. එය ද ක්‍රිකට් ක්‍රීඩාවට පමණක්

උෟනනය කර තිබෙන අතර, අනෙකුත් ක්‍රීඩා ජනප්‍රිය පාසල් සහ ප්‍රභූ ක්‍රීඩා සමාජවලට ලඝු කර ඇත. ක්‍රීඩා තරගාවලි සඳහා අනුග්‍රහය ලබාදීම ඇතැම් වෙළෙඳ නාමයන්ට ප්‍රවර්ධන කටයුත්තක් පමණක් වී ඇතත්, සැබෑ ලෙසම ක්‍රීඩාව, ක්‍රීඩකයන් හා ක්‍රීඩකයන්ගේ සමාජ ආරක්ෂණය උදෙසා එවැනි වෙළෙඳ නාමයන් විසින් ප්‍රමාණවත් මුදලක් වෙන් නොකරන පසුබිමක ක්‍රීඩක ශ්‍රමය ද සූරාකෑමට ලක් වේ. සූදුකරුවන් ක්‍රීඩාව දූෂණයට ලක් කර ඇත.

මෙවැනි පසුබිමක ගෞරවණීය සහ සුජාත අරමුණු සහිත කලාකරුවන් අතින් පවා නිර්මාණය කෙරෙන නිර්මාණ දැන් පවතින නව ලිබරල් ධනවාදයේ විකෘති වූ විලංගුවලින් ජන මනස නිදහස් කිරීම වෙනුවෙන් නිර්මාණ නොකෙරෙන අතර බොහෝ විට අවිඥානිකවම ක්‍රමය නඩත්තු කරන නිර්මාණම කෙරේ. ජනමාධ්‍යවේදීන්ට වාර්තාකරණයේ දී ක්‍රමය විනිවිද දැකීමට ඉඩකඩක් නොමැති අතර, ජනමාධ්‍ය සහ ප්‍රවෘත්ති විසින් ආවරණය කරන ක්ෂේත්‍ර ඉතා පටු සීමාවක් තුළ පවතී.

උදාහරණයක් ලෙස මෙවැනි පසුබිමක අවිඥානිකව සහ සවිඥානිකව ගීතයක තනුව පවා බොහෝ විට විධිමත් රටාවන්ට අනුව යොදා ඇත. ඒ, මිනිසුන් ශබ්දය හරහා අනුකරණය සහ අනුගත

කිරීම සඳහා යොදා ගැනීමේ අරමුණු සහිතවය.

මේ වන විට සමාජ මාධ්‍ය සහ අන්තර්ජාල යුගයේ නව කලාත්මක, ජනමාධ්‍ය සහ සංස්කෘතික ප්‍රවණතා පවතී. නව යුගයේ දී පුද්ගලයා අතර ජනමාධ්‍යමය සහ කලාත්මක බලය පරිවර්තනය වී තිබෙන නමුත්, ජනමාධ්‍ය සමාජය විවිධ ක්‍රම හරහා ඒ අවකාශය තුළ නිර්මාණකරුවන්, මත පළ කරන්නන් සහ සමාජ මාධ්‍ය බලපෑම් කරන්නන් තමන්ට ඕනෑ ආකාරයට අනුගත කරවා ගැනීමට උත්සාහ කරයි. කෘත්‍රිම බුද්ධිය සහිත අන්තර්ජාල මෙහෙයුම් පද්ධති මෙන්ම ප්‍රාග්ධනය යොදා ගනිමින් මෙම අනුගත කර ගැනීම් සිදු වේ.

අන්ත දක්ෂිණාංශික අදහස් මෙන්ම ප්‍රතිගාමී අදහස් ව්‍යාජ කරුණු සහිතව අන්තර්ජාලය තුළ පැතිරවීමත් සිදු වේ. එහෙත්, ඒ සියල්ලට එරෙහිව ධනවාදී ක්‍රමය විසින් යෝජනා කර ඇති ‘දුෂ්තොරතුරු මැඩලීමේ’ ආකෘතිවලින් මෙවැනි අසත්‍ය පැතිරවීම පසුපස සිටින පුද්ගලයන් නොව සාමාන්‍ය ජනතාව ඉලක්ක කරයි. දුෂ්තොරතුරු මැඩලීම මුවාවෙන් ක්‍රමය ප්‍රශ්න කරන පුද්ගලයන්වත් මැඩලීම දක්නට ලැබේ.

මෙවැනි පසුබිමක රාජ්‍යය මෙම සියලු ක්ෂේත්‍රවලට අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආදී ආයතන පිහිටුවා ඇතත් ඒ සියල්ල සේවය කරනු

ලබන්නේ ජනතා උවමනාවන්ට ප්‍රතිපක්ෂවය. රාජ්‍ය චිත්‍රපට සංස්ථාව පැරණි ආයතනයක අකර්මණ්‍ය වූ සැකිල්ලක් වී තිබේ. රාජ්‍ය නාට්‍ය උළෙල වැනි වැඩසටහන් පැවැත්වුවත්, එය සම්ප්‍රදායානුකූලව පවත්වන, රාජ්‍යයට හිසරදයක් වූ වාර්ෂික වතාවතක් දක්වා උග්‍රනනය වී තිබේ. සංස්කෘතිය පිළිබඳ සංවාදය බොහෝ විට පුරාවිද්‍යා සහ ආගමික කටයුතුවලට උග්‍රනනය කර තිබෙන අතර, විවිධ ජාතීන් පීඩාවට පත් කරන ක්‍රියාවලීන්ටත් ඒවා අවභාවිත කෙරේ.

එවැනි පසුබිමක කලාව, සංස්කෘතිය, ජනමාධ්‍ය සහ ක්‍රීඩාව යන ක්ෂේත්‍ර සියල්ල ජනතාව උදෙසා වූ පූර්ණ පරිවර්තනයකට ලක් කරනු ඇත.

20 වැනි සියවසේ සමාජවාදී රාජ්‍යයන් අධිරාජ්‍යවාදයට, ප්‍රතිවිප්ලවීය ක්‍රියාමාර්ගයන්ට සහ ඉහත කී නොකී තත්වයන්ට මුහුණ දීම සඳහා කලාව, ජනමාධ්‍ය ආදී ක්ෂේත්‍ර කෙරෙහි දැඩි ප්‍රතිපත්ති අනුගමනය කළ නිසා සමාජවාදී ආණ්ඩු නිදහස සීමා කරනු ඇතැයි දැඩි බියක් පවතී.

එහෙත් සැබෑ ලෙසම ධනවාදී සමාජයන්හි ප්‍රකාශන නිදහස පිළිබඳ කඩතුරාවක් පමණක් පවතින අතර ලෝකය පුරා පුද්ගලයන්ගේ ප්‍රකාශනයන් සීමා කිරීමට නීතිරීති පැනවීමත්, අන්‍ය ක්‍රම යොදා ගැනීමත් සිදුව තිබේ. ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර රාජ්‍යයන් පිළිබඳ හෙළිදරව් සිදු කළ එඩ්වඩ්

ස්නෝඩන් සහ 'විකිලීක්ස්' ප්‍රධානී ජූලියන් අසාන්ජ් දැවැන්ත පළිගැනීම්වලට හා නිහඬ කිරීම්වලට ලක් කිරීම ප්‍රකට උදාහරණ වේ. පලස්තීනය පිළිබඳ අදහස් පළ කළ පුද්ගලයන් සීමා කිරීමත් මෑතකාලීන ප්‍රවණතාවක් විය. පද්ධතිගත මර්දනයක් සහ අනුගත කිරීමක් තුළ සැබෑ ලෙස නිදහස සීමා කර ඇත්තේ ධනවාදී ක්‍රමය තුළය.

එවැනි පසුබිමක ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් පහරකෑම, අතුරුදන් කිරීම, ඝාතනය කිරීම, සිරගත කිරීම ඇතුළු අපරාධයන්ට මුහුණ දී තිබේ. මේ වන විට 'සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත' ඇතුළු නීතිරීති අවභාවිත කරමින් ප්‍රකාශනයට එල්ල කරන මර්දනයත්, මර්දන නීති පැනවීමත් ආදී ප්‍රවණතා ඇත.

පුද්ගල නිදහස, පුද්ගල ස්වාධීනත්වය, පුද්ගල දියුණුව සහ සාමූහික යහපත වෙනුවෙන් ඒවා වෙනස් කෙරෙනු ඇත. ප්‍රජා පාදක කලාවක්, ප්‍රජා පාදක සංස්කෘතියක්, ප්‍රජා පාදක ජනමාධ්‍යකරණයක් සහ ප්‍රජා පාදක ක්‍රීඩාවක් දක්වා වර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කරනු ඇත.

දීර්ඝකාලීනව සමාජවාදී සංකල්ප මත පදනම් වෙමින්, නවීන තාක්ෂණයට අනුගත වූ විකල්ප ජනමාධ්‍ය, සංස්කෘතික හා ක්‍රීඩා ප්‍රතිපත්ති අධ්‍යයනය කරමින් ඒවා අන්තර්ග්‍රහණය කිරීමට

පියවර ගනු අතර, කෙටිකාලීන පියවර ගණනාවක් ගැනීමට බලාපොරොත්තු වේ.

වෙළෙඳපොළ විසින් දුවවන කලාව, නවීකාරක ප්‍රජාමූලික ක්‍රියාන්විතයකට ප්‍රතිනිර්මාණය කරනු ඇත.

112. සිනමාව කර්මාන්තයක් ලෙස වාචිකව ප්‍රකාශයට පත් කරන නමුත්, එය රාජ්‍ය මට්ටමින් පිළිගෙන නොමැත. එය කර්මාන්තයක් ලෙස පිළිගැනීම සහ කම්කරු අමාත්‍යාංශය හරහා වෘත්තියක් ලෙස පිළිගැනීම තුළින් නිර්මාණවල ආරක්ෂාව, කම්කරු අයිතිවාසිකම් තහවුරු කිරීමට පසුබිම සලසනු ඇත.

113. චිත්‍රපට, නාට්‍ය, චිත්‍ර ප්‍රදර්ශන ආදී කලාත්මක නිෂ්පාදන සඳහා නිෂ්පාදන වියදම් ආධාර සහ පොළී රහිත ණය ලෙස ලබාදීම සඳහා විධිමක් ඇගයීම් ක්‍රමවේදයක් සකස් කෙරේ. (ප්‍රංශයේ 'සීඑන්සී' ආයතනය වැනි ආකෘතිවල ආභාසයත් සහිතව රාජ්‍ය මැදිහත්වීමෙන් ගුණාත්මක සිනමා කර්මාන්තයක් පවත්වාගෙන යෑමට කටයුතු කෙරේ.)

114. සිනමා, චිත්‍ර සහ අනෙකුත් සංස්කෘතිකාංග ඒකාබද්ධ වූ සංස්කෘතික උළෙලවල්

ප්‍රවර්ධනය කෙරේ.

115. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ලේක්හවුස්, ස්වාධීන රූපවාහිනී සංස්ථාව ආදී ආයතන බලයට පත් වන ආණ්ඩුවල දේශපාලකයන්ගේ බලපෑමට ලක් නොවන ආකාරයෙන් ඒවායේ මාධ්‍යවේදීන්ට ස්වාධීන තීන්දු ගැනීමේ හැකියාව තහවුරු කරනු ඇති අතර එම ආයතන සංස්කෘතික, අධ්‍යාපනික කටයුතු සඳහා පසුබිම් කරනු ඇත.

116. ලාංකික දෙමළ සිනමාව සහ කලාව සුවිශේෂී අංගයක් ලෙස හඳුනාගෙන එය ප්‍රවර්ධනය කිරීම උදෙසා විශේෂ වැඩපිළිවෙළක් සකසනු ලැබේ. අප වැඩපිළිවෙළේ සඳහන් මූලාධාර සහ ශිෂ්‍යාධාර වැඩසටහන්වල දී ඒ සඳහා සාධාරණ කෝටාවක් ලබා දේ.

117. ලංකාව තුළ තිබෙන ජාතීන් අතර සංස්කෘතික හුවමාරු වැඩසටහන් ප්‍රවර්ධනය කෙරේ.

118. නැගී එන කලාකරුවන් සඳහා ශිෂ්‍යත්ව සහ මූලාධාර ලබා දෙනු ලැබේ.

119. සෞන්දර්ය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය ආදී ආයතනවල ශිෂ්‍යයන් විසින් සිදු කරන නිර්මාණ දිරිමත් කරන අතර, ඒවා සඳහා

මූලාසමය සහ අනෙකුත් පහසුකම් සපයන විධික්‍රම ඇති කරනු ලැබේ.

120. කලාකරුවන්ගේ සහ ජනමාධ්‍යවේදීන්ගේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කරන අතර, ගෙවීම්වලින් තොරව ඔවුන්ගේ ශ්‍රමය සූරාකෑමටත්, විශ්‍රාම අරමුදල් ඇතුළු සමාජ ආරක්ෂණයන් සඳහා ප්‍රවේශ වීමට අයිතිය තහවුරු කිරීමත් කලාකරුවන්ට, ක්‍රීඩකයන්ට සහ ජනමාධ්‍යවේදීන්ට අයිතිය තහවුරු කරනු ලැබේ.

121. රැඟුම් පාලක මණ්ඩලය ආදී ආයතන හරහා කලාකරුවන්ට ප්‍රකාශනයන් කිරීමට ඇති සීමා ඉවත් කරනු ලැබේ. කලාත්මක ප්‍රකාශකයන්ට සීමා පැනවීම සිදු නොකරනු ඇත.

122. කලාත්මක නිදහස ආරක්ෂා කරන නමුත්, වෙළෙඳ දැන්වීම්කරණය තුළ ඇති ආචාරධාර්මික නොවන භාවිතාවන්, අනවශ්‍ය පරිභෝජන රටාවන්ට හුරු කරන ක්‍රියාවන් හඳුනාගනු ඇත. ආචාරධාර්මික නොවන වෙළෙඳ දැන්වීම්කරණයන් නියාමනය කිරීමට කටයුතු කෙරේ.

123. සිනමාහල් පිළිබඳ දැවැන්ත අර්බුදයක් පවතින අතර, සිනමාහලක් පවත්වාගෙන

යෑම පූර්ණ ලෙස වෙළෙඳපොළ කටයුත්තකට උ෴නනය කර තිබෙන නිසා බොහෝ ප්‍රදේශවල සිනමාහල් නොමැති වීමේ අර්බුදයට විසඳුම් ලබා දේ.

124. සිනමා, නාට්‍ය ආදී පාසැල් පවත්වාගෙන යෑම. කලාවට අදාළ වෘත්තිය මට්ටමක් සකස් කිරීමට කටයුතු කරනු ලබන අතර, පිළිගත් අධ්‍යාපනික පසුබිමක් ලබාගැනීම සඳහා කලාකරුවන්ට ඉඩකඩ ලැබේ.

125. සමාජ ප්‍රශ්නවලට මුහුණදෙන කණ්ඩායම්වලට තමන්ගේ ප්‍රජාමූලික අරමුණු වෙනුවෙන් ජනමාධ්‍යකරණය සහ සිනමාව මෙන්ම ක්‍රීඩාව පවත්වාගෙන යෑම සඳහා සමූපකාර ක්‍රමවලින් ආභාසය සහිත ප්‍රජා කේන්ද්‍ර පිහිටවනු ලැබේ. මහජන කවුන්සිල වැනි ආකෘති හරහා ඒ ඒ ප්‍රජාවන්ට එම කටයුතු පවත්වාගෙන යෑමට අවශ්‍ය දැනුම සහ අනෙකුත් පහසුකම් සලසනු ලැබේ. ඒ මත වෙළෙඳ ආධිපත්‍යයට සහ ප්‍රභූ උවමනාවන්ට නතු වූ ක්‍රීඩා, කලා සහ ජනමාධ්‍ය ක්ෂේත්‍ර ජනතා අපේක්ෂා වෙනුවෙන් විප්ලවීය වෙනසකට ලක් කෙරේ.

126. දුෂ්තොරතුරු වැටලීම වැනි ආකෘති සමාජ මාධ්‍ය හරහා අදහස් පළ කරන්නන් මර්දනය

කිරීමට හා සීමා කිරීමට යොදා නොගන්නා අතර, තනි පුද්ගලයන් වෙනුවට එවැනි අදහස් ප්‍රචාරය කිරීම පසුපස ඇති අදිසි හස්තයන් හඳුනාගැනීමට හා හෙළිදරව් කිරීමට කටයුතු කෙරේ. ප්‍රවෘත්ති සහ ජනමාධ්‍ය පිළිබඳ ජනතා දැනුම වර්ධනය කෙරේ.

127. පාසල් මට්ටමේ සිට ක්‍රීඩාව ජනප්‍රිය පාසල්වලට සීමා නොවන පොදු ක්‍රියාවලියක් දක්වා පරිවර්තනය කරනු ඇත. කියුබාව, චීනය මෙන්ම නවසීලන්තය යනාදී රටවල ප්‍රජාමූලික සහ අධ්‍යාපනික ක්‍රීඩා ආකෘතිවල ආභාසය මත එම ආකෘති සකසයි.

128. ක්‍රීඩාව තුළ ඇති දූෂණය මර්දනය කිරීමට විධිමත් පියවර ගනු ලැබේ.

129. ක්‍රීඩකයන්ගේ සෞඛ්‍ය, සමාජ ආරක්ෂණය තහවුරු කිරීමට පියවර ගනු ලැබේ.

## විශේෂ ඇමිණුම

### අපි IMF පිහිට පැතීමෙන් ඉවත් විය යුත්තේ ඇයි?

1. බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව ආරම්භ වූ IMF ගිවිසුමේ බලපෑම සුවිශේෂී එකක් වුවත් ඉන් පෙර 16 වතාවක් IMF සමග ඇති කරගත් ගිවිසුම් සියල්ල සනාථ කරන්නේ, IMF විසඳුම් වශයෙන් ඉදිරිපත් කරන ව්‍යුහාත්මක ගැළපුම් උද්ධමනය පාලනය කිරීමට, ගෙවුම් ශේෂ අර්බුදය කළමනාකරණයට හෝ ආර්ථික වර්ධන සහ සංවර්ධනයට අවශ්‍ය ගතිකයන් නිර්මාණය කිරීමට හේතු වී නොමැති බවයි. 1977න් පසු ශ්‍රී ලංකාව 9 වතාවක් IMF පිහිට පතා ඇති අතර ඉන් 6 වතාවකම සම්පූර්ණ අරමුදල් භාවිත කරමින් IMF වැඩසටහනේ ව්‍යුහාත්මක ගැලපුම් සිදුකර ඇත. එනිසා 'IMF කියූ ලෙස ව්‍යුහාත්මක ගැළපුම් අප කර නැත' යන තර්කය තාක්ෂණික වශයෙන් නිවැරදි නැත. එවැනි වැටහීම් IMFවාදී ඒවා වන අතර දේශපාලන ආර්ථිකයේ ගතිකයන් හරහා බිහිවන සත්‍ය ප්‍රතිඵල සාවද්‍ය ලෙස පුරෝකථනය කිරීම නිසා සිදුවන්නකි.

2. IMF ශ්‍රී ලංකාවේ ආසන්නතම ආර්ථික අර්බුදයට විසඳුමක් නොවේ. 2023 ජූනි 6 සහ 2024 ජූනි 14 පිළිවෙළින් පළ කළ IMF විශ්ලේෂණය ආර්ථික අර්බුදයේ සැබෑ හේතු අනාවරණ අතර අර්බුදයට බලපෑ හේතු වඩාත් නරක අතට හරවන ප්‍රතිකර්ම සහ අර්බුදයේ සැබෑ වින්දිතයන්ගේ ජීවන සහ ශ්‍රම කොන්දේසි වඩාත් නරක අතට හරවන යෝජනා ක්‍රියාත්මක කර ඇත. ආර්ථික අර්බුදය තුළ පැවති අරාජික-පීඩාවන් IMF වැඩසටහන විසින් විධිමත්, නීතිගත-පීඩාවක් බවට පත් කොට ඇත. නිවැරැදි ප්‍රතිකර්ම වෙනුවට IMF විසින් රනිල් වික්‍රමසිංහගේ ප්‍රජාතන්ත්‍රවිරෝධී රජයට අලුත්ම වටයකින් නවලිබරල්වාදය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය, භූදේශපාලනික සහයෝගය සහ සුජාතභාවය ලබා දී ඇත.

3. IMF සැබවින්ම නියෝජනය කරන්නේ ණය හිමියන් මිස ණයගැති ශ්‍රී ලංකාව හෝ එහි වැඩකරන පන්තිය නොවේ. ණය හිමියන්ගේ අවශ්‍යතා නියෝජනය කිරීම යනු ණයගැති රටවලින් කුමන පීඩාකාරී කොන්දේසි යටත් හෝ එම රටවල ස්වෛරීත්වය උල්ලංඝනය කරමින් ණය හිමියන්ගේ ණය ඔවුන්ට උපයා

දීමයි.

4. IMF විසඳුම විසින් සත්‍ය වශයෙන්ම කර ඇත්තේ ශ්‍රී ලංකාවේ ණය කන්දට තවත් අලුතින් ඩොලර් බිලියන 2.9ක් සහ එයට ගෙවිය යුතු ඉහළ පොලියක් (SDR සඳහා) එකතු කිරීම ය.
5. ජාත්‍යන්තර විද්වතුන් පෙන්වා දෙන්නේ පළමුව, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවලට ශ්‍රී ලංකාව ගෙවූ ඉහළ පොළිය හරහා ශ්‍රී ලංකාව දැනටමත් තම සමස්ත ණය ප්‍රමාණයේ ප්‍රාග්ධනයෙන් විශාල කොටසක් ගෙවා ඇති බවත් දෙවනුව සමස්ත ණය කන්ද තුළ 'විලෝපික ණය', 'අවජාතක' ණය සහ 'පිළිකුල්සහගත ණය' අඩංගු වන බවත්ය. මේ පිළිබඳව IMF විසින් විධිමත් විශ්ලේෂණයක් නොකර සමස්ත ණය ප්‍රමාණයට ප්‍රතිව්‍යුහගතකරණයට ලක් කිරීම තාක්ෂණික වරදක් නොව දේශපාලනික නැතිනම් පන්තිමය තේරීමකි. IMF දත්ත සහ ප්‍රක්ෂේපණ දෙස අප විචාරශීලීව බැලිය යුත්තේ මේ නිසාය.
6. සමස්ත ව්‍යුහාත්මක ගැළපුම් පැකේජය විසින් ආර්ථිකය තවදුරටත් හකුළුවා ඇත. එමෙන්ම විනාශකාරී කප්පාදු ප්‍රතිපත්ති

සහ පෞද්ගලිකකරණයේ වේගය වැඩි කර ඇති අතර ෆිස්කල් ප්‍රතිපත්තිය හැසිරවීම හරහා ආර්ථිකයේ සමාහාර ඉල්ලුම කළමනාකරණයට පැවති අවකාශය මෙම පැකේජය විසින් වළක්වා ඇත. කප්පාදු පහළ නව බදු වර්ග හඳුන්වාදීම, බදු අනුපාත ඉහළ නැංවීම, රජය ආයෝජන, සේවා සහ සුබසාධන මිල ක්‍රමයෙන් ඉවත්වීම සහ වෙළෙඳපළකරණය වේගවත් කිරීම හරහා සිදු කරමින් පවතී. ඒ හරහා විශාල ආර්ථික පීඩනයක් පීඩිත ජනතාව මත පටවා ඇත්තේ ‘කෙටි කාලයේ පිඩාව දරා ගැනීම දිගු කාලයේ දී පීඩාවෙන් තොර වීම IMF උපායමාර්ගය වේ’ යන මුළාව මත පිහිටා ය.

IMF ගිවිසුම හරහා පහත මූලධර්ම උල්ලංඝනය වී ඇත.

IMF වැඩසටහන විසින් නියම කළ ව්‍යුහාත්මක, තාක්ෂණික, ආයතනික, නීතිමය සහ භෞතික කොන්දේසි ඉටු කිරීමට යාමේ දී අන් කිසිදු අවස්ථාවකට වඩා සුවිශේෂී ලෙස පහත මූලධර්ම උල්ලංඝනය කර ඇත.

1. **ආර්ථික යුක්තියේ මූලධර්මය:** IMF-රනිල්-නන්දලාල් තන්ත්‍රය විසින් ක්‍රියාත්මක කළ යෝජනා අර්බුදයෙන් පීඩිත ජනතාව මත

සුවිශාල ජීවන බරක් පටවා ඇත. රජය ජනතාවගේ පැත්ත ගැනීම වෙනුවට ඔවුන්ව පැවැත්ම පිළිබඳව අර්බුදයක් දෙසට දිගින් දිගටම තල්ලු කළේය. ඒ අතරම ඔවුන්ට අඩු මූර්ත වැටුපකට, වැඩි කාලයක් සහ තවත් අමතර රැකියාවක් කිරීමට බල කර ඇත. රජය ආර්ථික යුක්තියේ සියලු කොන්දේසි උල්ලංඝනය කර ඇත. කෙසේ හෝ පැවතීම මගින් ශ්‍රම බලය සහ අතිරික්තය ආර්ථිකය තුළ ජනනය කරමින් සිටින්නේ වැඩකරන ජනතාවයි. (Austerity)

2. **ණය තවත් ප්‍රසාරණය නොකිරීමේ මූලධර්මය:** ශ්‍රී ලංකාවේ ණය කන්ද IMF ගිවිසුමෙන් පසුව ඉහළ ගොස් ඇත. 2023 දෙසැම්බර් ඩොලර් මිලියන 96,170ක් ව පැවති ණය ප්‍රමාණය 2024 මාර්තු වන විට ඩොලර් මිලියන 100,184 දක්වා වර්ධනය වී ඇත.

3. රාජ්‍යයේ පොදු ධනය, මහජන සම්පත් සහ ස්වාභාවික සම්පත් ඉතා අඩු ලන්සුවකට පෞද්ගලිකකරණය කරමින් පවතින අතර මහබැංකු පනත (2023) සහ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත (2024) හරහා ජනතා පරමාධිපත්‍ය අභියෝගයට ලක් කෙරෙමින් පවතී. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

සහ ෆිස්කල් ප්‍රතිපත්තිය IMF ප්‍රතිපත්ති කට්ටලයේ කොටසක් සහ ණය හිමියන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට කැප කළ ප්‍රතිපත්ති බවට පත් කර ඇත.

## EXIT IMF උපායමාර්ගය

1. ණය යුක්තිය සහ නව විගණනයක් පිළිබඳව අන්තර්ජාතික රාමුව: ශ්‍රී ලංකාවේ ආර්ථික උපායමාර්ගික ප්‍රවේශය විය යුත්තේ අවම තරමේ සමස්ත විදේශ ණය ප්‍රමාණයෙන් 60% ක්වත් අඩු කර ගැනීමය. ඒ සඳහා කළ යුතු මූලික කටයුත්ත නම් IMF වැඩසටහනෙන් ඉවත් වී ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ණය විගණන සහ වර්ගීකරණ කමිටුවකට ශ්‍රී ලංකාවේ තත්වය අධ්‍යයනය කර වෝහාරික විගණන වාර්තාවක් සම්පාදනය කිරීමයි. Committee for the Abolition of Illegitimate Debt (CADTM) සහ වාමාංශික ප්‍රගතිශීලී බුද්ධිමතුන්ගේ සහයෝගය මේ සඳහා ලබාගත යුතුය. IMF ණය වර්ගීකරණය, ප්‍රතිව්‍යුහගතකරණ සහ අනාගත ප්‍රක්ෂේපණ ප්‍රතික්ෂේප කොට විලෝපික ණය, පිළිකුල්සහගත ණය සහ අවජාතක ණය

මෙන්ම දැනට ගෙවා ඇති ඉහළ පොලිය සම්බන්ධයෙන් ස්වාධීන විශ්ලේෂණයක් සිදුකළ යුතුය.

2. ණයගැතියන්ගේ පොදු කේවල් කිරීමේ සාමූහිකයක් සහ ණය අහෝසි කිරීමේ ව්‍යාපාරයක්: IMF මැදිහත්කරණය ප්‍රතික්ෂේප කොට ණය හිමියන් සමග ඍජු සාකච්ඡා ආරම්භ කළ යුතුය. ඍජුව සාකච්ඡා කිරීමට සුදානම් ණය හිමියන් සමග ඍජු සාකච්ඡා ආරම්භ කිරීම සහ ණයගැති අනෙකුත් රාජ්‍යයන් සමග පොදු සාමූහිකයක් නිර්මාණය කර ගනිමින් පොදු සාකච්ඡා මේසයකට ණය හිමියන් ගෙන ඒම හරහා තොරතුරු, තාක්ෂණික කරුණු සහ කේවල් කිරීමේ ශක්තිය ශ්‍රී ලංකාව වර්ධනය කරගත යුතුය.

3. ආර්ථිකය නිශ්චිත මට්ටමකට ස්ථාවර වන තුරු ණය ගෙවීම ආරම්භ නොකළ යුතුය. විශේෂයෙන්ම සමස්ත ජනගහනයෙන් දිළිඳු ජන ප්‍රතිශතය, ඔවුන්ගේ මූර්ත ආදායම ඉහළ නැංවීම, සේවා වියුක්තිය සහ ආනයන කළමනාකරණ වැඩපිළිවෙළක් හරහා ගෙවුම් ශේෂයේ සැලකිය යුතු ධන ශේෂයක් වර්ෂ කිහිපයක් තුළ ළඟා කර ගැනීමෙන් තොරව

ණය ගෙවීමේ ගිවිසුමකට නොයා යුතුය. සාර්ව ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් නවලිබරල් යුගය තුළ ක්‍රියාත්මක වූ රජය ක්‍රමානුකූලව ඉවත්වීම සහ රජය විසින්ම රජය හැකිළවීමේ ක්‍රියාවලිය අවසන් කර සමාජ සුබසාධන, ආයෝජන සහ නව රෙගුලාසි විධිමත්ව ක්‍රියාත්මක කිරීමේ පදනමින් රජය දේශපාලන ආර්ථික ක්‍රියාවලියට මැදිහත් විය යුතුය. ණය ගෙවීමේ මූලධර්මයක් සහ උපක්‍රමයක් වශයෙන් වැඩිවන අපනයන ආදායමෙන් නිශ්චිත ප්‍රතිශතයක් පමණක් ගෙවීමට එකඟ විය යුතුය.

4. වසර 5ක් යන තුරු ආනයන කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය. විශේෂයෙන්ම මෙම කාලසීමාව තුළ ආනයන ආදේශන කර්මාන්ත සහ අපනයන අභිමුඛ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම හරහා අරමුදල් තහවුරු කරගත යුතුය. දේශීය සැපයුම් ජාලය ශක්තිමත් කළ යුතු අතර රැකියා අවස්ථා නිර්මාණය කිරීමේ දී ආර්ථික යුක්තිය සහ පාරිසරික යුක්තිය යන සාධක මූලධාර්මිකව උල්ලංඝනය නොකළ යුතුය.

5. මූල්‍ය සහ විදේශ විනිමය නීති ශක්තිමත් කළ යුතුය. ශ්‍රී ලංකාවේ ජාතික සම්පත්

භාවිත කරමින් උපයනු ලබන විදේශ විනිමය සක්‍රියව රුපියල් බවට පරිවර්තනය වීමත්, අනීතික ඉන්වොයිසිකරණය සහ ව්‍යාජ විදේශ ගිණුම්වල තැන්පත් කිරීම වැළැක්වීමට කටයුතු කිරීම. ඩොලර් බිලියන 56කට ආසන්න අනීතික ඉන්වොයිසිකරණය හරහා ඉපයූ විනිමය පිළිබඳ විගණනයක් සිදු කිරීම සහ ඒවායේ මූලාශ්‍ර හඳුනා ගැනීම.

6. සමාහාර ඉල්ලුම වර්ධනය කිරීම සඳහා දිගුකාලීන අරමුණු සහිතව රජය ආර්ථිකයට සක්‍රියව මැදිහත්විය යුතුයි.

ජනතාවගේ ප්‍රතිපත්තිය